# ගම නැගුම වැඩසටහන

## පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය

පූර්ව වටය සඳහා තෝරාගත් ගම් දහය පදනම් කරගත් සමීක්ෂණයෙහි නුවරඑළිය දිස්ත්‍රික්කයේ හප්පාවර ගම සඳහා වූ වාර්තාව

එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු

2006 දෙසැම්බර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

711.3
(SL)
හෙක්ට

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

2009/06 2010/04 125/=

# - ස්තුතිය -

මහින්ද චින්තන ප්‍රතිපත්තිය ප්‍රකාශනයට අදාලව ගම්මාන සංවර්ධනය කිරීමේ මූලික පියවරක් ලෙස "ගම නැගුම" වැඩසටහන යටතේ දිවයින පුරා ගම්මාන දහයක් සංවර්ධනය කිරීමට පියවර ගැණිනි. එම ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇත්ද යන්න පිළිබදව පසු ඇගයීමකට ලක් කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය තොරතුරු ලබාගැනීමට, පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයක් කළ යුතු විය. මෙම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය නුවරඑළිය දිස්ත්‍රික්කයේ හප්පාවර ගම්මානයේ ද සිදු කෙරිණි. එම සමීක්ෂණය සිදු කිරීමට අවස්ථාව ලබා දුන් අප ආයතනයේ ගරු අධ්‍යක්ෂ වී.කේ. නානායක්කාර මහතාට විශේෂ ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම අධ්‍යයනය සඳහා විවිධ අයුරින් සහයෝගය දැක්වූ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්.ජී. ජයසේන මහතාටද ස්තුතිවන්ත වෙමි.

මෙම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය සම්බන්ධීකරණය කර සියළුම ආකාරයේ උපදෙස් හා දිරි ගැන්වීම් සිදු කළ කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ අංශ ප්‍රධාන ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතාටද විශේෂ ස්තුතිය පුද කරමි.

පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයේ ක්ෂේත්‍ර චාරිකා සිදු කරමින් දත්ත එකතු කර ගැනීමට සහයෝගය දැක්වූ අප ආයතනයේ සංඛ්‍යාන සහකාර එල්.ජී. ආරියරත්න මහතාටත්, දත්ත සැකසුම් කළ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශ්ලේෂක එම්.ඩී.එල්. සෙනරත් මහතා සහ එම කාර්ය මණ්ඩලයට ද, මෙම සමීක්ෂණයේ කටයුතු සඳහා විවිධ අයුරින් සහයෝගය දැක්වූ සංඛ්‍යාන නිලධාරිණී සන්ධ්‍යා සේනානායක මහත්මියටත් ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ගමනැගුම පූර්ව ව්‍යාපෘති සමීක්ෂණ වාර්තාව වැඩි දියුණු කිරීමට අදහස් හා යෝජනා ඉදිරිපත් කල අප ආයතනයේ වාරි ජල කළමනාකරණ අංශයේ අංශ ප්‍රධාන ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතාට ද විශේෂ ස්තුතිය පුද කරමි.

හප්පාවර ගම්මානයේ මූලික දත්ත රැස් කිරීමට සහයෝගය දැක්වූ උපාධිධාරී ඩබ්.එම්.කේ.ජී. රත්නායක මහතාටත් විශේෂයෙන් ස්තුතිවන්ත වෙමි. එසේම මෙම සමීක්ෂණය සාර්ථකව ඉටුකර ගැනීමට ද්විතීයික දත්ත සපයා දීම සහ හප්පාවර ගම්මානයට ගොස් සමීක්ෂණයට අදාල මූලික කටයුතු රාශියක් ඉටුකර දුන් හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් තුමාටත්, හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරි එන්.ජී.එස් කුමාර මහතාටත් විශේෂ ස්තුතියක් පුද කරමි.

මීට අමතරව මෙම සමීක්ෂණ වාර්තාවේ සියළු පරිගණක යතුරු ලියන කටයුතු සිදුකළ රාජිකා ශ්‍යාමලී මෙනෙවියට විශේෂයෙන් ස්තුතිවන්ත වෙමි.



21362
21362
පුස්තකාලය LIB... HARTI

# පටුන


පිටු අංකය

**පළමු පරිච්ඡේදය – හැඳින්වීම**

| | | |
|---|---|---|
| 1.1 | ගම නැගුම වැඩසටහන | 01 |
| 1.2 | ගම නැගුම ආදර්ශන ගම්මාන වැඩසටහන | 01 |
| 1.3 | පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනය | 02 |
| 1.4 | අධ්‍යයනයෙහි අරමුණු | 02 |
| 1.5 | අධ්‍යයනයෙහි ක්‍රමවේදය | 03 |
| 1.6 | අධ්‍යයන කාලය | 03 |
| 1.7 | ගැටළු සහ සීමාකම් | 04 |

**දෙවන පරිච්ඡේදය - අධ්‍යයන ග්‍රාමීය හා ජනගහන තොරතුරු**

| | | |
|---|---|---|
| 2.1 | පිහිටීම | 05 |
| 2.2 | දේශගුණික තත්ත්වය | 05 |
| 2.3 | ඓතිහාසික තත්ත්වය හා ජනාවාසවීම | 06 |
| 2.4 | ජනගහනය | 06 |
| 2.4.1 | නියැදි ජනගහනය | 06 |
| 2.5 | අධ්‍යාපන තත්ත්වය | 08 |

**තුන්වන පරිච්ඡේදය - ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම**

| | | |
|---|---|---|
| 3.1 | සේවා නියුක්තිය | 10 |
| 3.2 | ආර්ථික කටයුතු හා ආදායම් මාර්ග | 10 |
| 3.3 | ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය | 11 |
| 3.3.1 | ද්විතීයික රැකියාවල නියැලීම | 12 |
| 3.4 | ආදායම | 13 |
| 3.5 | දරිද්‍රතාවය | 14 |
| 3.6 | ඉතිරි කිරීම් | 15 |
| 3.7 | ණය ගැති භාවය | 16 |

**හතර වන පරිච්ඡේදය - නිවාසවල තත්ත්වය සහ පහසුකම්**

| | | |
|---|---|---|
| 4.1 | නිවාසවල අයිතිය | 19 |
| 4.2 | නිවාසවල තත්ත්වය | 20 |
| 4.3 | නිවාසවලට ඇති පහසුකම් | 22 |
| 4.3.1 | මාර්ග පහසුකම් | 22 |
| 4.3.2 | විදුලි බලය | 23 |
| 4.3.3 | දුරකථන පහසුකම් | 24 |

4.4 බලශක්ති භාවිතය සඳහා පහසුකම් 24
4.5 පානීය ජල පහසුකම් 25
4.6 වැසිකිළි පහසුකම් 27
4.7 නිවෙස්වල ඇති ගෘහ උපකරණ හා බඩු බාහිරාදිය 27
4.8 ගමනාගමනය හා ප්‍රවාහනය සඳහා ඇති වාහන අයිතිය 28
4.9 කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර 28
4.10 සෞඛ්‍ය තත්ත්වය 29
4.11 ගමනාගමන හා සේවා යටිතල පහසුකම් 30
4.12 ගමෙහි භෞතික සම්පත් 32

**පස්වන පරිච්ඡේදය - ඉඩම් අයිතිය බුක්තිය හා සංවර්ධනය කිරීම**

5.1 බුක්තිවිඳින ඉඩම්වල ප්‍රමාණය හා ස්වභාවය 33
5.2 බුක්ති විඳින ඉඩම් වල අයිතිය හා භුක්තියෙහි ස්වභාවය 34
5.3 ඉඩම් වල භෞතික ස්වභාවය 36

**හයවෙනි පරිච්ඡේදය - කෘෂිකර්මය හා අනෙකුත් නිෂ්පාදන කටයුතු**

6.1 බෝග වගාව 38
- 6.1.1 හැඳින්වීම 38
- 6.1.2 තාක්ෂණ භාවිතය 39
  - 6.1.2.1 බීජ භාවිතය 41
  - 6.1.2.3 පොහොර භාවිතය 42
  - 6.1.2.4 ජල පාලනය 43
  - 6.1.2.5 නිෂ්පාදනය 44
  - 6.1.2.6 නිෂ්පාදන වියදම හා ලාභය 46
  - 6.1.2.7 අලෙවිය 48
  - 6.1.2.8 ප්‍රශ්න, ගැටළු හා විසඳුම් 49

6.2 සත්ව පාලනය 50
- 6.2.1 හැඳින්වීම 50
- 6.2.2 හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනයට සම්බන්ධ විවිධ සතුන් 50
- 6.2.3 තාක්ෂණික භාවිතය 53
- 6.2.4 නිෂ්පාදනය 53
- 6.2.5 ප්‍රශ්න සහ විසඳුම් 54

6.3 අනෙකුත් නිෂ්පාදන 54

**හත්වන පරිච්ඡේදය - ප්‍රජා සංවිධාන සහ ජනතා සහභාගීත්වය**

7.1 ගමෙහි ඇති ප්‍රජා සංවිධාන 55

7.2 සංවිධාන වල ක්‍රියාකාරී බව 56

7.3 සමිති සමාගම් මගින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු 56

7.4 අරමුදල් ගොඩනැගීම් හා ණය දීම 57

7.5 වෙනත් සේවාවන් සැපයීම 57

7.6 ගමෙහි සංවර්ධන කටයුතු සඳහා ප්‍රජා සංවිධාන මගින් ජනතා සහභාගීත්වය ලබා ගැනීම 57

7.7 වෙනත් ආකාරයකින් ගමේ සංවර්ධනය සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීම 58

**අටවෙනි පරිච්ඡේදය – හඳුනාගෙන ඇති විශේෂ ගැටළු සහ පිළියම්** 59

8.1 ග්‍රාමයේ හඳුනාගෙන ඇති ගැටළු හා ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග 60

8.1.1 විදුලි බලය නොමැතිවීම 60

8.1.2 වාරි මාර්ග සංවර්ධනය 60

8.1.3 මාර්ග අළුත්වැඩියාව 61

8.1.4 කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටළුව 61

8.1.5 වල් අලි තර්ජනය 61

8.1.6 වැලි ගොඩ දැමීම සඳහා අවසර පත්‍ර ලබා ගැනීම 62

8.1.7 ධීවර ආම්පන්න ලබාගැනීම 62

8.1.8 පානීය ජලය ලබාගැනීම 62

8.2 පරිසර සංරක්ෂණ වැඩසටහන් 63

8.3 ආදායම් උත්පාදන වැඩසටහන් 63

8.4 පශු සම්පත් වැඩිදියුණු කිරීම 63

සංඛ්‍යා සටහන් නාමාවලිය


| වගුව | පිටු අංකය |
|---|---|
| **දෙවන පරිච්ඡේදය** | |
| 2.1 සාමාජික සංඛ්‍යාව අනුව නියැදි පවුල් සංඛ්‍යාව බෙදී ඇති අන්දම | 06 |
| 2.2 නියැදි ජනගහනය ස්ත්‍රී, පුරුෂ වශයෙන් බෙදී ඇති අන්දම | 07 |
| 2.3 නියැදි ජනගහනය වයස් කාණ්ඩ අනුව බෙදී ඇති අන්දම | 07 |
| 2.4 විවාහක තත්ත්වය | 08 |
| 2.5 නියැදි ජනගහනයේ අධ්‍යාපනය අනුව බෙදී ඇති අන්දම | 08 |
| 2.6 හප්පාවර ගම්මානයේ ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම | 09 |
| **තුන්වන පරිච්ඡේදය** | |
| 3.1 පවුලේ සාමාජිකයන් නිරතවන ප්‍රධාන රැකියාව | 11 |
| 3.2 පවුලේ සාමාජිකයන් නිරතවන ද්විතීයික රැකියා | 12 |
| 3.3 වැටුප් ලබන රැකියාවල තත්ත්වය | 13 |
| 3.4 ආදායම් කාණ්ඩ අනුව පවුල්වල වර්ගීකරණය | 13 |
| 3.5 ආදායම් සංයුතිය ආදායම් මාර්ග අනුව බෙදී යාම | 14 |
| 3.6 හප්පාවර ගම්මානයේ ඉතිරි කිරීම් පිළිබඳ තොරතුරු | 15 |
| 3.7 ණයගැති භාවය | 16 |
| 3.8 ණය ලබාගත් හේතු | 17 |
| 3.9 ණය නොගෙවීමට හේතු | 17 |
| 3.10 ණය ලබාගත් මාර්ග | 18 |
| **හතරවන පරිච්ඡේදය** | |
| 4.1 නිවාස වල තත්ත්වය | 19 |
| 4.2 නිවාසවල අයිතියේ ස්වභාවය | 19 |
| 4.3 වහලයේ ස්වභාවය අනුව නිවාස වර්ගීකරණය | 20 |
| 4.4 බිත්තිවල ස්වභාවය අනුව නිවාස වර්ගීකරණය | 20 |
| 4.5 ගෙබිම අනුව නිවෙස් වර්ගීකරණය | 21 |
| 4.6 විශාලත්වය අනුව නිවාස වර්ගීකරණය | 21 |
| 4.7 කාමර සංඛ්‍යාව අනුව නිවාස වර්ගීකරණය | 22 |
| 4.8 ගම්මානයේ නිවෙස්වලට වාහනයකින් යා හැකි ආසන්නම දුර | 23 |
| 4.9 ආසන්නම විදුලි රැහැන් කණුවට ඇති දුර | 24 |

4.10 පානීය ජලය පහසුකම් 25
4.11 ජල පහසුකම් (නෑමට) 25
4.12 ජල ප්‍රභවයන් සඳහා ඇති දුර 26
4.13 ගම්මානයේ දැනට භාවිතා කරන වැසිකිළිවල ස්වභාවය 27
4.14 ගෘහ උපකරණවල අයිතිය 27
4.15 වාහනවල අයිතිය 28
4.16 ගම තුළ ඇති කෘෂිකාර්මික උපකරණ 29
4.17 ගම්මානයේ ජනතාවගේ අයහපත් සෞඛ්‍ය පුරුදු 29
4.18 ගමට සේවා සපයන ආයතනවල පිහිටීම 30

**පස්වන පරිච්ඡේදය**

5.1 ගම්මානයේ ඉඩම්වල පිහිටීම 33
5.2 මඩ ඉඩම් බුක්තියේ ස්වභාවය හා ඒවායේ ප්‍රමාණ 34
5.3 ගෙවත්තේ ප්‍රමාණය හා බුක්තියේ ස්වභාවය 35
5.4 ගොඩ ඉඩම්වල ප්‍රමාණය හා බුක්තියේ ස්වභාවය 35
5.5 ගොඩ හා මඩ ඉඩම් ප්‍රමාණය වගාව අනුව බෙදී ඇති ආකාරය 36
5.6 පාංශු ඛාදනයට ලක් වී ඇති ඉඩම් (ප්‍රමාණය අනුව බෙදී යාම) 36
5.7 ජල මූලාශ්‍රය අනුව ඉඩම් බෙදී ඇති ආකාරය 37

**හය වෙනි පරිච්ඡේදය**

6.1 යල මහ දෙකන්නයේ වගා කර ඇති බෝග 38
6.2 කෘෂිකාර්මික කටයුතු සඳහා උපදෙස් ලබා ගන්නා ආකාරය 40
6.3 සේවා සහ උපදෙස් ලබා ගන්නා ආකාරය 41
6.4 වී සහ එළවළු බීජ ලබාගන්නා ආකාරය 41
6.5 ප්‍රධාන භෝග සඳහා රසායනික පොහොර භාවිතය 42
6.7 වී වගාව සහ එළවළු වගාව සඳහා යෙදවුම් ලබා ගැනීම 43
6.6 වගා කර ඇති භෝග ආශ්‍රිත තොරතුරු 44
6.7 අක්කර 14 ක වී වගාව සඳහා නිෂ්පාදන පිරිවැය 46
6.8 කෘෂි නිෂ්පාදනයන්ගේ අලෙවි රටාව 48
6.9 නිෂ්පාදන අලෙවි කළ ස්ථානය හා ප්‍රමාණය 49
6.10 සත්ත්ව පාලනය සම්බන්ධ තොරතුරු 50
6.11 සත්ත්ව පාලනයට සම්බන්ධ විවිධ සතුන් 50
6.12 සතුන්ගේ අයිතිය 51
6.13 ගොවීන් සත්ත්ව පාලනයේ නොයෙදීමට හේතු 52

6.14 සත්ත්ව පාලනයට ශ්‍රම දායකත්වය 52
6.15 සත්ත්ව පාලනයෙන් ලැබෙන ආදායම 53
6.16 හප්පාවර ගම්මානයේ පාලනයේ යෙදී සිටින්නවුන්ගේ ගැටළු 54

## හත්වන පරිච්ඡේදය

7.1 සමිති සමාගම් සහ සාමාජිකයන් ගණන 55
7.2 ගම්වාසීන් විවිධ සමිති සමාගම්වල සාමාජිකත්වය ලබා ඇති ආකාරය 55
7.3 වඩාත්ම ක්‍රියාකාරී සමිතිය 56

## පළමුවැනි පරිච්ඡේදය
## හැඳින්වීම

### 1.1 ගම නැගුම වැඩසටහන

වර්තමාන රජය විසින් "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශය මත පදනම්ව ආරම්භ කර ඇති "ගම නැගුම වැඩසටහන" ග්‍රාමීය දුප්පත්කම නැති කිරීම සඳහා සහභාගීත්ව මෙන්ම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් හඳුන්වා දීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඇති එකකි. ගම නැගුම සංකල්පයෙහි මූලික අදහස වන්නේ ගමෙහි සංවර්ධනය සඳහා සැලසුම් සැකසීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ගමෙහි ජනතාව පාර්ශවකරුවන් බවට පත්කර ගැනීමය. මෙම වැඩසටහනෙහි "දැක්ම" වන්නේ ගම ජාතික සංවර්ධනයෙහි කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමය. "මෙහෙවර" වන්නේ ග්‍රාමීය ජනතාව තුලින් ගොඩ නැගෙන සහභාගීත්ව ප්‍රජා සංවර්ධන ජාලයක් ඔස්සේ ගම තුළ සංවර්ධනයක් රටෙහි ඇති කිරීමය.

ගම නැගුම වැඩසටහනෙහි අරමුණු පහත දැක්වේ.

1. ග්‍රාමීය ජනතාව සංවර්ධනයේ ඉලක්කයන් පමණක් නොව, සංවර්ධනයේ කොටස්කරුවන් බවට ද පත් කිරීම.
2. ග්‍රාමීය ජනතාවගේ සහභාගීත්වය තුළින් ගමේ ගැටළු හා විභවතාවන් හඳුනා ගෙන, ගම කේන්ද්‍රකොට, ඔවුන් සංවර්ධනයේ පෙර ගමන්කරුවන් ලෙස සංවර්ධන ක්‍රියාවලිය දියත් කිරීම
3. ගම සංවර්ධනය කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර සම්පත් මනා ලෙස කළමනාකරණය කොට, ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා සැලසුම් කසකස් කිරීම
4. දුප්පත්කම අවම කිරීම සඳහා අවශ්‍ය පිළියම් යොදමින් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම

මුල් දෙවසර තුළ දී තෝරා ගත් ගම්වල නිවාස නොමැති පවුල්වලින් 50% කට නිවාස තනා දීම, එම ගම්වල විදුලිය නොමැති සියළුම පවුල්වලට විදුලි පහසුකම් සැපයීම, මුල් දෙවසර තුළ සියළුම ගම්වලට ආරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම, සෑම ගමකටම වාහන ධාවනය කිරීමට යෝග්‍ය මාර්ගයක් සකස් කිරීම වැනි කෙටි කාලීන ඉලක්ක ද සෑම ගමකටම විදුලිය, පොදු සන්නිවේදන සේවා ලබාදීම හා අධ්‍යාපනය දියුණු කිරීම වැනි දිගු කාලීන ඉලක්ක සපුරා ගැනීමට ද මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරේ.

### 1.2 ගම නැගුම ආදර්ශ වැඩසටහන

ගම නැගුම වැඩසටහන යටතේ දියුණු කිරීම සඳහා ගම් තෝරා ගැනීම වට කිහිපයක් යටතේ සිදුවෙමින් පවතී. පළමු වටය සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක දහයක් නියෝජනය වන පරිදි ගම් දහයක් තෝරාගනු ලැබූ අතර එම ගම් ආදර්ශන ලෙස දියුණු කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. මේ අනුව නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හප්පාවර ගම්මානයද ආදර්ශ ගම්මානයක් ලෙස දියුණු කිරීම සඳහා තෝරා ගනු ලැබිය.

## 1.3 පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය

ගම නැගුම ආදර්ශ වැඩසටහන යටතේ අදාල ගම්වල සිදු කෙරෙන සංවර්ධන කටයුතුවල බලපෑම් හඳුනා ගනිමින් ව්‍යාපෘතිය ඇගයීමට ලක් කිරීමට හැකිවනු පිණිස එම ගම් පදනම් කරගෙන ඒවායෙහි පූර්ව- ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් (පාදක සමීක්ෂණයක්) සිදු කරන ලෙස කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ඉල්ලා සිටිනු ලැබිණ. ඒ අනුව හප්පාවර ගම්මානය පදනම් කර ගනිමින් සිදුකළ අධ්‍යයනයෙහි සොයා ගැනීම් මෙම වාර්තාව මගින් එළි දැක්වේ. මෙම අධ්‍යයනයේදී ව්‍යාපෘතියෙහි දිගු කාලීන බලපෑම් හා අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගැනීම් ගණනය කිරීමට හැකිවනු පිණිස ගම්වල ජනතාවගේ සාමාන්‍ය සමාජ ආර්ථික තත්ත්වය හා අදාල තොරතුරු ලබා ගැනීමට අමතරව ව්‍යාපෘතියෙහි කෙටි කාලීන බලපෑම් ගණනය කිරීම සඳහා ගමෙහි ඇති යටිතල පහසුකම් මෙන්ම අනෙකුත් සේවා පහසුකම්, කෘෂි තාක්ෂණ භාවිතයන් යනාදිය පිළිබඳව ද තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කෙරිණ.

## 1.4 අධ්‍යයනයෙහි අරමුණු

මෙම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ගම නැගුම වැඩසටහනෙහි ප්‍රථම අදියර යටතේ තෝරාගත් හප්පාවර ගමෙහි පවත්නා සමාජ ආර්ථික තත්ත්වය හා අදාළ තොරතුරු රැස් කිරීම හා වාර්තාගත කිරීමය.

එහි සුවිශේෂී අරමුණු වන්නේ,

i. අධ්‍යයනය සඳහා තෝරාගත් ගමෙහි ජනගහන තොරතුරු එනම් ජන සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, අධ්‍යාපන හා සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ විස්තර ලබා ගැනීම

ii. අධ්‍යයන ගම්මානයේ ජීවන මාර්ග, රැකියාවන්හි ස්වභාවය, ආදායම් තත්ත්වය, ඉතිරි කිරීම හා ණයගැති භාවය පිළිබඳව අධ්‍යයනය කිරීම

iii. ගම්වාසීන්ට ඉඩම් භාවිතය සඳහා ඇති හැකියාව, ඉඩම් අයිතිය, බුක්තියෙහි ස්වභාවය හා ඉඩම් සම්බන්ධයෙන් ඇති ගැටළු විමසා බැලීම

iv. වැසියන්ගේ නිවාස අයිතිය, ඒවායෙහි ස්වභාවය හා ඒවා සඳහා ඇති පහසුකම් පිළිබඳව සොයා බැලීම

v. වැසියන්ගේ නිවාසවල ඇති බඩු බාහිරාදිය මෙන්ම කෘෂිකාර්මික උපකරණ පිළිබඳව විමසා බැලීම

vi. හප්පාවර ගම්මානයෙහි ගමනාගමනය, විදුලි බලය, දුරකථන පහසුකම්, බීම සඳහා මෙන්ම නෑම සඳහා ජලය, අධ්‍යාපනය, සෞඛ්‍ය, තාක්ෂණික දැනුම ලබාදීම හා අලෙවි පහසුකම් යනාදිය සම්බන්ධයෙන් ඇති යටිතල පහසුකම් පිළිබඳව අධ්‍යයනය කිරීම.

vii. එම ගම්මානයේ ඇති ප්‍රජා සංවිධාන හා ඒවාතුළ ගම්වැසියන්ගේ නියෝජනය මෙන්ම ගමෙහි සංවර්ධනය හා සම්බන්ධ තීරණ ගැනීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ සහභාගීත්වය පිළිබඳව විමර්ශනය කිරීම

viii. ජනතාව සතු ඉඩම් හා ජලය වැනි සම්පත් ඔවුන්ගේ නිෂ්පාදනය හා ආදායම් වර්ධනය සඳහා කෙතරම් දුරට කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතයට ගන්නේද යන්න සොයා බැලීම

ix. වැසියන්ගේ ප්‍රධාන නිෂ්පාදන කටයුතු සඳහා තාක්ෂණික හා යෙදවුම් භාවිතයෙහි ස්වභාවය පිළිබඳව විමසීම

x. වැසියන්ගේ ප්‍රධාන නිෂ්පාදන කටයුතු සඳහා වන නිෂ්පාදන වියදම හා ලාභය ගණනය කිරීම

## 1.5 අධ්‍යයනයෙහි ක්‍රමවේදය

ගම නැගුම ප්‍රථම වටය යටතේ තෝරාගත් ගම් දහයෙන් එකක් වන හප්පාවර ගමෙහි සිදු කරනු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යයනයක් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රම කිහිපයක් අනුගමනය කරනු ලැබිණ. මින් ප්‍රධාන ක්‍රමය වූයේ ගමෙහි පදිංචි පවුල් ආශ්‍රයෙන් සිදුකළ නියැදි සමීක්ෂණයයි. හප්පාවර ගම්මානයේ පවුල්වලට අදාල පෞද්ගලික තොරතුරු මෙන්ම ගමෙහි සංවර්ධනයට අදාල තොරතුරු ලබා ගැනීම සඳහා එමගින් උත්සාහ දැරිණි. ගමෙහි සංවර්ධනයට අදාල පොදු තොරතුරු ලබා ගැනීම සඳහා ග්‍රාම නිලධාරීන්, කෘ.ප.නි.ස.වරුන් ප්‍රජා සංවිධාන නායකයින්, පාසල, පන්සල හා වෙනත් පොදු සේවා සපයන ආයතනවල ප්‍රධානීන් වැනි ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග සාකච්ජා කරනු ලැබිණ. කෘෂිකර්මය, සත්ත්ව පාලනය, ස්වයංරැකියා, යනාදී විශේෂ ක්ෂේත්‍රයන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමේදී ඒ හා කටයුතුවල නියුතු පුද්ගලයන් සමග කණ්ඩායම් සාකච්ජා පවත්වනු ලැබිණ. මීට අමතරව ද්විතීයික දත්ත භාවිතා කිරීම ද සිදුකළ අතර විවිධ විෂයන්ට අදාළව ග්‍රාම නිලධාරී, කෘ.ප.නි.ස. වරුන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් යන අයත් අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන, පශු වෛද්‍ය සේවා කාර්යාලය, ප්‍රාදේශී ලේකම් කාර්යාලය හා ග්‍රාමීය බැංකු වැනි ආයතන මගින් දැනට රැස්කර ඇති තොරතුරු මේ යටතේ ලබා ගනු ලැබිණ. මෙසේ විවිධ මාර්ගයන්ගෙන් ලබාගත් තොරතුරු නියැදි සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු සමග සම්බන්ධ කරනු ලැබිණ.

නියැදි සමීක්ෂණය සඳහා සාමාන්‍යයෙන් ගමෙහි පදිංචි පවුල්වලින් භාගයක් යෝජනය වන පරිදි පවුල් 63 ක් සසම්භාවී ක්‍රමයට (සසම්භාවී ළඝු භාවිතයෙන්) තෝරාගු ලැබිණ. අදාළ නියැදි පවුල් වලින්. අදාළ නියැදි පවුල්වලින් තොරතුරු ලබා ගැනීමේදී ප්‍රශ්නාවලියක් භාවිතා කරනු ලැබූ අතර එසේ තොරතුරු ලබා ගැනීමට එම ගමෙහි උපාධිධාරී තරුණයෙක් සහභාගි කරගනු ලැබිණ. ග්‍රාම නිලධාරී. කෘ.ප.නි.ස., වැනි ප්‍රධාන තොරතුරු සපයන්නන් හා සාකච්ජාකර ගමට අදාළව ඇති යටිතල පහසුකම්, සේවා ආයතන යනාදිය පිළිබඳව තොරතුරු ගැනීම සඳහා ද පොදු ප්‍රශ්නාවලියක් භාවිත කරනු ලැබිණ.

## 1.6 අධ්‍යයන කාලය

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර තොරතුරු ලබා ගන්නා ලද්දේ 2006 ජුලි සහ අගෝස්තු අතර කාල සීමාව තුළදීය. ආදායම ගණනය කිරීමේදී 2005 අගෝස්තු සිට 2006 ජුලි දක්වා වූ වසරක කාල සීමාව පදනම් කරගනු ලැබිණ. නිෂ්පාදනය හා සම්බන්ධ තොරතුරු ගැනීමේදී 2005 යල කන්නය හා 2005- 2006 මහ කන්නය පදනම් කරගනු ලැබිණ.

## 1.7 ගැටළු සහ සීමාකම්

හප්පාවර ගම්මානයේ ගම නැගුම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය සිදු කිරීමේදී විවිධ ගැටළු සහ සීමාකම්වලට මුහුණපාන්නට සිදුවිය. මෙහිදී මුහුණපෑ ප්‍රධාන ගැටළුව වුයේ මුල්‍යය හිගයයි. හප්පාවර ගම්මානයේ තොරතුරු රැස් කිරීමට කොළඹ සිට හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හප්පාවර ගම දක්වා විශාල දුරක් ගෙවා යා යුතුව තිබුණි. මුල්‍ය සීමාකම් නිසා ගමන් වාර දෙකකින් පමණ ගම්මානයේ තොරතුරු රැස් කිරීම හා අදාළ වෙනත් කටයුතු සිදු කෙරිණි. මෙම ගමන් වාර දෙක තුළ මූලික සමාජ ආර්ථික පර්යේෂණ සිදු කිරීමට අවශ්‍ය පවුල් තෝරා ගැනීම, අදාළ නිලධාරීන් හමු වීම, ගම්මානයේ පොදු තොරතුරු සාකච්ඡා කිරීම ආදි විශාල වැඩ කොටසක් නිම කළ යුතුව තිබුණි.

සමීක්ෂණය සඳහා තිබු මුල්‍යමය සීමාකම් නිසා සමීක්ෂණයේ ක්ෂේත්‍ර තොරතුරු රැස් කිරීම සඳහා ආයතනයේ පර්යේෂණ නිලධාරීන් යොදා ගැනීමට නොහැකි විය. එම නිසා තොරතුරු රැස් කිරීම හප්පාවර ගම්මානයේ උපාධිධාරී මහතෙකු මගින් සිදු කරන ලදී. මේ ආකාරයට ප්‍රවීන සමීක්ෂණයන් මාර්ගයෙන් ගම්මානයේ තොරතුරු විචේකීව නිසි පරිදි රැස් කර ගැනීමට නොහැකි වීමද මෙම සමීක්ෂණයේදී අප මුහුණ දුන් බාධකයකි.

ගම්මානයේ තොරතුරු රැස් කිරීමේදී ඒවා නිවැරදි ලෙස ලබා ගන්නා ආකාරය, ගොවි පවුල් සමග කථා කර එම තොරතුරු ලබා ගැනීමද සමීක්ෂකයන් නොවන වෙනත් ආධුනික අයට තරමක් අපහසුය. එම නිසා සමහර අත්‍යවශ්‍ය තොරතුරු රැස් කිරීමේදී බාධා පැමිණ ඇත. මීට අමතරව විශේෂයෙන් ගොවීහු කෘෂි නිෂ්පාදනවල නිෂ්පාදන පිරිවැය ඉතා වැඩි ලෙස ප්‍රකාශ කළත් ඔවුන් ලබා ගන්නා ආදායම, ලාභය යනාදී කරුණු පිළිබඳ නිවැරදි ලෙස ප්‍රකාශ කිරීමට මැලිකමක් දක්වති. මෙයද සමීක්ෂණයේදී අප මුහුණ පෑ ගැටළුවකි.

## දෙවන පරිච්ඡේදය

# අධ්‍යයන ග්‍රාමය හා ජනගහන තොරතුරු

හප්පාවර ගම්මායේ සිදු කළ පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව ගම්මානයේ පිහිටීම, දේශගුණික තත්ත්වය, ඓතිහාසික පසුබිම, මුළු ජනගහනය, අධ්‍යාපනික තත්ත්වය යන කරුණු මෙම පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරේ.

### 2.1 හප්පාවර ග්‍රාමයේ පිහිටීම

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාත දිස්ත්‍රික්ක තුනකින් සමන්විත වේ. ඒවා නම් මහනුවර, මාතලේ හා නුවරඑළියයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ උතුරු දිශාවට මායිම්ව හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටා ඇත. එය ග්‍රාම සේවා වසම් 131 කින් සමන්විත වන අතර හප්පාවර ග්‍රාමය (491D) මින් එක් ග්‍රාම සේවා වසමකි. හප්පාවර ග්‍රාමය උතුරින් ඇදිරිබැද්ද ග්‍රාම නිලධාරී වසමින්ද, බස්නාහිරින් පල්ලෙවෙල ග්‍රාම නිලධාරී වසමින්ද, දකුණු දිශාවෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, නැගෙනහිර දෙසින් මහනුවර රන්දෙනිගල හරහා බදුල්ල ප්‍රධාන මාර්ගයෙන් හා රන්දෙනිගල ජලාශයෙන් මායිම් වී ඇත.

කරල්ලියැද්ද ගොවි ජන සේවා බල ප්‍රදේශයට අයත් වන හප්පාවර ග්‍රාමය ඉතා විශාල මෙන්ම සශ්‍රීක වෙල් යායකට හිමිකම් කියන ග්‍රාමයකි. පරිපාලනමය වශයෙන් හප්පාවර ග්‍රාමය හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේ. හප්පාවර ග්‍රාමය අක්කර 985 ක් පුරා පැතිරුනු විශාල ග්‍රාමයකි. මෙම භූමි ප්‍රමාණය ප්‍රධාන ලෙසම ගොඩ සහ මඩ ඉඩම් ලෙස වෙන්කර දැක්විය හැක. මෙයින් දැනට වගා කළ හැකි ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 147 වන අතර මඩ ඉඩම් ප්‍රමාණය අක්කර 123 කි.

මෙම මඩ ඉඩම් ප්‍රමාණය යල මහ දෙකන්නයේම වගා කරනු ලබයි. ග්‍රාමය තුළ මාස් කන්නයට පමණක් හේන් වශයෙන් වගා කරනු ලබන භූමි ප්‍රමාණය අක්කර 78 කි. ඉතිරි ගොඩ ඉඩම් ප්‍රමාණය වගා නොකෙරේ. ග්‍රාමය තුළ පවතින බොහෝ ඉඩම් රජයට අයත් වන රන්දෙනිගල රක්ෂිතයේ ඉඩම්ය. මේම ඉඩම් බලෙන් අල්ලා ගන්නා ලද ඉඩම් බව ප්‍රදේශවාසීහු පවසති.

### 2.2 දේශගුනික තත්ත්වය

මධ්‍යම කඳුකරයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හප්පාවර ග්‍රාමයේ වාර්ෂික වර්ෂාපතනය මිලි ලීටර 1400 ට වඩා වැඩිය. සාමාන්‍ය පාරිසරික උෂ්ණත්වය 22.5-25$C^0$ අතර වේ. ප්‍රදේශයේ රතු කහ මිශ්‍ර පැඩිසොලින් වැලි පසක් ඇති අතර කඳු බෑවුම් සහිත භූමි ප්‍රදේශයකි. රන්දෙනිගල ජලාශයේ රක්ෂිතය මෙම ග්‍රාමය ආශ්‍රිතව පිහිටා ඇති නිසා ගම්මානය ආශ්‍රිතව විශාල ලඳු කැළෑ පිහිටා ඇත. සාමාන්‍ය වියළි දේශගුණික තත්ත්වයක් ගම්මානයේ දැකිය හැක.

### 2.3 ඓතිහාසික තත්ත්වය හා ජනාවාස වීම

මෙම ගම පාරම්පරික ගමක් වන අතර ජනප්‍රවාදයේ පැවත එන ආකාරයට ගමේ නම සෑදී ඇත්තේ මේ ආකාරයටය. හප්පාවර ගම්මානයේ විශාල වෙල් යායකට හිමිකම් කියයි. අතීතයේදී ද වර්තමානයේ මෙන්ම වී වගාව හොඳින් සිදු කර ඇත. එක් නියං සමයකදී මෙම විශාල කුඹුරු යාය විනාශ වී, වී පදුරු හතක් පමණක් ඉතිරි වී ඇත. එම ගොයම් පදුරු හත පැවති ගම හප්පාවර යන නමින් ජනප්‍රවාදයේ පැවත එන බව ජනතාවගේ මතයයි. මෙම ග්‍රාමය පිහිටා තිබෙන්නේ රන්දෙනිගල ජලාශය ආශ්‍රිතව නිසා මහවැලියට අයත් ඉඩම් හා ජලාශය ආශ්‍රිතව රක්ෂිත ඉඩම් කට්ටි රාශියක් ගම අවට පවතී. දැනට ගමේ ජීවත් වන බොහෝ ගම් වැසියන් සතුව ඉඩම් ඔප්පු නොමැත. ඓතිහාසිකව මෙම ගම ජනාවාස වීම සිදුවී ඇති අතර රජයෙන් ඉඩම් බෙදා දීමක් සිදු වී නොමැත.

### 2.4 ජනගහනය

ගමේ මුළු ජනගහනය 482 ක් වන අතර එය ස්ත්‍රී 252 ක් හා පුරුෂ 230 ක් ලෙස දැක්විය හැක. මෙම ගම තුළ පවුල් 124 ක් වාසය කරන අතර, පවුල් සියල්ලම සිංහල බෞද්ධ (100%) පවුල් බව සමීක්ෂණයේදී හෙළි විය. විශේෂිත වූ කුල කණ්ඩායම් මෙම ගම තුළ දැකිය නොහැකි වන අතර බොහෝ දෙනා ගොවිගම කුලයට අයත් වුවන්ය.

#### 2.4.1 නියැදි ජනගහන තොරතුරු

ගම නැගුම වැඩසටහන යටතේ ආදර්ශ ගම්මානයක් ලෙස දියුණු කිරීමට තෝරාගත් හප්පාවර ග්‍රාමයේ පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනය සඳහා පවුල් 63 ක් යොදා ගන්නා ලදී.

හප්පාවර ග්‍රාමයේ සාමාජික සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්තිය සළකා බැලූ විට පහත පරිදි විස්තර කළ හැක.

**වගුව 2.1 - සාමාජික සංඛ්‍යාව අනුව නියැදි පවුල් සංඛ්‍යාව බෙදී ඇති අන්දම**

| සාමාජික සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 0-2 | 12 | 19% |
| 3-6 | 42 | 67% |
| 7-9 | 09 | 14% |
| 9< | 0 | 0 |
| එකතුව | 63 | 100% |

සාමාජික සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්තිය සළකා බැලූ විට ගමෙහි පවුල් වලින් 67% ක් පමණ පිරිසකගේ පවුල් වල සාමාජිකයන් සංඛ්‍යාව සාමාජිකයන් 3-6 ක් අතර වේ. සාමාජිකයන් දෙදෙනෙකු පමණක් හෝ ඊට අඩු පවුල්

19% පමණ ගම තුළ වාසය කරනු ලබයි. එසේම සාමාජිකයින් සංඛ්‍යාව 7-9 අතර පවුල් 14% පමණ හප්පාවර ග්‍රාමයේ දක්නට ලැබේ. නමුත් සාමාජිකයන් 09 කට වඩා වැඩි පවුල් නියැදිය තුළ දක්නට නොලැබිණි. මෙම පවුල්වල 92% පමණ ගෘහ මූලිකයා වී ඇත්තේ පුරුෂයාය. ග්‍රාමයේ ඉතිරි පවුල් ප්‍රමාණයේ ගෘහ මූලිකයා ස්ත්‍රීන්ය.

හප්පාවර ග්‍රාමයේ සමීක්ෂණය සිදුකළ පවුල් 63 තුළ ස්ත්‍රී පුරුෂ ලෙස සාමාජිකයන් සංඛ්‍යාව බෙදී ඇති ආකාරය 2.2 වගුව පරිදි විස්තර කළ හැක.

**වගුව 2..2 - නියැදි ජනගහනය ස්ත්‍රී පුරුෂ වශයෙන් බෙදී ඇති අන්දම.**

| | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ස්ත්‍රී | 142 | 51 |
| පුරුෂ | 134 | 49 |
| **එකතුව** | 276 | 100% |

සමීක්ෂණයට අනුව ග්‍රාමය තුළ මුළු ජනගහනයෙන් 51% පමණ ස්ත්‍රීන්ය. මෙය ශ්‍රී ලංකාවේ සාමාන්‍ය කාන්තා ජනගහනය හා සැසඳීමේදී වෙනසක් නොමැති අතර හප්පාවර ගම තුළ ද එම තත්ත්වය පෙන්නුම් කරයි. මේ අනුව ගම්මානයේ මුළු ජනගහනයෙන් පිරිමි ජනගහනය 49% ක් පමණ වේ.

**වගුව 2.3 නියැදි ජනගහනය වයස් ඛණ්ඩ අනුව බෙදී ඇති අන්දම.**

| වයස් කාණ්ඩය | ස්ත්‍රී | | පුරුෂ | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0-4 | 4 | 3 | 6 | 4.2 | 10 | 3.6 |
| 5-9 | 5 | 3.7 | 10 | 7.0 | 15 | 5.4 |
| 10-14 | 9 | 6.7 | 21 | 14.8 | 30 | 10.9 |
| 15-24 | 42 | 31.3 | 38 | 26.8 | 80 | 29.0 |
| 25-34 | 12 | 9.0 | 13 | 9.2 | 25 | 9.1 |
| 35-44 | 23 | 17.2 | 25 | 17.6 | 48 | 17.4 |
| 45-54 | 19 | 14.2 | 16 | 11.3 | 35 | 12.7 |
| 55-64 | 8 | 6.0 | 7 | 4.9 | 15 | 5.4 |
| 65-74 | 4 | 3 | 4 | 2.8 | 8 | 2.9 |
| 75 ට වැඩි | 8 | 6 | 2 | 1.4 | 10 | 3.6 |
| එකතුව | 134 | 100 | 142 | 100 | 276 | 100 |

වයස් ව්‍යුහය අනුව හප්පාවර ග්‍රාමයේ ජනගහන ව්‍යාප්තිය සළකා බැලූ විට අවු. 14 ට අඩු ස්ත්‍රී ජනගහනය 18 ක් වන අතර, පුරුෂ ජනගහනය 37 කි. එය ප්‍රතිශතයක් ලෙස ගත්විට මුළු නියැදි ජනගහනයෙන් 20% ක් පමණය. අවු. 14-55 අතර ජනගහනය ගත් කළ එය 68.% කි. අවුරුදු 55ට වඩා වැඩි ජනගහනය 12 කි. මෙම වර්ගීකරණයට අනුව හප්පාවර ග්‍රාමයේ ජනගහනයෙන් වැඩි කොටසක් එනම් 70% පමණ ප්‍රමාණයක් ආර්ථික

ක්‍රියාවලියට දායක විය හැකි පිරිස බව පෙනී යයි. නමුත් සක්‍රියව ආර්ථික ක්‍රියාවලියට දායක වන පිරිස මෙයට වඩා අඩුය. එයට හේතුව වර්තමානයේ අවු. 20 ට අඩු ළමුන් ආර්ථික කටයුතුවලට දායකවීම සාපේක්ෂ ලෙස අඩු අතර ඔවුන් ඒ දක්වා අධ්‍යාපන කටයුතුවල නිරත වේ.

## 2.4 විවාහක තත්ත්වය

| තත්ත්වය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| විවාහක | 132 | 47.8 |
| අවිවාහක | 133 | 48.2 |
| වැන්දඹු | 10 | 3.6 |
| දික්කසාද/වෙන් වූ | 1 | 0.4 |
| එකට ජීවත්වන විවාහ නොවූ | 0 | 0 |
| එකතුව | 276 | 100 |

හප්පාවර ග්‍රාමයේ විවාහක තත්ත්වය අනුව ජනගහනය වර්ග කළ විට ඉහත 2.4 වගුවේ දැක්වෙන ලෙස විස්තර කළ හැක. ග්‍රාමයේ සමීක්ෂණයට භාජනය කළ ජනතාවගෙන් විවාහ වී ඇති පිරිස 132 වන අතර එය 48% වේ. අවිවාහක පිරිස 48% ක් වන අතර ගම්මානයේ වැන්දඹු වූවන් 10 දෙනෙකු සිටී. එය මුළු ජනගහනයෙන් 3.6% කි. දික්කසාද වූ එක් අයෙකු හප්පාවර ග්‍රාමයේ ජීවත් වේ. විවාහ නොවී එකට ජීවත් වන එකදු පුද්ගලයෙකුවත් හප්පාවර ග්‍රාමයේ නොමැත.

## 2.5 අධ්‍යාපන තත්ත්වය

හප්පාවර ග්‍රාමයේ ගම් වැසියන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව ද මූලික සමාජ ආර්ථික සමීක්ෂණයේදී අවධානයට ලක් කරන ලදී. ඒ අනුව ගම්මානයේ මුළු ජනගහනයේ අධ්‍යාපන මට්ටම පහත වගුව 2.5 ආශ්‍රිතව විග්‍රහ කල හැක.

වගුව 2.5 – නියැදි ජනගහනයේ අධ්‍යාපනය අනුව බෙදී ඇති අන්දම

| අධ්‍යාපන මට්ටම | පිරිමි | | ගැහැණු | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පාසල් නොයන බාල වයස් | 06 | 4.5 | 09 | 6.3 | 15 | 5.4 |
| ප්‍රාථමික (1-5 වසර දක්වා) | 37 | 27.6 | 36 | 25.4 | 73 | 26.4 |
| ද්විතීයික (6-අ.පො.ස. සා/පෙළ) | 76 | 56.7 | 78 | 54.9 | 154 | 55.8 |
| අ.පො.ස. සා/පෙළ සමත් | 6 | 4.5 | 11 | 7.7 | 17 | 6.2 |
| අ.පො.ස. උ/පෙළ සමත් | 04 | 3.0 | 03 | 2.1 | 07 | 2.5 |
| පාසල් නොගිය ලිවීම කියවීම හැකි | 03 | 2.2 | 02 | 1.4 | 05 | 1.8 |
| පාසල් නොගිය ලිවීමට කියවීමට නොහැකි | 02 | 1.5 | 03 | 2.1 | 05 | 1.8 |
| එකතුව | 134 | 100 | 142 | 100 | 276 | 100 |

ඉහත සංඛ්‍යා සටහනට අනුව පාසල් නොයන එනම් වයස අවු. 05 ට අඩු ළමුන් 15 දෙනෙක් සිටී. එම ප්‍රමාණය මුළු ජනගහයෙන් 5.4% කි. ප්‍රාථමික අධ්‍යාපනය ලබන හෝ ප්‍රාථමික අධ්‍යාපන මට්ටම දක්වා අධ්‍යාපනය ලබා ඇති පිරිස ගම්මානයේ සමීක්ෂණයට ලක් කළ පවුල්වල මුළු ජනගහනයෙන් 26.4 කි. (පුද්ගලයින් 73 කි.)

හප්පාවර ගම්මානයේ ද්විතියික අධ්‍යාපනය ලැබූ පිරිස (6 වසර සිට අ.පො.ස. සා.පෙළ දක්වා) ගම්මානයේ මුළු ජනගහනයෙන් 56% ක් පමණි. සමීක්ෂණයේ තොරතුරු අනුව පැහැදිලි වන්නේ ගම්මානයේ වැඩි පිරිසක් ද්විතීයික අධ්‍යාපන මට්ටම දක්වා අධ්‍යාපනය ලබා ඇති පිරිසක් බවයි. ගම්මානයේ මුළු ජනගහනයෙන් 6.2% ක් පමණ අ.පො.ස. (සා.පෙළ) සමත් වී ඇති බව සමීක්ෂණයේ දත්ත අනුව හෙළි වී ඇත. එමෙන්ම උසස් පෙළ සමතුන් 07 දෙනෙක් පමණ (2.5%) ගම්මානයේ සිටින බව සමීක්ෂණ තොරතුරු මගින් තහවුරු වේ.

**වගුව 2.6 - හප්පාවර ගම්මානයේ ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම**

| අධ්‍යාපන මට්ටම | පිරිමි | ගැහැණු | එකතුව |
|---|---|---|---|
| ප්‍රාථමික | 27 | 3 | 30 |
| ද්විතීයික | 25 | 1 | 26 |
| අ.පො.ස. සා.පෙළ සමත් | 1 | 1 | 2 |
| අ.පො.ස. උ.පෙළ සමත් | 1 | 0 | 1 |
| පාසල් නොගිය ලිවීමට කියවීමට හැකි | 2 | 0 | 2 |
| පාසල් නොගිය ලිවීමට කියවීමට නොහැකි | 2 | 0 | 2 |
| එකතුව | 58 | 5 | 63 |

මූලික සමාජ ආර්ථික සමීක්ෂණයේදී ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටමද සැලකිල්ලට ගනු ලැබීය. හප්පාවර ගම්මානයේ සමීක්ෂණයට ලක් කළ පවුල් අතුරෙන් ගෘහ මූලිකයා වශයෙන් පුරුෂයන් සටින පවුල් 58 ක් හා ස්ත්‍රීන් ගෘහ මූලිකයන් වූ පවුල් 5 ක් දක්නට ලැබුනි. මෙම ගෘහ මූලිකයන් බොහෝ දෙනෙක් එනම් 48% ක් පමණ ප්‍රාථමික අධ්‍යාපන මට්ටම දක්වා පමණක් අධ්‍යාපනය ලබා ඇත. එමෙන්ම ගම්මානයේ ගෘහ මූලිකයන්ගෙන් 40% ක් පමණ ද්විතීයික මට්ටම දක්වා අධ්‍යාපනය ලබා ඇත. පාසල් නොගිය ලිවීමට කියවීමට නොහැකි ගෘහ මූලිකයන් 02 ක්ද පාසල් නොගිය එහෙත් ලිවීමට කියවීමට හැකි ගෘහ මූලිකයන් වෙසෙන පවුල් දෙකක් ද ගම්මානයේ ඇත.

ගම්මානයේ අවු. 5-14 ත් අතර පාසල් නොයන ළමුන් නොමැත. එම වයසේ සිටින සියළුම දරුවන් පසල් අධ්‍යාපනය ලබයි. ගම්මානයේ දෙමව්පියන් තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට ඉතා උනන්දුවෙන් කටයුතු කරන බව සමීක්ෂණයේදී හෙළි විය.

## තුන්වන පරිච්ඡේදය

# ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම

මෙම පරිච්ඡේදය තුළදී හප්පාවර ගම්මානයේ ආර්ථික කටයුතු සහ රැකියාවන්ගේ ස්වභාවය සහ ආදායම ගැන සාකච්ඡා කෙරේ. ඒ යටතේ දී සේවා නියුක්තිය, ආර්ථික කටයුතු සහ ආදායම් මාර්ග, ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය, දුප්පත්කම, ඉතිරි කිරීම්, ණයගැතිභාවය යන කරුණු ගැන සාකච්ඡා කෙරේ.

### 3.1 සේවා නියුක්තිය

නවතම අර්ථ දැක්වීමට අනුව ශ්‍රම බලකායට අයත් වන්නේ වයස අවු. 10-65 ත් අයත් ජනගහනයයි. එම අර්ථ දැක්වීමට අනුව හප්පාවර ග්‍රාමයේ ශ්‍රම බලකායට අයත් වයස අවු.10-65 ත් අතර පුද්ගලයන් ගණන 233 කි. ගමේ මුළු ජනගහනයෙන් 84% පමණය. ගම තුළ පුද්ගලයින 233 දෙනෙකු ශ්‍රම බලකායට ඇතුලත් වුවද රැකියා නියුක්තියන් ප්‍රමාණය 165 දෙනෙකි. එනම් රැකියා නියුක්ත ප්‍රමාණය ශ්‍රම බලකායෙන් 70% කි. හප්පාවර ග්‍රාමයේ සේවා වියුක්තිකයන් ප්‍රමාණය ශ්‍රම බලකායෙන් 30% කි. ගම්මානයේ යැපුම් අනුපාතය එනම් මුළු ජනගහනයෙන් යැපෙන්නන්ගේ ප්‍රමාණය අවුරුදු 10 ට අඩු හා අවුරුදු 65 වැඩි අය 15% ක් ලෙසද රැකියා වියුක්තිකයන් 25% ක ලෙසද (40%) දැක්විය හැක. ශ්‍රම බලකායෙන් රැකියා නියුක්තිකයින්ගේ පුරුෂ නියෝජනය 52% ක් පමණ වන අතර ස්ත්‍රී නියෝජනය 48% කි.

### 3.2 ආර්ථික කටයුතු හා ආදායම් මාර්ග

මෙම ගම්මානයේ ප්‍රධාන ආර්ථික කටයුත්ත වන්නේ කෘෂිකර්මාන්තයයි. ගම්මානයේ මුළු ජනගහනයෙන් 42% පමණ පිරිසක් ගොවිතැන ආශ්‍රිතව තම ප්‍රධාන රැකියාව සිදු කරයි. ගම්මානය තුළ සේවා නියුක්තිකයන් කෘෂි කර්මාන්තය හා ඒ ආශ්‍රිත රැකියා තම ප්‍රධාන රැකියාව වශයෙන් සිදු කරන ප්‍රමාණය 71% පමණ වේ. ගම තුළ වෙසෙන සේවා නියුක්තිකයන්ගෙන් 29% පමණ කෘෂිකර්ම නොවන අනෙකුත් රැකියා තම ප්‍රධාන රැකියාව වශයෙන් සිදු කරන බව පැහැදිලි විය.

ඉහත ප්‍රධාන රැකියාවලට අමතරව ගම්මානයේ ශ්‍රම බලකායෙන් 50% පමණ අනෙකුත් ආදායම් මාර්ග ලෙස ද්විතීයික රැකියාවල නියුතු වී ඇත. මේ අතරින් වැඩි පිරිසක් කෘෂි කම්කරුවන් වශයෙන් වැඩ කර අමතර ආදායමක් උපයා ගනී. එසේම අමතර ආදායම් මාර්ග ළඟාකර ගැනීම සඳහා සත්ව පාලනය, ශිල්පීය රැකියා හා ස්වයං රැකියාවල නිරත වන ඉතා සුළු පිරිසක් ද ගම්මානයේ වාසය කරති.

3.3 ශ්‍රම බලකායන්හි රැකියාවන්හි ස්වභාවය

3.1 පවුලේ සාමාජිකයන් නිරත වන ප්‍රධාන රැකියාව

| රැකියාවේ ස්වභාවය | පිරිමි | ගැහැණු | එකතුව | |
|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ගොවි කාරක | 56 | 03 | 59 | 3.57 |
| ගොවිපළ සහායක | 03 | 52 | 55 | 33.3 |
| කෘෂි කම්කරු | 01 | 02 | 03 | 1.8 |
| කෘෂි නොවන කම්කරු | 02 | - | 02 | 1.2 |
| රාජ්‍ය අංශයේ සේවාව | 04 | 01 | 05 | 3.0 |
| ආරක්ෂක අංශයේ රැකියා | 01 | 00 | 01 | 0.6 |
| පෞද්ගලික අංශයේ රැකියා | 10 | 18 | 28 | 16.9 |
| ස්වයං රැකියා | 08 | - | 08 | 4.8 |
| විදේශීය රැකියා | 00 | 03 | 03 | 1.8 |
| ධීවර කර්මාන්තය | 01 | 00 | 01 | 0.6 |
| එකතුව | 86 | 79 | 165 | 100 |

ශ්‍රම බලකායෙන් 36% පමණ තම ප්‍රධාන රැකියාව ලෙස කෘෂිකර්මාන්තයේ නියැලී සිටී. මෙයින් 94% ක පමණ ප්‍රමාණයක් පිරිමින්ය. ගොවිපළ සහායක ලෙස තම ප්‍රධාන රැකියාව සිදු කරන ප්‍රමාණය 33% කි. මෙහි ප්‍රධාන වශයෙන් යෙදී සිටින්නේ කාන්තාවන්ය.

ප්‍රධාන රැකියාව වශයෙන් කෘෂි කම්කරුවන් ලෙස සේවය කරන පිරිස 03 දෙනෙකි. එය එක් පුරුෂයෙකු හා කාන්තාවන් දෙදෙනෙකු වශයෙනි. කෘෂි කම්කරුවන් ලෙස තම ප්‍රධාන රැකියාව කරන පිරිස ගම්මානයේ ශ්‍රම බලකායෙන් 02% කට ආසන්නය. ශ්‍රම බලකායෙන් 01% පමණ කෘෂි නොවන කම්කරුවන් ලෙස තම ප්‍රධාන රැකියාව තෝරාගෙන ඇත.

කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයට අමතරව ගම්මානයේ ශ්‍රම බලකායෙන් 17% ක් පමණ ප්‍රමාණයක් තම ප්‍රධාන රැකියාව ලෙස පෞද්ගලික අංශයේ සේවාවන් සිදු කරයි. මෙය ගමේ මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස ගත් විට 10% ක් පමණ වේ. පෞද්ගලික අංශයේ රැකියාවල නියුතුවූවන්ගෙන් වැඩි පිරිසක් කාන්තාවන් වන අතර එම ප්‍රමාණය 64% ක් පමණ වේ. ගම තුළ පෞද්ගලික අංශයේ රැකියා කරන අයගෙන් ගැහැණු ළමයින් විශාල පිරිසක් ඇඟළුම් කර්මාන්ත ආශ්‍රිතව රැකියාවල නිරතව ඇත. මීට අමතරව පෞද්ගලික අංශයේ රැකියා කරන පුරුෂ පක්ෂයේ පිරිස ඇඟළුම් සහ වෙනත් පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වේ. හප්පාවර ග්‍රාමයට ආසන්නයේ කිර්ති බණ්ඩාර පුර ඇඟළුම් කම්හලක් පවත්වාගෙන යන බැවින් ගමතුළ සිටින වැඩි පිරිසකට ඇඟළුම් කර්මාන්තය ආශ්‍රිතව රැකියාවලට යොමු වීමේ ඉඩකඩ වැඩි වී ඇත.

හප්පාවර ග්‍රාමය තුළ රාජ්‍ය අංශයේ සේවය කරන පිරිස 2% පමණ වේ. ආරක්ෂක අංශයේ සේවය කරන පිරිස හප්පාවර ග්‍රාමයේ ඉතා අඩු වන අතර එය 0.4% ක් පමණ වේ. ගම්මානයේ තම ප්‍රධාන රැකියාව ලෙස ස්වයං

රැකියා සිදු කරන පිරිස ශ්‍රම බලකායෙන් 05% පමණ වේ. ස්වයං රැකියාවල නිරත වී සිටින සියල්ලන්ම පාහේ පුරුෂ පක්ෂයට අයත් වේ. ගම්මානයේ විදේශ රැකියාවල නියුතු පිරිස ශ්‍රම බලකායෙන් 1.8% වන අතර, විශේෂය ඔවුන් සියල්ලන්ම ස්ත්‍රීන්ය.

හප්පාවර ග්‍රාමය රන්දෙනිගල ජලාශයට මායිම්ව පිහිටා ඇතත් තම ප්‍රධාන රැකියාව ලෙස ධීවර කර්මාන්තයේ යෙදෙන එක් පුද්ගලයෙකු පමණක් මෙම ගම්මානයේ වාසය කරයි. මෙම රැකියාව සඳහා ගම තුළ විශාල විභවතාවයක් පැවතුනද ධීවර ආම්පන්න නොමැතිකම නිසා ගම්මානයේ එක් පුද්ගලයෙකු දැනට එක් බෝට්ටුවක ආධාරයෙන් තම ප්‍රධාන රැකියාව ලෙස ධීවර කර්මාන්තයේ යෙදී සිටියි.

### 3.3.1 ද්විතියීක රැකියාවල නියැලීම

### 3.2 පවුලේ සාමාජිකයන් නිරත වන ද්විතීයික රැකියා

| රැකියාවේ ස්වභාවය | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ගොවිකාරක | 03 | 0 | 03 | 1.8 |
| ගොවිපල සහායක | 01 | 0 | 01 | 0.6 |
| සත්ව පාලනය | 01 | 0 | 01 | 0.6 |
| කෘෂි කම්කරු | 36 | 30 | 66 | 40.0 |
| කෘෂි නොවන කම්කරු | 05 | 0 | 05 | 3 |
| ස්වයං රැකියා | 03 | 0 | 03 | 1.8 |
| ශිල්පීය රැකියා | 04 | 0 | 04 | 2.4 |
| රැකියාවන් සඳහන් නොවන | 33 | 49 | 82 | 49.7 |
| එකතුව | 86 | 79 | 165 | 100 |

ශ්‍රම බලකායෙන් 50% ක පමණ ප්‍රමාණයක් කිසිදු ද්විතීයික රැකියාවක නොයෙදේ. නමුත් ශ්‍රම බලකායෙන් 40% පමණ පිරිසක් තම ද්විතීයික රැකියාව වශයෙන් කෘෂි කම්කරුවන් ලෙස වැඩ කරනු ලබයි. තම ද්විතීයික රැකියාව ලෙස කෘෂි කර්මාන්තයේ ගොවි කාරක ලෙස යෙදී සිටින ප්‍රමාණය ශ්‍රම බලකායෙන් 1.8% කි. මෙසේ ගොවි කාරක ලෙස ද්විතීයික රැකියාව කරන පුද්ගලයන් රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු අය බව සමීක්ෂණයේදී හෙළි විය.

හප්පාවර ග්‍රාමයේ ගොවිපළ සහායක සහ සත්ත්ව පාලනය ලෙස තම ද්විතීයික රැකියාව සිදු කරන ප්‍රමාණය ඉතා අඩුය. එම ප්‍රමාණය 0.6% ක් පමණ වේ. මීට අමතවර ගමෙහි ශ්‍රම බලකායෙන් 03% ක් ස්වයං රැකියා ලෙසද ශ්‍රම බලකායෙන් 2.4% ශිල්පීය දක්ෂතා මත සිදු කරන රැකියා ඔවුන්ගේ ද්විතියීක රැකියාවන් වශයෙන් සිදු කරනු ලබයි.

හප්පාවර ග්‍රාමයේ වැටුප් ලබන රැකියාවල නිරතවූවන්ගේ රැකියාවේ තත්ත්වය පහත පරිදි විස්තර කළ හැක.

**වගුව 3.3 වැටුප් ලබන රැකියාවල තත්ත්වය**

| රැකියාවේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| ස්ථිර රැකියා | 05 |
| තාවකාලික රැකියා | 109 |
| අර්ධකාලීන රැකියා | 03 |
| එකතුව | 117 |

ගම්මානයේ රැකියාවල්වල නියුතු පිරිසෙන් ස්ථිර රැකියාවල නියුතුව සිටින පිරිස ඉතා අඩුය. එය ගම්මානයේ රැකියාවල නියුතු පිරිසෙන් 4.3% ක් පමණය. ගම්මානයේ වැටුප් ලබන රැකියාවල නියුතු ප්‍රමාණයෙන් 93% ක්ම තාවකාලික රැකියාවල නියුක්ත ව ඇත. මීට අමතරව ගම තුළ අර්ධ කාලීන ලෙස රැකියාව සිදු කරන ප්‍රමාණය 2.6% කි. මෙම කරුණු අනුව පෙනී යන්නේ හප්පාවර ග්‍රාමයේ වෙසෙන ජනතාවගෙන් මසකට ස්ථිර ලෙස ආදායමක් උපයාගන්නා පිරිස ඉතා අඩු බවයි.

### 3.4 ආදායම

හප්පාවර ග්‍රාමයේ අධ්‍යයනයට ලක්කළ පවුල්වල දළ වාර්ෂික ආදායම පහත පරිදි විස්තර කළ හැක.

**වගුව 3.4 - ආදායම් කාණ්ඩ අනුව පවුල්වල වර්ගීකරණය**

| ආදායම් කාණ්ඩය (රු./වර්ෂයට) | පවුල් සංඛ්‍යාව | මධ්‍යනය ආදායම |
|---|---|---|
| 1,000-5,000 | 01 | 1680.00 |
| 5,000-10,000 | 01 | 5760.00 |
| 15,000-25,000 | 02 | 18925.00 |
| 25,000-50,000 | 03 | 39180.00 |
| 50,000-75,000 | 10 | 66051.00 |
| 75,000-10,0000 | 07 | 84467.00 |
| 100,000 වැඩි | 39 | 174349.00 |
| එකතුව | 63 | 130384 |

හප්පාවර ගම්මානයේ අධ්‍යයනයට ලක්කළ පවුල්වලින් 62% ක් පමණ පවුල්වල දළ වාර්ෂික ආදායම රු.100,000 ට වඩා වැඩිය. එහි මධ්‍යනය අගය රු.174389.00 කි. මෙයින් පැහැදිලි වන්නේ ගම්මානයේ පවුල්වලින් 62% ක්ම රු. 14529/= ක පමණ දළ මාසික ආදායමක් ලබන බවයි. ඉතිරි 38% ක් පමණ පවුල් ප්‍රමාණයක් ලබන දළ වාර්ෂික ආදායම රු.100,000 ට වඩා අඩුය. මේ අතරින් රු.50,000 ක් 100,000 ත් අතර දළ වාර්ෂික ආදායමක් ලබන පිරිස 26% ක් පමණ වේ. සාමාන්‍ය ඉහළ වාර්ෂික ආදායමක් ලබන පවුල් 62% ක් පමණ සිටියද රු.5000 ට වඩා අඩුවෙන් වාර්ෂික ආදායමක් ලබන එක් පවුලක්ද රු. 5000 ත් 10,000 ත් අතර වාර්ෂික ආදායමක් එක් පවුලකුත් හප්පාවර ගම්මානයේ ඇත. රු.5000 ට වඩා අඩු වාර්ෂික ආදායමක් ලබන පවුලේ සාමාන්‍ය වාර්ෂික ආදායම රු.1680/= ක් බව සමීක්ෂණයේදී හෙලි වී ඇත. එයින් පෙනී යන්නේ මෙම පවුල සඳහා මාසිකව ලැබෙන්නේ රු. 140/- ක් වැනි සුළු මුදලකි. මෙම ආදායම ලැබෙන්නේ ද සමෘද්ධි සහනාධාරයක්



21362

තුලින් බව අනාවරණය විය. ඉහත තොරතුරු අනුව පෙනී යන්නේ සාමාන්‍ය ඉහළ මධ්‍යස්ථ ආදායම් ලබන පිරිසක් සේම හප්පාවර ගම්මානයේ ඉතා පහළ වාර්ෂික ආදායමක් ලබන පිරිසක්ද ජීවත්වන බවයි.

ග්‍රාම සේවා වසමේ පවුල්වල ඉහතින් දක්වන ලද ආදායම් සංයුතිය තුළ විවිධාකාර ආදායම් මාර්ග හඳුනාගත හැකි විය. ඒ අතුරින් ගමේ ආදායමට ප්‍රධාන දායකත්වය සපයන ආදායම් මාර්ග කිහිපයක් ඒවායේ ප්‍රතිශතාත්මක වටිනාකම් සමග පහත දක්වා තිබේ. (වගුව 3.5)

**වගුව 3.5 – ආදායම් සංයුතිය ආදායම් මාර්ග අනුව බෙදීයාම**

| ආදායම් මාර්ගය | ගම්මානයේ දළ වාර්ෂික ආදායම % ලෙස |
|---|---|
| වී ගොවිතැන | 10.7 |
| එළවළු වගාව | 8.1 |
| රජයේ රැකියා | 8.8 |
| පෞද්ගලික අංශයේ රැකියා | 16.1 |
| කෘෂි කාර්මික කම්කරු | 26.1 |
| කෘෂි නොවන කම්කරු | 9.7 |
| ස්වයං රැකියා | 8.0 |
| මැද පෙරදිග | 5.0 |
| රජයේ සහනාධාර | 3.2 |
| පුහුණු ශ්‍රම/ධීවර/විශ්‍රාම වැටුප්/මරණාධාර/දරුවන් ලැබීම්/ සත්ත්ව පාලනය/වැවිලි බෝග/අතිරේක බෝග | 22.3 |
| එකතුව | 100 |

ගම්මානයේ ගොවීන්හට ප්‍රධාන ලෙසම ආදායම් ලැබෙන්නේ කෘෂිකාර්මික කම්කරුවන් ලෙස වැඩ කිරීමෙනි. ස්ත්‍රී දායකත්වය 26% ක් පමණ වේ. පෞද්ගලික අංශයේ සේවාවන් වලින් ලැබෙන ආදායම මුළු ආදායම් වලින් 16% ක් පමණ වේ. මීට අමතරව ගම්මානයට ප්‍රධාන ආදායම් ගෙන දෙන්නේ වී ගොවිතැන මගිනි. එය 10.7% ක් පමණි. එළවළු වගාව, රජයේ රැකියා, කෘෂි නොවන කම්කරු, ස්වයං රැකියා, මැදපෙරදිග සහ සහනාධාර මගිනුත් ගම්වැසියන් සැළකිය යුතු පිරිසක් සැළකිය යුතු ප්‍රතිශතයක ආදායමක් ලබාගන්නා බව සමීක්ෂණයේ තොරතුරු අනුව පැහැදිලි වේ.

### 3.5 දරිද්‍රතාවය

ග්‍රාම සේවා නිලධාරී වාර්තා අනුව ගමෙහි ජීවත්වන පවුල් ගණන පවුල් 124 ක් වන අතර එයින් පවුල් 92 ක්ම සහනාධාර ලබාගනී. මේ අනුව ගම්මානයේ පවුල් වලින් 74%ක්ම සමෘද්ධි සහනාධාර ලබන බව පෙනී යයි. මෙයින් පැහැදිලි වන්නේ හප්පාවර ග්‍රාමයේ වෙසෙන බොහෝ පිරිසක් දරිද්‍රතාවයෙන් පෙලෙන බවයි. ගම් වැසියන්ගෙන්

බොහෝ පිරිසකට ස්ථිර ආදායම් මාර්ග නොමැති බව ගැමියෝ පවසති. ඔවුන් ආදායම් උපයාගන්නා ප්‍රධාන මාර්ගය කෘෂිකර්මාන්තයයි.

හප්පාවර ග්‍රාමයේ දුප්පත්කමේ ස්වභාවය සැළකූ විට එය අඩු වැඩි වශයෙන් දක්නට ලැබේ. ගම්මානයේ අධික දරිද්‍රතාවයක් දක්නට නොමැති අතර සාමාන්‍ය දරිද්‍රතාවයක් දක්නට ලැබේ. මෙම දරිද්‍රතාවයට බලපා ඇති හේතුන් වන්නේ ගම්මානයේ බොහෝ පිරිසක් කෘෂි කර්මාන්තය ආශ්‍රිතව ජීවන වෘත්තිය පවත්වාගෙන යන අතර ඒ තුළින් ස්ථිර ආදායමක් නොලැබීමයි. ගම්මානයේ කුඹුරු අක්කර 123 ක් පමණ පැවතියද ගම්මානයේ ඇති ගොඩ ඉඩම් යල මහ දෙක්නයේම වගා කළ නොහැක. ඊට හේතුව ගොඩ ඉඩම්වලට ජලය ලබාගැනීම අපහසු වීමයි. ඊට අමතරව ගම්මුන්ට හා වගාවල් වලට නිතර සතුන්ගෙන් හානි සිදුවන බව ද ගම්මුන් පවසනු ලබයි.

### 3.6 ඉතිරි කිරීම්

**3.6 වගුව - හප්පාවර ගම්මානයේ ඉතිරි කිරීම් පිළිබඳ තොරතුරු**

| බැංකුව | ඉතිරි කිරීමේ ගිණුම් | | ළමා ගිණුම් | |
|---|---|---|---|---|
| | පුද්ගලයන් | ගිණුම් ගණන | පුද්ගලයන් | ගිණුම් ගණන |
| මහජන බැංකුව | 10 | 14 | | |
| ලංකා බැංකුව | 15 | 25 | | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 22 | 37 | 03 | 05 |
| සමෘද්ධි | 21 | 30 | 01 | 01 |
| කඳුරට සංවර්ධන බැංකුව | 11 | 14 | | |
| ග්‍රාමීය සමුපකාර බැංකුව | 02 | 02 | | |
| මානව සම්පත් සංවර්ධන බැංකුව | 02 | 05 | | |
| සණස | 01 | 01 | | |
| සෙලාන් බැංකුව | 01 | 02 | | |
| එකතුව | 86 | 131 | 04 | 06 |

සමීක්ෂණයෙන් සොයාගත් කරුණු අනුව ගම්මමානයේ නියැදි ජනගහනයෙන් 31% ක් පමණ විධිමත් මූල්‍ය ආයතන සමඟ ගනුදෙනු පවත්වාගෙන යයි. ඉතිරි කිරීම් ගිණුම් පවත්වාගෙන යන පිරිසෙන් වැඩි පිරිසක් ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා සමෘද්ධි බැංකුව සමඟ ගනුදෙනු පවත්වති. මහජන බැංකුව හා ලංකා බැංකුව සමඟද ගැමියන් සැළකිය යුතු පිරිසක් ගිණුම් පවත්වාගෙන යයි. මීට අමතරව කඳුරට සංවර්ධන බැංකුව, ග්‍රාමීය සමුපකාර බැංකුව, මානව සම්පත් සංවර්ධන බැංකුව, සණස, සෙලාන් බැංකුව ආදී බැංකු සමඟද සමහර ගැමියන් ගනුදෙනු කරනු ලබයි.

සමෘද්ධි බැංකුවේ හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ළමා ගිණුම් 4 ක් පවත්වාගෙන යන බව සමීක්ෂණයේ දත්ත මඟින් හෙළි වී ඇත. ගම්මානයේ පුද්ගලයින් විවිධ බැංකු සමඟ ගනුදෙනු කරන බව පැවසෙන තොරතුරු අප සමඟ පැවසුවත් අදාල ගිණුම්වල ඇති මූල්‍යමය වත්කම් සඳහන් කිරීමට ඔවුහු අකමැති වූහ.

ගම්මානයේ සමෘද්ධිලාභී පවුල් කරල්ලියද්ද සමෘද්ධි බැංකුව ආශ්‍රිතව විවිධ ගිණුම් පවත්වාගෙන යයි. එම ගිණුම් වර්ග සාමාජික තැන්පත්, කොටස් තැන්පත්, ඉතිරි කිරීමේ ගිණුම්, දිරියමාතා ගිණුම්, කණ්ඩායම් තැන්පත් හා අනිවාර්ය තැන්පත් ආදී වශයෙන් නම් කළ හැක. සමෘද්ධි බැංකුව ආශ්‍රිතව ගම්වාසීන් ඉතුරුම් සඳහා පෙළඹවීම මගින් විධිමත් මූල්‍ය ආයතන සමග ගනුදෙනු කිරීමට ගැමියන්හට අවස්ථාව උදා වන අතර ඒ සඳහා ඔවුන් දිරි ගැන්වීමක්ද සිදු කෙරේ.

හප්පාවර ග්‍රාමයේ සමීක්ෂණයට ලක්කල පවුල් 63 අතුරෙන් පවුල් 2ක් පමණක් සීට්ටු දැමීම සිදු කරයි. ඉතිරි පවුල් 61 ක්ම සීට්ටු දැමීම සඳහා සහභාගී වී නොමැත. සීට්ටු වලට සහභාගී වූ පවුල් සීට්ටු වාර 1-5 ත් අතර ප්‍රමාණයකට 2000 වසරෙන් පසුව සහභාගී වී ඇත.

### 3.7 ණයගැති භාවය

හප්පාවර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ විවිධ මූල්‍ය ආයතන වලින් ණය ලබාගත් පුද්ගලයන් ප්‍රමාණය 30 දෙනෙකි. ආයතනවලින් ණය ලබාගත් පුද්ගලයින් ගණන මුළු ජනගහනයෙන් 11% ක් පමණ වේ. මෙයින් ගම්‍ය වන්නේ ගම්මානයේ වෙසෙන මුළු නියැදි ජනගහණයේ 11% ක් පමණ ණයගැති භාවයෙන් පෙළෙන බවයි. ගම්මානයේ ණය ලබා ගෙන ඇති පිරිස ලබාගෙන ඇති ණය ප්‍රමාණයන් පහත පිළිබඳ විස්තර 3.7 වගුව මගින් දක්වා ඇත.

**වගුව 3.7 - ණයගැතිභාවය**

| ණය ප්‍රමාණය රු. | පුද්ගලයින් ගණන |
|---|---|
| 2,000-5,000 | 06 |
| 5,000-7,500 | 05 |
| 10,000-20,000 | 10 |
| 20,000-50,000 | 05 |
| 50,000 ට වැඩි | 04 |
| එකතුව | 30 |

සමීක්ෂණයට අනුව ගම්මානයේ විවිධ මූල්‍ය ආයතනවලින් ණය ලබාගත් පිරිසෙන් වැඩි කොටසක් (33%) රු. 10,000 - 20,000 ත් අතර ණය ප්‍රමාණයක් ලබාගෙන ඇත. රු. 50,000 ට වඩා ණය ලබාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව හතරදෙනෙකි. මෙම පුද්ගලයන් විවිධ හේතු සඳහා ණය ලබාගෙන ඇත.

වගුව 3.8 - ණය ලබාගත් හේතු

| ණය ලබා ගන්නා හේතුව | පුද්ගලයින් ගණන |
|---|---|
| නිවාස සෑදීමට | 04 |
| ගොවිතැන්/ගොවි උපකරණ මිලදී ගැනීම | 20 |
| ණය බේරීම සඳහා | 01 |
| ස්වයං රැකියා/ව්‍යාපාර | 01 |
| වාහන මිලදී ගැනීමට | 01 |
| එකතුව | 30 |

ණය ලබාගත් හේතුන් අතර බොහෝමයක් ගොවීන් කෘෂිකර්මය සඳහා ණය ලබාගන්නා බව පෙනී යයි. එම ප්‍රමාණය ණය ලබාගන්නා ඉතිරි 10% ක පුද්ගලයින් ප්‍රමාණයක් ණය ලබාගෙන ඇත්තේ ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා, වාහන මිලදී ගැනීම සඳහා සහ අනෙකුත් ආයතනවලින් ලබාගත් ණය බේරීම සඳහාය.

හප්පාවර ගම්මානයේ ණය ලබාගත් ගැමියන් පහත සඳහන් වන කරුණු නිසා තමා ලබාගත් ණය සමීක්ෂණය කරන කාලයේදී ගෙවීමට නොහැකි වු බව සඳහන් කරයි.

වගුව 3.9 - ණය නොගෙවීමට හේතු

| ණය නොගෙවීමට හේතුව | පුද්ගලයන් ගණන |
|---|---|
| ඉදිරියට ගෙවීමට ඇති | 02 |
| ආර්ථික අපහසුතා | 07 |
| අස්වනු මිල අඩුවීම | 04 |
| අසනීප | 01 |
| එකතුව | 14 |

ණය ලබාගත් පුද්ගලයන් ගණනින් 47% සමීක්ෂණය පවත්වන කාලයේදී අදාළ ණය මුදල ගෙවා, නොතිබුණි. ණය ලබාගත් පුද්ගලයන්ගෙන් 7% ක පමණ ගොවීන් ප්‍රමාණයක් දැනට තමා ලබාගත් ණය මුදල ගෙවමින් සිටී. ආර්ථික අපහසුතා මත සහ අස්වනු මිල අඩුවීම නිසා සැළකිය යුතු පිරිසක් තමා ලබාගත් ණය මුදල ක්‍රමානුකූලව ගෙවා නොමැත.

හප්පාවර ගම්මානයේ ගැමියන් පහත දැක්වෙන ආයතන මඟින් තම ණය අවශ්‍යතා සපුරාගෙන ඇත. එක් එක් ආයතනවලින් ගම්වාසීන් ණය ලබාගෙන ඇති ආකාරය පහත 3.10 වගුව ආශ්‍රිතව විස්තර කළ හැක.

වගුව 3.10 - ණය ලබාගත් මාර්ග

| ණය ලබාගත් ආයතනය | ලබාගත් ණය පුද්ගලයන් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ලංකා බැංකුව | 01 | 3.3 |
| සමෘද්ධි බැංකුව | 14 | 46.6 |
| සණස | 01 | 3.3 |
| ගොවි බැංකුව | 02 | 6.6 |
| හිතවතුන් ගෙන් | 04 | 13.3 |
| වන සංරක්ෂණ | 01 | 3.3 |
| ගොවි සංවිධානය | 01 | 3.3 |
| කඳුරට සංවර්ධන බැංකුව | 05 | 16.6 |
| නිවාස බැංකුව | 01 | 3.3 |
| එකතුව | 30 | 100 |

ණය ලබාගෙන ඇති පිරිසෙන් වැඩි පිරිසක් සමෘද්ධි බැංකුවෙන් තම මූල්‍යමය අවශ්‍යතාවයන් සපුරාගෙන ඇත. එම ප්‍රමාණය 47% ක් පමණ වේ. මිට අමතරව 17% පමණ ප්‍රමාණයක් කඳුරට සංවර්ධන බැංකුවෙන්ද 13% ක් පමණ හිතුවතුන් මගින්ද තම මූල්‍ය අවශ්‍යතා සපුරාගෙන ඇත. ලංකාවේ බොහෝ ගම්මානවලට පොදු වන පරිදි සමෘද්ධි බැංකුව ග්‍රාමීයව විශාල දායකත්වයක් සපයයි. සමෘද්ධි බැංකුවේ ණය පොළී අනුපාතිකය 24% ක් පමණ වේ. එය සාපේක්ෂව ඉහළ පොළියක් වුවද ගම්මානයේ පුද්ගලයින්ට සමෘද්ධි බැංකුව සමග ගනුදෙනු කිරීමේ අවස්ථාව ලැබී ඇත. එයට හේතුව සමෘද්ධි බැංකුව සමග ගනුදෙනු කිරීමේදී පුද්ගලයන් කණ්ඩායම්ගත වී එකමුතුව මුදල් ඉතිරි කිරීම තුළින් පහසුවෙන් ණය මුදල ලබාගත හැකිවීමයි. අනෙකුත් බැංකු සමග ගනුදෙනු කිරීම ගම් වැසියන්ට තරමක් අපහසු කරුණකි. එම බැංකු මගින් ණය ලබා ගැනීමට යොමු වන පිරිස ද සාපේක්ෂව අඩුය.

ණය ලබාගත් ආයතන ගැන සළකා බැලීමේදී හප්පාවර ග්‍රාමයේ ගැමියන් සමෘද්ධි බැංකුවට අමතරව ප්‍රාදේශියව ක්‍රියාත්මක වන සණස, ගොවි බැංකුව, ගොවි සංවිධානය ආදී ආයතන මගින් ණය ලබා ගැනීමට පෙළඹී ඇත. මෙයින් පෙනී යන්නේ ගැමියන්ට මෙම සංවිධාන වෙතින් ණය ලබා ගැනීමට සපුරාලිය යුතු අවශ්‍යතා සඳහා ළගාවිය හැකි බවයි. නමුත් රාජ්‍ය අංශයේ බැංකුවලින් ණය ලබා ගැනීමට සපුරාලිය යුතු අවශ්‍යතා බොහෝ ගැමියන්ට ළගාවිය නොහැකි මට්ටමේ නිසා ඔවුන් එම ආයතනවලින් ණය ලබා ගැනීමට පෙළඹී නොමැත.

## හතරවන පරිච්ඡේදය

# නිවාස තත්ත්වය සහ පහසුකම්

හප්පාවර ගම්මානයේ පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු අනුව මෙම පරිච්ඡේදයේදී නිවාස තත්ත්වය සහ පහසුකම් විශේෂයෙන් නිවාසවල ස්වභාවය, ප්‍රමාණය ජල පහසුකම්, බල ශක්ති භාවිතය වැසිකිළි පහසුකම්, නිවැසියන් සතු භාණ්ඩ, ගම්මුන්ගේ සෞඛ්‍ය තත්ත්වය, ගම්මානයේ යටිතල පහසුකම් යනාදී කරුණු ගැන අවධානය යොමු කරන ලදී.

### 4.1 නිවාස අයිතිය

හප්පාවර ග්‍රාමයේ සමීක්ෂණයට ලක් කළ සියළුම පවුල්වලට කුමන ආකාරයක හෝ නිවාසයක් ඇත. නමුත් මෙම නිවාස විවිධ මට්ටමේ පවතින ඒවා විය. මෙම නිවාසවල තත්ත්වය 4.1 වගුව මගින් විස්තර කරයි.

**වගුව 4.1 - නිවාසවල තත්ත්වය**

| නිවාසවල තත්ත්වය | නිවාස ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ස්ථිර නිවාස | 31 | 49.2 |
| අර්ධ ස්ථිර නිවාස | 26 | 41.3 |
| තාවකාලික | 6 | 9.5 |
| එකතුව | 63 | 100 |

නිවාස වල තත්ත්වය ස්ථිර, අර්ධ ස්ථිර හා තාවකාලික ලෙස ගත් කල ගම්මානයේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 49% කට පමණ ස්ථිර නිවාස ඇත. ගම්මානයේ ජීවත් වන පවුල් වලින් 51% කටම ඇත්තේ අර්ධ ස්ථිර හා තාවකාලික නිවෙස්ය. මෙම නිවෙස්වල අයිතියේ ස්වභාවය පහත වගුව 4.2 ආශ්‍රිතව විස්තර කළ හැක.

**වගුව 4.2 - නිවාසවල අයිතියේ ස්වභාවය**

| අයිතියේ ස්වභාවය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| තනි අයිතිය | 37 | 58.7 |
| හවුල් අයිතිය | 02 | 3.2 |
| බදු/කුළී | 01 | 1.6 |
| අනවසර | 23 | 36.5 |
| එකතුව | 63 | 100 |

ගම්මානයේ පවුල් වලින් පවුල් 59% කට පමණ තනි අයිතියට නිවාස ඇත. හප්පාවර ග්‍රාමයේ පවුල්වලින් 37% ක් පමණ අනවසර ඉඩම්වල ගොඩනගා ගත් නිවාස වල ජීවත් වේ. මෙම ඉඩම් රජයට අයත් වේ. මේ සඳහා මේ වන තෙක් ඔප්පු ලබාදී නොමැත. මෙම ගම තුළ බදු/කුළී ගෙවල්වල ජීවත්වන පවුල් ප්‍රමාණය පවුල් 1.6% පමණ

වන අතර 3.2% ක පමණ පවුල් ප්‍රමාණයක් හවුල් අයිතිය සහිත ගෙවල්වල ජීවත් වේ. අනවසර ඉඩම්වල නිවාස තනාගත් පිරිසට මෙම ඉඩම් අයිතිය පිළිබඳ විශාල ගැටළුවක් ඇත.

## 4.2 නිවාසවල තත්ත්වය

හප්පාවර ගම්මානයේ සමීක්ෂණයට ලක්කල පවුල් 63 ටම ස්ථිර, අර්ධ හා තාවකාලික වශයෙන් නිවාස හිමිකමක් ඇත. මෙම නිවාසවල වහලවල් ස්වභාවය, බිත්තිවල ස්වභාවය හා ගෙබිමේ ස්වභාවය අධ්‍යයනයේදී අවධානයට යොමු කරන ලදී. මෙහිදී සමහර ගෙවල්වල වහලය උළු සහ ටකරන් යන දෙකම සෙවිලි කර ඇති අවස්ථාවක වැඩිපුර සෙවිලි කර ඇති දේ වහල සෙවිලි කළ ද්‍රව්‍ය ලෙස සළකා තොරතුරු ලබා ගන්නා ලදී.

**වහලයේ ස්වභාවය**

**වගුව 4.3 - වහලයේ ස්වභාවය අනුව නිවාස වර්ගීකරණය**

| වහල සෙවිලි | නිවෙස් ගණන |
|---|---|
| උළු/ඇස්බැස්ටෝස් | 52 |
| ටකරන් | 05 |
| පොල් අතු | 06 |
| එකතුව | 63 |

ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සමීක්ෂණයට ලක්කළ පවුල් 63ට අයත් නිවාස වලින් 82% ක්ම උළු/ඇස්බැස්ටස් සෙවිලිකර ඇත. ටකරන් සෙවිලි කර ඇති නිවාස සංඛ්‍යාව 8% ක් වන අතර, පොල්අතු සෙවිලි කල නිවාස 10% ක් ගම්මානයේ දක්නට ලැබේ.

**බිත්තිවල ස්වභාවය**

**වගුව 4.4 - බිත්තිවල ස්වභාවය අනුව නිවාස වර්ගීකරණය**

| බිත්තියේ ස්වභාවය | නිවෙස් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ගඩොල් / සිමෙන්ති ගල් | 43 | 69 |
| වෙනත් ගල් | 10 | 16 |
| වරිච්චි | 06 | 10 |
| ලෑලි | 04 | 05 |
| එකතුව | 63 | 100 |

ගම්මානයේ නිවෙස්වල බිත්ති සකස් කර ඇති ආකාරය ඉහත 4.4 වගුවේ දක්වා ඇත. මෙම ගම්මානය පාරම්පරිකව පැවතඑන කෘෂිකර්මාන්තය හොඳින් සිදු කරන ගමක් නිසා ගැමියන් අපහසුතා මැද තම නිවාස හැකි උපරිම අයුරින් සකස් කර ගැනීමට වෙහෙස වී ඇත. මේ අනුව ගම්මානයේ නිවෙස් වලින් වැඩි කොටසක් සිමෙන්ති ගඩොල් හා අනෙකුත් ගඩොල් ආශ්‍රිතව බිත්ති ගොඩනගා ඇත. නමුත් ගම්මානයේ පවුල් වලින් 10% ක් පමණ වරිච්චි බිත්ති සහිත නිවෙස් වලද 5% ලෑලි ගසන ලද බිත්ති සහිත නිවෙස්වලද ජීවත් වේ. සාමාජ

ආර්ථික මිම්මක් ලෙස නිවාස වල තත්ත්වය ගෙන බැලීමේදී පැහැදිලි වන්නේ ගම්මානයේ ජීවත්වන පවුල්වලින් සැළකිය යුතු පිරිසක් පහළ සමාජ ආර්ථික තත්ත්වයක ජීවත්වන බවයි.

**වගුව 4.5 - ගෙබිම අනුව නිවෙස් වර්ගීකරණය**

| ගෙබිමේ ස්වභාවය | නිවෙස් ගණන |
|---|---|
| සිමෙන්ති | 34 |
| ටෙරාසෝ | 01 |
| ගොම මැටි | 28 |
| එකතුව | 63 |

හප්පාවර ග්‍රාමයේ නිවෙස්වල ගෙබිම සකසා ඇති ආකාරය විශ්ලේෂණය කළ විට පෙනී යන්නේ ද නිවෙස් වලින් 54% කටම සිමෙන්ති දමා ඇති බවයි. ටෙරාසෝ ඇල්ලූ එක් නිවසක් ගම්මානයේ දක්නට ලැබේ. ගොමමැටි ගෙබිම සහිත නිවෙස් 45% ක් පමණ ගම තුළ දක්නට ලැබේ.

සමීක්ෂණයට අනුව හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හප්පාවර ග්‍රාමයේ නිවාස වල විශාලත්වය හා එම නිවෙස්වල ඇති කාමර ගණන පහත 4.6 හා 4.7 වගු මගින් විස්තර කළ හැක.

**නිවෙස්වල විශාලත්වය**

**වගුව 4.6 විශාලත්වය අනුව නිවාස වර්ගීකරණය**

| නිවසේ විශාලත්වය වර්ග අඩි | ගෙවල් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| වර්ග අඩි 100 ට අඩු | 03 | 4.8 |
| 100-250 | 12 | 19 |
| 250-500 | 19 | 30.2 |
| 500-750 | 17 | 27 |
| 750-1000 | 04 | 6.3 |
| 1000-1500 | 07 | 11.1 |
| 1500 ට වැඩි | 10 | 1.6 |
| එකතුව | 63 | 100 |

ගම්වැසියන්ගෙන් 5% ක පමණ පිරිසක් වර්ග අඩි 100 ට වඩා අඩු විශාලත්වයක් සහිත නිවෙස් වල ජීවත් වේ. මෙම පිරිස ගේ ආර්ථික මට්ටම ඉතා අඩු තත්ත්වයක ඇති බව පෙනීයයි. ඉහත වගුවට අනුව 33% කට වැඩි පිරිසකගේ නිවෙස්වල විශාලත්වය වර්ග අඩි 500-1000 ත් අතර වේ. මෙයින් පෙනී යන්නේ ගම්මානයේ ගම්මුන්ගෙන් 1/3 කට පමණ මධ්‍යම මට්ටමේ ආර්ථික තත්ත්වයක් ඇති බවයි.

මෙම ගෙවල්වල අඩංගු කාමර ප්‍රමාණය සමීක්ෂණයෙන් ලැබුණු තොරතුරු මත වගුව 4.7 ආශ්‍රිතව විස්තර කළ හැක.

වගුව 4.7 කාමර සංඛ්‍යාව අනුව නිවාස වර්ගීකරණය

| නිවසේ කාමර ගණන | ගෙවල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 0 | 3 | 4.8 |
| 1 | 8 | 12.7 |
| 2 | 10 | 15.9 |
| 3 | 7 | 11.1 |
| 4 | 14 | 22.2 |
| 5 | 13 | 20.6 |
| 6 | 3 | 4.8 |
| 7 | 2 | 3.2 |
| 8 | 1 | 1.6 |
| 10 | 1 | 1.6 |
| වාර්තා නොවූ | 1 | 1.6 |
| එකතුව | 63 | 100 |

වෙන් වූ එකදු කාමරයක්වත් නොමැති නිවාසවල 5% ක පමණ ගම්වැසියන් ප්‍රමාණයක් හප්පාවර ග්‍රාමය තුළ ජීවත් වේ. මෙම නිවාස ඉතා කුඩා පැල්පත් ලෙස හඳුනාගත හැකිය. ඉහත 4.7 වගුවට අනුව ගම්මානයේ නිවෙස්වලින් 22% ක පමණ නිවෙස් වල කාමර 04 ක් දක්නට ඇත. මෙම ගම්මානය තුළ කාමර 10 ක් සහිත එක් නිවසක්ද ඇත. මෙයින් පැහැදිලි වන්නේ ගම්මානයේ ඉතා දුප්පත් මෙන්ම සැළකිය යුතු ආදායමක් ලබන පිරිසක්ද ජීවත්වන බවයි.

ඉහතින් විස්තර කළ නිවෙස් වල මුළුතැන් ගෙයි ස්වභාවයද අධ්‍යයනයේදී සැළකිල්ලට ගනු ලැබීය. මුළුතැන්ගෙය වෙනම කාමරයක් තුළ පිළිවෙලකට තබා ගැනීම අධ්‍යයනයට ලක්කිරීමෙන් ගම්මානයේ සමාජ ආර්ථික තත්ත්වය ගැන අදහසක් ලබාගත හැකි විය. ඒ අනුව හප්පාවර ගම්මානයේ ගෙයින් පිටත වෙනම මුළුතැන් ගෙවල් පිහිටා තිබෙන නිවෙස් ප්‍රමාණය 22% ක් වන අතර, ගෙයි තුළ වෙනම කාමරයක තිබෙන මුළුතැන්ගෙවල් තිබෙන නිවාස 55% ක්ද වේ. මෙයින් පෙනියන්නේ ගම්මුන්ගේ නිවාසවල වැඩි ප්‍රමාණයක වෙන් වූ මුළුතැන්ගෙයක් ඇති බවයි. මෙය සෞඛ්‍යමය වශයෙන්ද ඉතා හිතකර තත්ත්වයකි. ගම්මානයේ නිවෙස් 22% ක මුළුතැන්ගෙය වෙනම වෙන් නොවූ කාමරයක පිහිටා ඇත. මෙමගින් පෙනී යන්නේ මෙම පිරිස ආර්ථිකව අපහසුකම් සහිතව ජීවත් වන බවයි.

## 4.3 නිවාසවලට ඇති පහසුකම්

### 4.3.1 මාර්ග පහසුකම්

යම් කිසි ප්‍රදේශයක ජීවත්වන ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් තිබීම තුලින් පහසුකම් සහිත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව සැළසේ. එමගින් අධ්‍යාපනය, සෞඛ්‍යය ආදී සියළුම සමාජ කටයුතු මෙන්ම ආර්ථික කටයුතුවලට ද පහසුකම් සැළසේ. සමීක්ෂණයට අනුව හප්පාවර ගම්මානයේ නියැදි නිවෙස් වලින් 30% ක පමණ නිවෙස් කරා මෝටර් රථයකින් නිවස අසළටම යා හැකිය. ඉතිරි 70% කගේම නිවෙස් වලට මෝටර් රථයකින් නිවස අසළටම

ගමන් කළ නොහැක. මෙම නිවෙස්ලට මෝටර් රථයකින් ගමන් කළ හැකි ආසන්නම දුර පහත 4.8 වගුව ආශ්‍රිතව විස්තර කළ හැක.

**වගුව 4.8 ගම්මානයේ නිවෙස්වලට වාහනයකින් යාහැකි ආසන්නම දුර**

| යාහැකි ආසන්නම දුර මීටර් | නිවෙස් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| මීටර් 50 ට අඩු | 24 | 38 |
| 50-100 | 07 | 11 |
| 100-250 | 15 | 24 |
| 250-500 | 5 | 8 |
| 500-750 | 4 | 6 |
| 750-1000 | 2 | 3 |
| 1000 ට වැඩි | 6 | 10 |
| එකතුව | 63 | 100 |

ඉහත තොරතුරු අනුව පෙනී යන්නේ ගම්මානයේ පවුල්වලින් 19% කගේම නිවෙස් කරා යැමට මීටර් 500 කට වඩා වැඩි දුරක් පයින් ඇවිද යා යුතු බවයි. මෙම නිවෙස්වලට මෝටර් රථයකින් ගමන් කිරීමට නොහැකි වී ඇත්තේ විධිමත් ලෙස සකස් කළ මාර්ග පද්ධතියක් ගම්මානය තුල දක්නට නොලැබීමයි. මෙමගින් ගම්මානයේ දරුවන්ගේ අධ්‍යාපනයට සෞඛ්‍යයට සහ අනෙකුත් සියළු සාමාජික සහ ආර්ථික කටයුතුවලට බාධා පැමිණේ.

### 4.3.2 විදුලි බලය

ගම්මානයේ නිවෙස්වලට ඇති විදුලි බල පහසුකම් ගැන සළකා බැලීමේදී 22% (නිවෙස් 14) කට පමණක් විදුලි බල පහසුකම් ඇත. මේ අතරින් සූර්ය කෝෂ මඟින් විදුලිය සපයා ගෙන ඇති පිරිස 07 දෙනෙකි. ඉතිරි නිවෙස් 07 කට පමණක් විදුලි බල රැහැන් උපයෝගී කරගෙන විදුලි බලය ලබාගෙන ඇත. සමීක්ෂණයට අනුව 78% කගේම නිවෙස් වලට විදුලි බලය නොමැත. විදුලි බල පහසුකම් ලබාගෙන ඇති නිවෙස් 07 විදුලි බල පහසුකම් ලබාගෙන ඇත්තේ හප්පාවර ග්‍රාමයට උතුරින් පිහි ඇති ඇඳිරිබැද්ද ග්‍රාමයේ ඇති විදුලි රැහැන් සහ කනු උපයෝගී කරගෙනය. මෙයින් පෙනී යන්නේ හප්පාවර ගම්මානය ආශ්‍රිතව විදුලි බලය ලබාදීමේ වැඩ පිළිවෙළක් සකස්කර නොමැති බවයි.

විදුලි බල පහසුකම් ගම්මානයේ නිවෙස්වලට පහසුවෙන් ලබාගත හැකිද යන්න සමීක්ෂණය කිරීමේදී පහත කරුණු අනාවරණය විය.

වගුව 4.9 ආසන්නම විදුලි රැහැන් කණුවට ඇති දුර

| ආසන්නම කණුවට ඇති දුර (මීටර්) | පවුල් ගණන |
|---|---|
| වාර්තා ගත නොවූ | 40 |
| 0-25 | 1 |
| 25-50 | 1 |
| 50-100 | 2 |
| 100-200 | 2 |
| 200-400 | 1 |
| 600 ට වැඩි | 2 |
| එකතුව | 49 |

විදුලි බලය රහිත නිවෙස් 49 සඳහා ආසන්නම කණුවට ඇති දුර ප්‍රමාණය වගුව 4.9 යේ දැක්වේ. මෙහි දුර මීටර් 0-600 දක්වා දුරකින් ආසන්නම කණුව පිහිටා ඇති නිවෙස් ප්‍රමාණය නිවෙස් 9 කි. ඉතිරි නිවෙස් 40 වම ආසන්න කණුව කොපමණ දුරකින් පිහිටා තිබේදැයි නොදනී. මෙම පවුල් 40ම විදුලි බලය ලබා නොගැනීමට හේතුව ලෙස දක්වා ඇත්තේ ගම්මානයට විදුලි බලය පහසුකම සපයා නොමැති වීමයි. විදුලි බලය ලබාගත හැකි වුවත් ආර්ථික අපහසුතා නිසා විදුලි බලය ලබාගෙන නොමැති නිවෙස් 07 ක් හප්පාවර ගම තුළ ඇත. මීට අමතරව ස්ථිර නිවසක් නොමැතිකමින්ද සමහර පුද්ගලයින් විදුලි බලය ලබා නොගන්නා බව සඳහන් කරයි.

### 4.3.3 දුරකථන පහසුකම්

නවීන තාක්ෂණයේ දියුණුවත් සමග ශ්‍රී ලංකාව තුළ දැනට ජංගම හා රැහැන් දුරකථන පහසුකම් ව්‍යාප්ත වී ඇත. එහෙත් සමීක්ෂණයට අදාල තොරතුරු අනුව ගම්මානය තුළ එකදු රැහැන් දුරකථනයක්වත් නොමැත. ඒ සඳහා අවශ්‍ය පහසුකම්ද සපයා නොමැත. නමුත් ගම්මානය තුළ මේ වන විට ජංගම දුරකථන සහිත නිවෙස් 03 ක් හඳුනාගත හැක.

## 4.4 බල ශක්ති භාවිතය සඳහා පහසුකම්

ගම්මානයේ ජනතාව ආහාර පිසීම සඳහා බල ශක්ති ප්‍රභේදයක් ලෙස 96% ක්ම භාවිතා කරන්නේ දරය. හප්පාවර ගම්මානය ආශ්‍රිතව රක්ෂිත වනාන්තර හා ලඳු කැළෑ සහිත භූමි ප්‍රදේශයන් බහුලව පිහිටා ඇත. එම නිසා ගම්මානයේ ජනතාවට පහසුවෙන් දර ලබා ගත හැක. මීට අමතරව සමීක්ෂණයට ලක් කළ පවුල්වලින් එක් පවුලක් ගෑස්ද, තවත් පවුලක් භූමිතෙල්ද ආහාර පිසීම සඳහා ඉන්ධන ලෙස ප්‍රධාන වශයෙන් භාවිතා කරන බවට වාර්තා වුණි.

## 4.5 පානීය ජල පහසුකම්

හප්පාවර ගම්මානයේ බීමට සහ නෑමට ජලය ලැබෙන ජල ප්‍රභවයන්ද ඒවායේ ගුණාත්මක භාවයන් පිළිබඳවද සමීක්ෂණයේදී තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව ගැමියන් පානීය ජල පහසුකම් සපුරා ගන්නා ආකාරය පහත පරිදි විස්තර කළ හැක.

**වගුව 4.10 - පානීය ජල පහසුකම්**

| ජල ප්‍රභවය | වැසි කාලයේදී | | වියළි කාලයේදී | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| තමාගේ ළිඳ | 8 | 12.7 | 6 | 9.5 |
| පොදු ළිඳ | 3 | 4.8 | 7 | 11.1 |
| අසල්වැසි ළිඳ | 1 | 1.6 | 7 | 11.1 |
| පොදු නල ජලය | 39 | 61.9 | 35 | 55.6 |
| ප්‍රජා ජල සම්පාදන | 3 | 4.8 | 2 | 3.2 |
| ඇල/දොළ/ගංගා | 8 | 12.7 | 2 | 3.2 |
| වෙනත් | 1 | 1.6 | 4 | 6.3 |
| එකතුව | 63 | 100 | 63 | 100 |

හප්පාවර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පානිය ජල පහසුකම් පිළිබඳ සළකා බැලීමේදී වැසි සහිත කාල වලදී මෙන්ම වියළි කාලයේදීත් වැඩි (55%-62%) පවුල් සංඛ්‍යාවක් පානීය ජලය ලබාගන්නේ පොදු නල ජලය මගිනි. ඉතිරි පවුල් ප්‍රමාණය විවිධ ප්‍රභව වලින් තම පානීය ජල අවශ්‍යතා සපුරා ගනී. තමාගේම ළිඳෙන් 12.7% ක පවුල් ප්‍රමාණයක් බීමට ජලය ලබාගත්තත් මෙම ප්‍රමාණය වියළි කාලයේදී 9.5% දක්වා අඩුවේ. පොදු ළිං, අසල්වැසි ළිං හා අනෙකුත් ජල යෝජනා ක්‍රම මගින්ද හප්පාවර ග්‍රාමයේ ජනතාව පානිය ජලය ලබා ගනී. පවුලේ සෞඛ්‍ය තත්ත්වය මෙන්ම එදිනෙදා කටයුතු පහසු වීමට යම් නිවසකට ජල පහසුකම තිබිය යුතුමය. මෙම ගම්මානයේ සමීක්ෂණයට ලක් කළ නිවෙස්වලින් නිවාස 08 කට පමණක් මෙම ජල පහසුකම් ඇත. මෙම පහසුකම් වියළි කාලයේදී ලැබෙන්නේ නිවාස 06කට පමණි.

**වගුව 4.11 - ජල පහසුකම් (නෑමට)**

| ජල ප්‍රභවය | වියළි කාලය | | වැසි කාලය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| තමාගේ ළිඳ | 07 | 11.1 | 04 | 6.3 |
| පොදු ළිඳ | 07 | 11.1 | 15 | 23.8 |
| අසල්වැසි ළිඳ | 0 | 0 | 03 | 4.4 |
| පොදු නල ජලය | 04 | 6.3 | 0 | 0 |
| ප්‍රජා ජල සම්පාදනය | 03 | 4.8 | 02 | 3.2 |
| ඇළ/දොළ/ගංගා | 41 | 65.1 | 29 | 61.9 |
| වෙනත් | 01 | 1.6 | 0 | 0 |
| එකතුව | 63 | 100 | 63 | 100 |

හප්පාවර ගම්මානයේ පවුල්වලින් 60-65% අතර ප්‍රමාණයක් වියළි කාලයේදීත් වැසි කාලයේදීත් ස්නානය සිදු කරන්නේ ඇළ, දොළ, ගංගා ආශ්‍රිතවය. ඊට අමතරව පොදු ළිඳෙන් ගම්මානයේ මුළු පවුල්වලින් වියළි කාලයේ 11% ක්ද වැසි කාලයේ 24% ක්ද ස්නානය කරනු ලබයි. ගම්මානයේ අනෙක් පිරිස තමාගේ ළිඳ, අසල්වැසි ළිඳ, ප්‍රජා ජල සම්පාදනය සහ වෙනත් ජල ප්‍රභවයන් උපයෝගී කරගෙන ස්නානය කෙරේ.

**ජල ප්‍රභවයන් සඳහා නිවසේ සිට ඇති දුර**

වගුව 4.11 - ජල ප්‍රභවයන් සඳහා ඇති දුර

| දුර ප්‍රමාණය | නිවෙස් ගණන | |
|---|---|---|
| | වියළි කාලයේදී | වැසි කාලයේදී |
| සඳහන් නොවන | 0 | 52 |
| 0-1/4 km | 50 | 2 |
| 1/4 –1/2 km | 03 | 1 |
| 3/4 –1km | 04 | - |
| එකතුව | 57 | 55 |

තමාටම ළිඳක් හෝ වෙනත් ජල ප්‍රභවයක් නොමැති අය වැසි කාලයේදී ජල ප්‍රභවවලට ප්‍රවේශ වීමට නිවසේ සිට ඇති දුර ගෘහ මූලික 52 කම සඳහන් කර නොමැත. නමුත් ඉතිරි තිදෙනාගෙන් දෙදෙනෙකුට 0-1/4 km කට අධික දුරක් යා යුතුය. අනෙක් පවුල සඳහා ජලය ලබා ගැනීමට 1/4 -1/2 km අතර දුරක් යා යුතු වේ.

වියළි කාලයේදී ජලය තමාගේ ළිඳෙන් ලබා නොගන්නා පවුල්වලින් 88% ක්ම ජලය ලබා ගැනිම සඳහා 0-1/4 km දක්වා දුර ප්‍රමාණයක් ඇවිද යා යුතුය.

මෙම ගම්මානයේ පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ විමසීමේදී වැසි කාලයේදී 71% පමණ පවුල් පාවිච්චියට ගන්නා පානීය ජලය හොඳ තත්ත්වයේ පවතී. ඉතිරි 29%ක් පමණ බීමට නුසුදුසු තත්ත්වයේ ජලය පරිභෝජනය කෙරේ. මෙයින් පෙනී යන්නේ බීමට ගන්නා ජලය පිළිබඳ ගම්මානයේ ගැටළු පවතින බවයි. වියළි කාලයේදී ජලයේ ගුණාත්මකභාවය වැසි සහිත අවස්ථාවට වඩා හොඳය. එම අවස්ථාවේ 86%ක්ම පවුල් පිරිසිදු ජලය භාවිතයට ගනු ලබයි. ඉතිරි 14% ක පමණ පවුල් ප්‍රමාණයක් වියලි කාලයේදී බීමට ගන්නේ බීමට නුසුදුසු ජලය බව ගම්මුන්ගේ අදහසය.

මෙම තත්ත්වය යටතේ බීමට අවශ්‍ය පිරිසිදු ජලය ලබා ගැනීම සඳහා ගම්වැසියන් යෝජනා කරන්නේ සෑම දෙනාටම ප්‍රතිලාභ ලබාගත හැකි වන පරිදි පානීය ජල යෝජනා ක්‍රමයක් සකස් කිරීම කාලෝචිත බවය. එමෙන්ම දැනට ගමේ පවතින පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම මගිනුත් ඔවුන්ට පිරිසිදු ජලය ලබාගත හැකි බව ගම්මුන්ගේ මතයයි.

### 4.6 වැසිකිළි පහසුකම්

හප්පාවර ගම්මානයේ සමීක්ෂණයට ලක්කළ චුල් 63 අතුරින් පවුල් 03කට (5%) පමණ කිසිදු ආකාරයක වැසිකිළියක් නොමැත.

**වගුව 4.13 - ගම්මානයේ දැනට භාවිතා කරන වැසිකිළිවල ස්වභාවය**

| වැසිකිළියේ ස්වභාවය | පවුල් සංඛ්‍යව | ප්‍රතිශතය |
|---|---|---|
| ජල මුද්‍රිත | 43 | 68.3 |
| තාවකාලික | 08 | 12.7 |
| වල වැසිකිළි | 09 | 14.3 |
| වැසිකිළි නොමැත | 03 | 4.8 |
| එකතුව | 63 | 100 |

ගමේ පවුල්වලින් 68%ක් පමණ භාවිත කරන්නේ ජල මුද්‍රිත වැසිකිළි ඇත. මෙය ගම්මානයේ තාවකාලික වැසිකිළි භාවිතා කරන පවුල් 13% පමණ වෙසෙන අතර වල වැසිකිළි භාවිතා කරන පවුල් සංඛ්‍යාව 14% කි.

### 4.7 නිවෙස්වල ඇති ගෘහ උපකරණ හා බඩු බාහිරාදිය

සමීක්ෂණයේදී ගම්මානයේ සමාජ ආර්ථික තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා නිවෙස්වල ඇති බඩු බාහිරාදිය පිළිබඳවද සමීක්ෂණ තොරතුරු 4.14 වගුවෙන් දැක්වේ.

**වගුව 4.14 - ගෘහ උපකරණවල අයිතිය**

| භාණ්ඩයේ නම | භාණ්ඩ හිමි නිවෙස් ගණන | % | සංඛ්‍යාව |
|---|---|---|---|
| ඔරලෝසු | 62 | 98 | 76 |
| ප්‍රැටල් මැක්ස් | 14 | 22 | 14 |
| රේඩියෝ | 18 | 28 | 20 |
| කැසට් රේඩියෝ | 44 | 69 | 45 |
| රූපවාහිනී | 27 | 42 | 27 |
| අල්මාරි | 24 | 38 | 25 |
| පුටු කට්ටල | 42 | 66 | 47 |
| VCD/DVD | 01 | 1.5 | 01 |
| මහන මැෂින් | 14 | 22 | 14 |
| ගෑස් ලිප් | 01 | 1.5 | 01 |

සාමාන්‍යයෙන් නිවෙස්වල බහුලව භාවිතා කරන උපකරණ කිහිපයක් පිළිබඳව අවධානයට ලක්වූ අතර හප්පාවර ගමේ නිවාස වැඩි ප්‍රමාණයකට (98%) තිබූ භාණ්ඩ අතර ඔරලෝසුව ප්‍රධාන තැනක් ගනී.

ගම්මානයේ බොහෝ පවුල්වලට විදුලි බලය අහිමි වුවද පෙට්‍රල් මැක්ස් තිබෙන්නේ නිවෙස් 14 කට පමණි. හප්පාවර ගම්මානයේ පවුල්වලින් 43% කට පමණ රූපවාහිනී යන්ත්‍ර නොමැත. මෙම තොරතුරු අනුව ද පෙනී යන්නේ ගම්මානයේ ආර්ථික මට්ටම යහපත් තත්ත්වයක නොමැති බවයි.

### 4.8 ගමනාගමනය හා ප්‍රවාහනය සඳහා ඇති වාහන අයිතිය

යම් කිසි පවුලකට තමන්ට අයිති වූ වාහනයනක් තිබේ නම් ප්‍රවාහනය ඉතා පහසු වේ. හොඳ ආර්ථික මට්ටමක් ඇති පිරිස් තම ප්‍රවාහන කටයුතු සඳහා ඔවුන්ගේම වාහන තබා ගනී. හප්පාවර ගම්මානයේ ප්‍රවාහන පහසුකම් සඳහා ඔවුන් සතුව ඇති වාහන වල අයිතිය පහත පරිදි විස්තර කළ හැක.

**වගුව 4.15 - වාහනවල අයිතිය**

| වාහනය | සංඛ්‍යාව |
|---|---|
| පාපැදි | 09 |
| යතුරු පැදි | 02 |
| ත්‍රී වීලර් | 01 |
| එකතුව | 12 |

ගම්මානයේ ඇති පාපැදි ප්‍රමාණය සමීක්ෂණයට අනුව 09 ක් වේ. ගම්මානයේ පවුල්වලට හිමි යතුරු පැදි ප්‍රමාණය දෙකක් වන අතර ත්‍රී වීලර් 01 ක් ඇති බව සමීක්ෂණයේදී හෙළි විය. මේ අනුව පෙනී යන්නේ හප්පාවර ගම්මානයේ ජනතාවගෙන් වැඩි ප්‍රමාණයක් පොදු ප්‍රවාහන සේවා උපයෝගී කරගෙන තම ප්‍රවාහන කටයුතු සිදු කර ගන්නා බවය. කඳුකර ප්‍රදේශයන් නිසා පාපැදි භාවිතයද ඉතා අඩු තත්ත්වයක පවතී. එසේම ක්‍රමවත් මාර්ග පද්ධතියක් ගම තුළ නොමැති වීම නිසා තමාට හැකි අයුරින් ප්‍රවාහන උපකරණ මිලදී ගැනීමට ගැමියන් උනන්දුවක් නොදක්වයි.

### 4.9 කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර

කෘෂිකර්මය ප්‍රධාන ජීවන වෘත්තිය කරගෙන ජීවිකාව ගෙනයන හප්පාවර ගම්මානයේ ජනතාව සතුව ඇති කෘෂිකාර්මික උපකරණවල අයිතියද සමීක්ෂණයට භාජනය කරන ලදී.

වගුව 4.16 - ගම තුළ ඇති කෘෂි කාර්මික උපකරණ

| කෘෂිකාර්මික උපකරණ | ගණන | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|
| උදළු | 59 | 125 | 61.5 |
| ලී නගුල් | 18 | 19 | 18.8 |
| දියර ඉසින යන්ත්‍ර | 19 | 19 | 19.8 |
| එකතුව | 96 | 163 | 100 |

ඉහත 4.16 වගුව අනුව පෙනි යන්නේ හප්පාවර ගම්මානයේ ට්‍රැක්ටර්, කොළමඩින යන්ත්‍ර ආදී විශාල කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර නොමැති බවයි. නමුත් පරම්පරිකව පැවත එන ආකාරයට සම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු සිදු කිරීමට අවශ්‍ය කෘෂි උපකරණ ඇති බව පෙනි යයි. ගම්මානයේ ඇති කෘෂි උපකරණවලින් සුලභම උපකරණය උදැල්ලයි. ලී නගුල් 19% ක් සහ දියර ඉසින යන්ත්‍ර 19% ක් ගම්මානයේ ඇත. තවමත් හප්පාවර ගම්මානයේ ගොවීන් කෘෂිකාර්මික කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍ර උපයෝගී කර නොගනී. ගොවීන් සී සෑම සිදු කරන්නේ ලී නගුල් උපයෝගී කරගෙනය. නවීන ක්‍රම උපයෝගි කරගෙන කෘෂිකාර්මික කටයුතු සිදු කිරීමට ඇති තවත් බාධාවක් වන්නේ ගම්මානය කඳුකර පෙදෙසක පිහිටා ඇති නිසා කුඹුරු ඉඩම් හෙල්මළු ආකාරයට පිහිටා තිබීම ය. මේ තත්ත්වය යටතේ නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම තරමක් අපහසුය.

## 4.10 සෞඛ්‍ය තත්ත්වය

පසුගිය වසර දෙක තුළ පවුලේ සාමාජිකයන්ට වැළඳුන බෝවන රෝග පිළිබඳවද සමීක්ෂණය කරන ලදී, හප්පාවර ගම්මානයේ සමීක්ෂණයට ලක් කළ පවුල් 63 අතුරෙන් එක් පුද්ගලයෙකුට පමණක් පසුගිය වසර දෙක තුළ කහ උණ වැළඳී ඇත. මීට අමතරව පාචනය, පැපොල, ඩෙංගු, මැලේරියා ආදී බෝවන රෝග හා වසංගත රෝග පිළිබඳව පසුගිය වසර දෙක තුළ ගම්මානයෙන් වාර්තා වී නොමැත.

හප්පාවර ගම්මානයේ ජනතාව පුරුදු වී ඇති අයහපත් සෞඛ්‍ය පුරුදු සමීක්ෂණයේදී 4.17 වගුව පරිදි හෙළි විය.

වගුව 4.17 - ගම්මානයේ ජනතාවගේ අයහපත් සෞඛ්‍ය පුරුදු

| අයහපත් සෞඛ්‍ය පුරුදු | සංඛ්‍යාව |
|---|---|
| බුලත් කෑම | 48 |
| මත්පැන් බීම | 05 |
| දුම් බීම | 17 |

ගම්මානයේ පුරුද්දක් වශයෙන් බුලත් කෑමට ඇබ්බැහි වූ පුද්ගලයන් ගණන 48 කි. මෙය මුළු ජනගහනයෙන් 17% ක් පමණ වේ. සමීක්ෂණයට අනුව මත්පැන් බීමට ඇබ්බැහි වූ පුද්ගලයින් 05 ක් ගම්මානයේ ජීවත් වේ. ඊට

අමතරව පුරුද්දක් ලෙස දුම් බොන සංඛ්‍යාව 17 දෙනෙකි. ඉහත ඇබ්බැහිවීම් නිසා ගම්මානයේ ජනතාව ලෙඩ රෝගවලට භාජනය වීමේ ඉඩකඩ වැඩි අතර මෙමගින් පවුලේ ආර්ථිකයටද විශාල හානියක් සිදුවේ. ගම්මානයේ ජීවත් වන පවුල් ජලය උණුකර නිවා පානය කරන්නේද යන්න සමීක්ෂණය කිරීමේදී හෙළි වූයේ ගම්මානයේ පවුල්වලින් 71% ක්ම ජලය උණුකර පානය නොකරන බවයි. එසේම ඔවුන් ඒ සඳහා වැඩි අවධානයක් යොමු කර නොමැති බව පෙනී ගියේය.

ජලය උණු කර පාවිච්චියට නොගැනීම මගින් විවිධ බෝවන රෝගවලට ගම්මුන් ගොදුරුවීමේ ඉඩකඩ වැඩි වී ඇත. එමෙන්ම කුඩා දරුවන්ටද ජලය උණු කර බීමට පුරුදු කිරීම මගින් ලෙඩ රෝග වලට පහසුවෙන් ගොදුරු වීමේ ප්‍රවණතාවය අඩු කල හැක.

ගම්මානයේ පළතුරු අනුභවය කරන පවුල් ප්‍රමාණය 05ක් පමණ වේ. සමීක්ෂණයට අනුව ගම්මානයේ පවුල්වලින් 92% ක්ම පුරුද්දක් ලෙස පළතුරු අනුභවය නොකරයි. මෙය නිරෝගී ජන කණ්ඩායම් ඇති කිරීමට බාධාවකි.

### 4.11 ගමනාගමන හා සේවා යටිතල පහසුකම්

හප්පාවර ග්‍රාම නිලධාරී වසමට ප්‍රවේශවීමට ප්‍රධාන මාර්ග 02 ක් ඇත. මහනුවර සිට බදුල්ල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය ගමට පිවිසීමට ඇති එක් මාර්ගයක් වන අතර රිකිල්ලගස්කඩ සිට ලැමසූරිය හන්දිය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයෙන්ද ගමට පැමිණිය හැක. මහනුවර සිට බදුල්ල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයෙන් හොඳ තත්ත්වයේ ප්‍රවාහන පහසුකම් ලබාගත හැකි අතර රිකිල්ලගස්කඩ ලැමසූරිය මාර්ගයේ දිනකට ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ දෙකක් ධාවනය වේ. ගම්මානය තුළ දිවෙන පාර තාරදමා සකස් කල එකක් වන අතර එය කිලෝ මීටර 04 ක් දක්වා විහිදෙයි. හප්පාවර ගම්මානයේ ගමනාගමනය පහසුවන ලෙස තවත් තාර නොදැමූ කිලෝ මීටර1 1/2 දක්වා දිවෙන වෙනත් පාරක්ද ඇත.

වගුව 4.18 - ගමට සේවා සපයන ස්ථානවල පිහිටීම

| ආයතනයේ නම | පිහිටා ඇත්තේ | ගමේ සිට ඇති දුර කි.මී. |
|---|---|---|
| පාසල (0-11 වසර දක්වා) | ගම තුළ | - |
| උසස් පෙළ කලා විෂය ධාරාව ඇති පාසල | අඩිකාරිගම | 15 |
| උසස් පෙළ විද්‍යා විෂය ධාරාව ඇති පාසල | අඩිකාරිගම | 15 |
| සමුපාකාර ප්‍රාදේශිකය | අඩිකාරිගම | 15 |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | කරල්ලියද්ද | 17 |
| පශු වෛද්‍ය කාර්යාලය | රිකිල්ලගස්කඩ | 17 |
| කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය | රිකිල්ලගස්කඩ | 17 |
| තැපැල් හල | ගම තුළ | - |
| සියළුම බැංකු | රිකිල්ලගස්කඩ | 17 |
| ඩිස්පෙන්සරිය | රිකිල්ලගස්කඩ | 17 |
| රෝහල නැවතී ප්‍රතිකාර ගැනීමට | රිකිල්ලගස්කඩ | 17 |
| ආයුර්වේද ඩිස්පෙන්සරිය | අඩිකාරිගම | 15 |
| පුද්ගලික බටහිර වෛද්‍යවරයා | අඩිකාරිගම | 15 |
| සතිපොළ | රිකිල්ලගස්කඩ, හගුරන්කෙත | 17.23 |
| බස් නැවතුම | ගම තුළ | |
| ආගමික ස්ථානය | ඇඳිරිබැද්ද ග්‍රාමය | 2-3 |
| ළදරු පාසල | ගම | - |

හප්පාවර ග්‍රාමයේ ජනතාව ඔවුන්ගේ විවිධ අවශ්‍යතා සඳහා පැමිණෙන ආසන්නතම නගර වන්නේ රිකිල්ලගස්කඩ සහ හගුරන්කෙතයි. පිළිවෙලින් ඒ සඳහා ඇති දුර කිලෝ මීටර් 17 ක් සහ 23 ක් වේ.

හප්පාවර ගමේ ජනතාවට අවශ්‍ය සේවා සපයන ආයතනවලට ඇති දුර ප්‍රමාණයද සමීක්ෂණයට භාජනය කරන ලදී, ඒ අනුව ගම්මානයේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය ප්‍රාථමික පාසල (0-11 වසර) ගම්මානය තුළම පිහිටා ඇත. උසස් පෙළ හැදෑරීම සඳහා දරුවන් ගම්මානයෙන් පිටත යා යුතුය. උසස් පෙළ කලා/විද්‍යා විෂය ධාරාව හැදෑරීම සඳහා ගම්මානයේ සිට ආසන්නම පාසල පිහිටා තිබෙන්නේ අධිකාරිගමය. එය ගම්මානයේ සිට කි.මී. 15 ක් ඈතින් පිහිටා ඇත. ප්‍රාථමික පාසලට අමතරව ගම තුළ පිහිටා ඇත්තේ තැපැල් හල, බස් නැවතුම්පොළ හා ළදරු පාසලයි. මීට අමතරව මසකට එක් දිනක් කුඩා දරුවන් සඳහා සායන පැවැත්වීම ද ගම තුළ සිදුවේ.

ගොවිජන සේවා මධ්‍යස්ථානය, පශු වෛද්‍ය කාර්යාලය හා කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයද ගමේ සිට කිලෝ මීටර් 17 ක් පමණ දුරින් පිහිටා ඇත. සමෘද්ධි සහනාධාර සහ අනෙකුත් අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අවශ්‍ය සමුපකාර ප්‍රාදේශිකය පිහිටා තිබෙන්නේ ගමේ සිට කි.මී. 15 ක් දුරින් පිහිටි අධිකාරිගමය. සමුපකාර බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව ආදී බැංකු පහසුකම් ලබා ගැනීමට කි.මී. 17 ක් ඈතින් පිහිටි රිකිල්ලගස්කඩ නගරයට යා යුතුය. රෝගී අවස්ථාවලදී ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පුද්ගලික බටහිර වෛද්‍යවරයා හා ආයුර්වේද ඩිස්පෙන්සිරිය කි.මී. 15ක් ඈතින් අධිකාරිගම පිහිටා ඇත. මීට අමතරව නැවතී ප්‍රතිකාර ගැනීම සඳහා රජයේ රෝහල රිකිල්ලගස්කඩ නගරයේ කි.මී. 17 ක් දුරින් පිහිටා ඇත.

ගමේ ජනතාවට අවශ්‍ය පාරිභෝජන ද්‍රව්‍ය විකිණීම සහ මිලදී ගැනීම සඳහා අවශ්‍ය සති පොළ රිකිල්ලගස්කඩ සහ හගුරන්කෙත යන නගරවල පිහිටා ඇත. ඒවාට ඇති දුර පිළිවෙලින් කි.මී. 17 ක් සහ 23 ක් වේ. ගම්මානයේ ජනතාවට ආගමික කටයුතු සිදු කිරීමට ගමතුළ ආගමික ස්ථානයක් (පන්සලක්) නොමැත. ඒ සඳහා ගම්මානයේ සිට කි.මී. 2-3 අතර දුරක් යා යුතු වේ.

විදුලි බල පහසුකම් ලබාගැනීම සඳහා අවශ්‍ය වන විදුලි රැහැන් මේ වන තෙක් ගම්මානයට නොමැත. එමෙන්ම රැහැන් දුරකථන පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය දුරකථන රැහැන්ද ගම්මානය ආවරණය කර නොමැත. ගම්මානය තුළ ඇති වාරි ජල පහසුකම් ගැන සළකා බැලීමේදී ගමේ වැව් එකක් හා අමුණු දෙකක් පිහිටා ඇත. මෙම වැව් සහ අමුණු දැනට ප්‍රයෝජනයට ගන්නා මට්ටමේ ඇත.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත් පොහොර ගබඩා 01 ක් සහ පොදු සමිති ශාලාවක් ද ගම්මානයේ පිහිටා ඇත. මේවා දැනට ප්‍රයෝජනයට ගනී. පොදු සමිති ශාලාවේ ළදරු පාසලක්, ග්‍රාම නිලධාරී මහතාගේ නිල කාර්යාලය හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර මහතාගේ නිල කාර්යාලය පිහිටා ඇත. මීට අමතරව ගම්මානයේ ප්‍රයෝජනයට නොගන්නා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වාරි මාර්ග කම්කරු නිල නිවාසයක් පිහිටා ඇත.

## 4.12 ගමෙහි භෞතික සම්පත්

හප්පාවර ගම්මානය විවිධ භෞතික සම්පත්වලින් පොහොසත් ගම්මානයකි. මහවැලි ගග ආශ්‍රිතව වැලි සුලභවීම නිසා මේවා ගොඩ දැමීම තුළින් ගම්මානයේ ජනතාව හොඳ ආදායමක් උපයා ගනී. මීට අමතරව හුණුගල්, කළුගල් හා දැව ගම්මානයේ පිහිටා ඇති අනිකුත් භෞතික සම්පත්ය.

## පස්වන පරිච්ඡේදය

# ඉඩම් අයිතිය, බුක්තිය සහ සංවර්ධනය කිරීම

හප්පාවර ගම්මානයේ පවුල් බුක්ති විඳින ඉඩම් ප්‍රමාණය, ඒවා ගොඩ මඩ ලෙස පවතින ආකාරය, ඉඩම්වල භෞතික ස්වභාවය සහ ඒවායේ සංවර්ධනාත්මක පසුබිම මෙම පරිච්ඡේදය මගින් විස්තර කෙරේ.

### 5.1 බුක්ති විඳින ඉඩම්වල ප්‍රමාණය හා ස්වභාවය

හප්පාවර ගම්මානයේ සමීක්ෂණයට ලක්කළ පවුල්වලට අයිති මුළු ඉඩම් ප්‍රමාණය, ඒවා බුක්ති විඳින ආකාරය යනාදිය ගැන තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව පහත වගුව 5.1 හි දැක්වෙන ආකාරයට ඉඩම් ප්‍රමාණය හා ඒ ආශ්‍රිත තොරතුරු ඉදිරිපත් කෙරේ.

**වගුව 5.1 - ගම්මානයේ ඉඩම්වල පිහිටීම**

| ඉඩම් වර්ගය | ඉඩම් අයිති පවුල් සංඛ්‍යාව | ප්‍රමාණය (අක්කර) | මුළු ඉඩම් ප්‍රමාණයෙන් ප්‍රතිශතය |
|---|---|---|---|
| මඩ ඉඩම් | 54 | 42.11 | 30.8 |
| ගෙවතු | 57 | 70.15 | 51.4 |
| ගොඩ ඉඩම් | 11 | 16.00 | 11.7 |
| හේන් | 07 | 8.25 | 6 |
| එකතුව | 129 | 136.51 | 100 |

ගම්මානයේ සමීක්ෂණය කළ පවුල් 63 න් පවුල් 57 කට ගෙවත්තක් හිමිය. ඉතිරි නිවාස හය සඳහා ගෙවත්තක් නොමැති අතර, ප්‍රමාණයෙන් ඉතා කුඩා බිමක නිවස පමණක් ඉදිකර ඇත. මෙම ගෙහිමියන් ඔවුන්ගේ නිවෙස් සාදාගෙන ඇත්තේ ඔවුන්ට අයිති මඩ (කුඹුරු) ඉඩමේමය. ගම්මානයේ ඇති මුළු ඉඩම්වලින් 51% ක්ම ඇත්තේ ගෙවතු ඉඩම්ය. එම ප්‍රමාණය අක්කර 70 ක් පමණ වේ.

හප්පාවර ගම්මානයට අයත් මුළු ඉඩම් ප්‍රමාණයෙන් 30% ක් පමණ කුඹුරු ඉඩම් බව සමීක්ෂණයේ තොරතුරු අනුව පැහැදිලි වේ. ගම්මානයේ සමීක්ෂණය සිදු කළ පවුල්වලින් පවුල් 11 කට පමණක් ගෙවත්තට අමතරව ගොඩ ඉඩම් අක්කර 16 ක් පමණ අයිති වී තිබේ. මීට අමතරව හප්පාවර ගම්මානයේ මහ කන්නයේදී හේන් වගාව සිදු කරයි. ගම්මානයේ පවුල් 7 කට ඔවුනට අයිති හේන් අක්කර 8.25 ක ඉඩම් ප්‍රමාණයක් ඇති බව සමීක්ෂණයෙන් හෙළි වී ඇත. ගම්මානයට අයිති ගොඩ ඉඩම්, මඩ ඉඩම් හා හේන් යන ඉඩම් හප්පාවර ගම්මානය තුළ හා ගම්මානයෙන් පිටත ලෙස පිහිටා ඇත. මුළු ඉඩම් ප්‍රමාණයෙන් 3% ක පමණ ප්‍රමාණයක් ගම්මානයෙන් පිටත පිහිටා ඇත. නමුත් හේන් ඉඩම් ප්‍රමාණය සළකා බැලීමේදී මුළු හේන් ඉඩම් ප්‍රමාණයෙන් 25% ක් පමණ ගම්මානයෙන් පිටත පිහිටා ඇත.

හප්පාවර ග්‍රාම නිලධාරී වසමට අයත් පවුල් බුක්ති විඳින සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය ගොඩ, මඩ, හේන් යනාදී විවිධ ඉඩම්වලට වෙන වෙනම අගයන් ගනී. ගම්මානයේ ඉඩම් හිමි පවුලක් බුක්ති විඳින සාමාන්‍ය මඩ ඉඩම් ප්‍රමාණය අක්කරයකටත් වඩා අඩුය. එම ප්‍රමාණය අක්කර 0.78 ක් පමණ වේ. එක් පවුලක් බුක්ති විඳින ගෙවත්ත ආශ්‍රිත සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය අක්කරයකට වඩා වැඩිය. එම ප්‍රමාණය අක්කර 1.23 ක් පමණ වේ. ගම්මානයේ ගොඩ ඉඩම් බුක්තියේ සාමාන්‍ය ප්‍රමාණය අක්කර 1.45 ක් පමණ වේ. හේන් වගා කරන ගොවීහු සාමාන්‍යයෙන් අක්කරයක පමණ භූමි ප්‍රමාණයක් භුක්ති විඳිති.

## 5.2 බුක්ති විඳින ඉඩම්වල අයිතිය හා බුක්තියේ ස්වභාවය

සමීක්ෂණයේදී ගම්මානයේ පවුල් විවිධ ඉඩම් පරිහරණය කරන ආකාරය, ඒවායේ විවිධ අයිතීන් සහ බුක්ති විඳීම් ගොඩ, මඩ, ගෙවත්ත, හේන ආදී වශයෙන් වෙන වෙනම තොරතුරු රැස් කරන ලදී.

හප්පාවර ගම්මානයේ මඩ ඉඩම් ප්‍රමාණය හා ඒවායේ අයිතීන් හා බුක්තීන් පහත දැක්වෙන 5.2 වගුව ඇසුරින් විස්තර කළ හැක.

**වගුව 5.2 - මඩ ඉඩම් බුක්තියේ ස්වභාවය හා ඒවායේ ප්‍රමාණ**

| බුක්තියේ ස්වභාවය | අක්කර 0-1/4 | අක්කර 1/4-1/2 | අක්කර 1/2-1 | අක්කර 1-2 | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| තනි අයිතිය | 08 | 06 | 07 | 02 | 23 | 42.6 |
| කට්ටි මාරු | 01 | 01 | 0 | 01 | 3 | 5.6 |
| අනවසර | 02 | 08 | 09 | 05 | 24 | 44.4 |
| අඳයට ගත් | 0 | 0 | 01 | 01 | 02 | 3.7 |
| බද්දට ගත් | 0 | 01 | 01 | 0 | 02 | 3.7 |
| එකතුව | 11 | 16 | 18 | 09 | 54 | 100 |

හප්පාවර ග්‍රාම නිලධාරී වසමේ සමීක්ෂණය කළ පවුල් 63 අතුරින් කුමන ආකාරයක හෝ මඩ ඉඩම් බුක්ති විඳින පවුල් සංඛ්‍යාව 54 කි. මෙම මඩ ඉඩම් වලින් තනි අයිතිය ඇති ගොවීන් සංඛ්‍යාව ඉඩම් බුක්ති විඳින්නන්ගෙන් 43% ක් පමණි. ගමෙහි ඉතිරි පවුල් 57% ටම තනි අයිතිය ඇති ඉඩම් නොමැත. තනි අයිතිය ඇති ඉඩම්වල විශාලත්වය සැළකූ විට අක්කරයට වඩා වැඩි මඩ ඉඩම් හිමි වන්නේ පවුල් දෙකකට පමණි. ඉතිරි පවුල් 21 කට අක්කරය හෝ අක්කරයට අඩු ඉඩම් තනි අයිතිය යටතේ ඇත. කට්ටිමාරු ක්‍රමයට මඩ ඉඩම් බුක්ති විඳින්නේ පවුල් තුනකි. මඩ ඉඩම් අඳයට ගෙන බුක්ති විඳින පවුල් 02 ක්ද බද්දට ගෙන බුක්ති විඳින පවුල් දෙකක්ද හප්පාවර ගම්මානයේ ඇති බව හෙළි විය. මීට අමතරව මෙම ගම්මානයේ වැඩි පිරිසක් එනම් 44% පමණ මඩ ඉඩම් බුක්ති විඳින්නේ අනවසර ඉඩම් ලෙසයි.

වගුව 5.3 - ගෙවත්තේ ප්‍රමාණය හා බුක්තියේ ස්වභාවය

| අයිතියේ ස්වභාවය | ඉඩම් ප්‍රමාණය (අක්කර) | | | | | | % |
|---|---|---|---|---|---|---|---|
| | <=1/4 | 1/4<=1/2 | 1/2<=1 | 1<=2 | 2<=5 | එකතුව | |
| තනි අයිතිය | 01 | 06 | 10 | 07 | 06 | 30 | 52.6 |
| කට්ටි මාරු | 0 | 01 | 01 | 01 | 01 | 02 | 3.5 |
| අනවසර (පෞද්ගලික) | 05 | 03 | 09 | 04 | 0 | 21 | 36.8 |
| අනවසර (රජයේ) | 01 | 01 | 0 | 0 | 0 | 02 | 23.5 |
| අඳයට ගත් | 01 | - | - | - | - | 01 | 1.8 |
| උකසට ගත් | 0 | 0 | 0 | 01 | 0 | 01 | 1.8 |
| එකතුව | 08 | 10 | 13 | 13 | 06 | 57 | 100 |

සමීක්ෂණය අනුව හප්පාවර ග්‍රාමයේ ගෙවත්තක් ඇති පවුල් සංඛ්‍යාව පවුල් 57 කි. එම පවුල් වලින් 53% ක්ම පමණක් එම ගෙවතුවල තනි අයිතිය ඇත. මෙසේ තනි අයිතිය ඇති පවුල්වලට අයත් ඉඩම්වලින් 56% ක්ම අක්කරයට අඩු ඉඩම් වේ. හප්පාවර ගම්මානයේ ගෙවතු ඉඩම් හිමි පිරිසෙන් 40% ක් පමණම තම නිවස ඉදිකර ඇත්තේ අනවසර ඉඩම්වලය. මෙම ඉඩම් රජයට හා පෞද්ගලික අංශයටද අයත් වූ ඉඩම්ය. මෙම ඉඩම්වල අයිතිය පිළිබඳ ගැටළුව ගම්මානයේ ජනතාවට ප්‍රබල ලෙස බලපායි.

වගුව 5.4 - ගොඩ ඉඩම්වල ප්‍රමාණය හා බුක්තියේ ස්වභාවය

| අයිතියේ ස්වභාවය | ඉඩම් ප්‍රමාණය (අක්කර) | | | | | % |
|---|---|---|---|---|---|---|
| | 0<=1/4 | 1/4<=1/2 | 1/2<=1 | 2<=5 | එකතුව | |
| තනි අයිතිය | 0 | 1 | 1 | 2 | 4 | 36.4 |
| කට්ටි මාරු | 0 | 0 | 0 | 1 | 1 | 9.1 |
| අනවසර (පෞද්ගලික) | 1 | 1 | 1 | 0 | 3 | 27.3 |
| අනවසර (රජයේ) | 0 | 1 | 0 | 1 | 2 | 18.2 |
| අඳයට ගත් | 0 | 1 | 0 | 0 | 1 | 9.1 |
| එකතුව | 1 | 4 | 2 | 11 | 11 | 100 |

ගම්මානයේ ගෙවත්තට අමතරව වෙනත් ගොඩ ඉඩම් ඇති මුළු පවුල් සංඛ්‍යාව 11 කි. එනම් මුළු පවුල්වලින් 17% ක් පමණය. තනි අයිතියට ගොඩ ඉඩම් ඇති පවුල් සංඛ්‍යාව ගොඩ ඉඩම් ඇති ප්‍රමාණයෙන් 36% ක් පමණ වේ. ගොඩ ඉඩම් ඇති පිරිසෙනුත් 45% ක් පමණ අනවසර ලෙස එම ඉඩම් බුක්ති විඳියි. හප්පාවර ගම්මානයේ පවුල් 07 ක් පමණක් හේන් ඉඩම් බුක්ති විඳින අතර මෙයින් 04 දෙනෙක්ම තම හේන් වගාවන් සිදු කරන්නේ අනවසර ඉඩම්වලයි. පවුල් 02 කට පමණක් මෙම හේන් ඉඩම්වල තනි අයිතිය ඇත. මෙම ගම්මානයේ එක් පවුලක් අඳ ක්‍රමය යටතේ හේන් වගාව සිදු කරනු ලබයි. මෙම හේන් ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් අක්කර 1/4 - 1/2 ත් අතර වේ.

හප්පාවර ගම්මානයේ එක් එක් පවුල්වලට අයත් ඉඩම් ප්‍රමාණයන් හා ඒවායේ අයිතිය ගොඩ මඩ ආදී වශයෙන් බෙදී ඇති අයුරු පහත 5.5 වගුව පරිදි සාරාංශ ගත කළ හැක.

**වගුව 5.5 - ගොඩ හා මඩ ඉඩම් ප්‍රමාණය වගාව අනුව බෙදී ඇති අන්දම**

| ප්‍රමාණය අක්කර | මඩ ඉඩම් | | ගෙවත්ත | | ගොඩ ඉඩම් | | හේන | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0<=1/4 | 11 | 20’4 | 08 | 14 | 01 | 9.1 | 01 | 14.3 |
| 1/4<=1/2 | 16 | 29 | 10 | 17.5 | 04 | 36.4 | - | - |
| 1/2<=1 | 18 | 33’3 | 20 | 35.1 | 02 | 18.2 | 05 | 71.4 |
| 1<=2 | 09 | 16’7 | 13 | 22.8 | - | - | - | - |
| 2<=5 | - | - | 06 | 10.5 | 04 | 36.4 | 01 | 14.3 |
| එකතුව | 54 | 100 | 57 | 100 | 11 | 100 | 07 | 100 |

ඉහත ප්‍රස්ථාරයට අනුව පෙනී යන්නේ ගම්මානයේ පවුල්වලින් වැඩි පිරිසකට මඩ ඉඩම්, ගොඩ ඉඩම්, ගෙවත්ත හා හේන යන වර්ගවල ඉඩම්වල අයිතිය හා බුක්තිය ඇත්තේ අක්කර 01 කට වඩා අඩු ප්‍රමාණයකි.

### 5.3 ඉඩම්වල භෞතික ස්වභාවය

මධ්‍යම කඳුකරයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඳුවැටි ආශ්‍රිතව හප්පාවර ගම්මානය පිහිටා ඇත. මෙම ගම්මානයේ ඇති ඉඩම් කඳු බෑවුම් සහිත ඉඩම් වේ. ගමට අයත් කුඹුරු ඉඩම් හෙල්මළු ආකාරයට පිහිටා ඇත. ගම්මානයේ ඇති ගොඩ ඉඩම් පාංශු ඛාදනයට ලක් වී ඇත. ගම්මානයේ ජීවත්වන පවුල්වලින් සුළු ප්‍රමාණයක් පාංශු සංරක්ෂණ වැඩ පිළිවෙලවල් සකස් කර තිබුනද බොහෝ ඉඩම් සංරක්ෂණය කර නොමැත. ගම්මානයේ ඇති ඉඩම්වලින් බොහොමයක් සරු ඉඩම් ලෙස පැවත, පසුව පාංශු ඛාදනයට ගොදුරු වීම නිසා ඒවා නිසරු වී ඇත. හප්පාවර ගම්මානයේ පිහිටා ඇති ගොඩ ඉඩම්වලින් පාංශු ඛාදනයට ලක්වූ ඉඩම් පහත 5.6 වගුවේ දක්වා ඇත.

**වගුව 5.6 පාංශු ඛාදනයට ලක්වී ඇති ඉඩම් (ප්‍රමාණය අනුව බෙදීයාම)**

| පාංශු ඛාදනය වී ඇති ඉඩම් ප්‍රමාණය අක්කර | සංඛ්‍යාව | % |
|---|---|---|
| 1/4<=1/2 | 04 | 6.8 |
| 1/2<=3/4 | 14 | 23.7 |
| 3/4<=1 | 0 | 0 |
| 1<=1 ½ | 21 | 35.6 |
| 1 ½< | 20 | 33.9 |
| | 59 | 100 |

ඉහත දක්වා ඇති තොරතුරු අනුව ගම්මානයේ අවම වශයෙන් ඉඩම් අක්කර 61 ක් පමණ පාංශු ඛාදනයට ලක්ව ඇත. සමීක්ෂණයට අනුව ගම්මානයේ පවුල්වලට අයිති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 336.51 කි. මෙයින් 44% ක් පමණ එනම් ඉඩම් අක්කර 61 ක් පමණ පාංශු ඛාදනයට භාජනය වී ඇත. මෙය විශාල ගැටළුවකි. සාමාන්‍ය බෑවුම් සහිත ඉඩම් පාංශු ඛාදනයට ගොදුරුවීමේ ඉඩ කඩ වැඩි නිසා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම මගින් පාංශු ඛාදනය අවම කරගත හැක. පාංශු ඛාදනය අවම කිරීම මගින් කෘෂිකර්මාන්තය සඳහා උචිත පසක් තම ඉඩම් ආශ්‍රිතව සකසා ගත හැක.

ගම්මානයේ ඉඩම්වල වගාවට සුදුසු වැලි සහිත මිශ්‍ර පසක් දක්නට ලැබේ. සමීක්ෂණයට අනුව වගාව සඳහා ජලය ලබාගන්නා ප්‍රධාන ජල මූලාශ්‍රය අනුව ඉඩම් බෙදී ඇති ආකාරය පහත 5.7 වගුව ඇසුරෙන් විස්තර කළ හැක.

**වගුව 5.7 - ජල මූලාශ්‍රය අනුව ඉඩම් බෙදී ඇති ආකාරය**

| ජල මූලාශ්‍රය | මඩ ඉඩම් | | ගෙවතු | | ගොඩ ඉඩම් | | හේන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමා. (අක්කර) | % | ප්‍රමා. (අක්කර) | % | ප්‍රමා. (අක්කර) | % | ප්‍රමා. (අක්කර) | % |
| මහාවාරි මාර්ග | 38.50 | 91.4 | 0.9 | 0.1 | 3.50 | 21.9 | | |
| සුළු වාරි මාර්ග | 1.61 | 3.8 | 01 | 1.4 | 12.25 | 76.6 | | |
| වැසි ජලය | 01 | 2.4 | 68.06 | 97.00 | 0.25 | 1.6 | 8.0 | 97.0 |
| වෙනත් | 01 | 2.4 | 1.00 | 1.4 | | | 0.25 | 30 |
| එකතුව | 42.11 | 100 | 70.15 | 100 | 16.00 | 100 | 8.25 | 100 |

මෙහිදී පෙනී යන වැදගත් කරුණක් වන්නේ මඩ ඉඩම් හැර ඉතිරි ගොඩ ඉඩම් සියල්ලම වාගේ වගා කරන්නේ වැසි ජලය උපයෝගී කරගෙනය. ගෙවතු ඉඩම්වලින් මෙන්ම හේන් ඉඩම් වලින්ද 97% ක්ම වැසි ජලයෙන් වගා කෙරේ. හප්පාවර ගම්මානයේ මහාවාරි මාර්ග (ප්‍රධන වැව) ආශ්‍රිතව කුඹුරු ඉඩම් වගා කෙරේ. ගම්මානයේ වියළි කාලවලදී වී වගාකරන්නේ බෙත්ම ක්‍රමයටයි. ඊට හේතුව වියළි කාලයේදී සියළුම ඉඩම් වගා කිරීමට ප්‍රමාණවත් ජලය නොමැති වීමයි.

හයවෙනි පරිච්ඡේදය

## කෘෂිකර්මය හා අනෙකුත් නිෂ්පාදන කටයුතු

පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ සිදු කරන පරයේෂණයේදී ගම්මානයේ කෘෂිකාර්මික පසුබිම ගැන විශේෂ අවධානය යොමු කරන ලදී. ඒ යටතේ වගා කරනු ලබන බෝග, තාක්ෂණ භාවිතය, කෘෂි උපදෙස් ලබා ගැනීම, බීජ භාවිතය, පොහොර භාවිතය, කෘෂි නිෂ්පාදනය, නිෂ්පාදන වියදම හා ලාභය යන කරුණු ගැන අවධානය යොමු කරන ලදී. මීට අමතරව කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම, අලෙවි මිල, අලෙවිය හා සම්බන්ධ ගැටළුද ගම්මානයේ සත්ව පාලනය සම්බන්ධ තොරතුරුද සාකච්ඡා කෙරේ.

### 6.1.බෝග වගාව

### 6.1.1 හැඳින්වීම

හප්පාවර ගම්මානයේ විශේෂ ලක්ෂණය වන්නේ එම ගම්මානය සතුව විශාල වෙල් යායක් පිහිටා තිබීමයි. මෙම වෙල් යායේ යල මහ දෙකන්නයේම ප්‍රධාන බෝගය ලෙස වී වගාව සිදු කරනු ලබයි. සමීක්ෂණයට අනුව හප්පාවර ග්‍රාමයේ 2005 යල කන්නයේ වගා රටාවන්ද 2005/2006 මහ කන්නයේ වගා රටාවන් ගැනද තොරතුරු රැස් කර ගන්නා ලදී. එම තොරතුරු පහත 6.1 වගුව ඇසුරෙන් දක්වා ඇත.

**වගුව 6.1 - යල මහ දෙකන්නයේ වගා කර ඇති භෝග**

| කන්නය | වගා කරන ලද භෝගය | වගා කළ පවුල් ගණන | වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 2005 යල | සඳහන් නොවන | 08 | 7.5 | 21.7 |
| | වී | 33 | 25.50 | 73.9 |
| | මිරිස් | 01 | .50 | 1.4 |
| | මිශ්‍ර භෝග | 01 | .50 | 1.4 |
| එකතුව | | 44 | 34.50 | 100 |
| 2005/2006 මහ | වී | 47 | 36.61 | 47 |
| | අතිරේක බෝග | 01 | 1.25 | 1.6 |
| | එළවළු | 43 | 28.50 | 36.6 |
| | මිරිස් | 05 | 2.00 | 2.6 |
| | මිශ්‍ර භෝග | 10 | 8.75 | 11.2 |
| | කරවිල | 01 | 0.75 | 1 |
| එකතුව | | 108 | 77.86 | 100 |

හප්පාවර ගම්මානයේ ප්‍රධාන වශයෙන් යල මහ දෙකන්නයේම වී වගාව සිදු කෙරේ. යල කන්නයේදී වී වගාවට අමතරව මිශ්‍ර භෝග වගාව හා ක්ෂේත්‍ර භෝග වගාවන් ද සිදු කරනු ලබයි. යල කන්නයේදී වගා කරන ලද මුළු

භූමි ප්‍රමාණයෙන් 74% ක්ම වී වගාව සිදු කෙරේ. 2005/2006 මහ කන්නයේදී ද හප්පාවර ගම්මානයේ වගා කර ඇති ප්‍රධාන භෝගය වී වගාවයි. එය ගම්මානයේ යල කන්නයේදි වී වගා කර ඇති මුළු භූමි ප්‍රමාණයට වඩා වැඩිය. මෙයින් පෙනී යන්නේ හප්පාවර ගම්මානයේ යල කන්නයට වඩා වැඩි කුඹුරු ඉඩම් ප්‍රමාණයක් මහ කන්නයේදි වගා කරන බවයි. ඉහත 6.1 වගුවට අනුව වී වගා කළ ගොවීන් වෙනත් වගාවන්ද සිදු කර ඇත. මහ කන්නයේ යල කන්නයට වඩා වැඩි භූමි ප්‍රමාණයක වි වගා කළද එය එම කන්නයේ වගා කර ඇති ඉඩම් ප්‍රමාණයෙන් 47% ක් පමණ වේ. හප්පාවර ගම්මානයේ මහ කන්නයේදී අක්කර 29 ක පමණ එළවළු වගා කර ඇත. එම ප්‍රමාණය වගා කර ඇති මුළු භූමි ප්‍රමාණයෙන් 37% ක් පමණ වේ. හප්පාවර ගම්මානයේ ඇති ගොඩ ඉඩම් මෙන්ම හේන් වගාවද සිදු කරන්නේ මාස් කන්නය තුළය. මෙම ගොඩ ඉඩම්වල එළවළු වලට අමතරව මිශ්‍ර බෝග, අතිරේක බෝග හා ක්ෂේත්‍ර බෝග වගා කෙරේ. ක්ෂේත්‍ර භෝග යටතේ හප්පාවර ගම්මානයේ විශේෂයෙන් මිරිස් වගාව සහ කරවිල වගාව සිදු කෙරේ.

සමීක්ෂණයට අනුව පෙනී ගිය ඉතා වැදගත් කරුණක් වන්නේ හප්පාවර ගම්මානයේ වී අස්වැන්න පරිභෝජනයට පමණක් යොදා ගැනීමයි. ඔවුන් තම අස්වැන්න මුළු අවුරුද්ද පුරා පරිභෝජනයට සුදුසු පරිදි සකස් කර ගබඩා කරගෙන ඇත. මෙම ග්‍රාම නිලධාරි වසමේ වගා කරන අනෙකුත් එළවළු, මිශ්‍ර භෝග හා ක්ෂේත්‍ර භෝග වානිජ වගාවන් ලෙස සිදු කෙරේ.

### 6.1.2 තාක්ෂණය භාවිතය

සමීක්ෂණයට අනුව පෙනී යන ප්‍රධාන කරුණක් වන්නේ හප්පාවර ගම්මානයේ ගොවීන් නවීන තාක්ෂණය කාෂිකර්මාන්තය සඳහා වැඩි වශයෙන් යොදා ගෙන නොමැති බවයි. කෘෂිකාර්මික කටයුතු වලදී බොහෝ කාර්යයන් සාම්ප්‍රදානුකූල ආකාරයකට සිදු කෙරේ. සමීක්ෂණයේදී ගම්මානයේ ගොවීන් කෘෂිකාර්මික කටයුතු සම්බන්ධව උපදෙස් ලබා ගන්නා ආකාරය පිළිබඳ කරුණු රැස් කර ගන්නා ලදී, ඒ අනුව ගොවීන් තම කෘෂිකාර්මික කටයුතු කරගෙන යාමට උපදෙස් ලබාගන්නේ කාගෙන්ද, ඒ කුමන ක්‍රියාවලි සඳහාද යන්න අවධානයට යොමු කරන ලදී.

වගුව 6.2 – කෘෂිකාර්මික කටයුතු සඳහා උපදෙස් ලබා ගන්නා ආකාරය

| උපදෙස් ගන්නා ස්ථානය | වගා ක්‍රම සඳහා | බීජ හා රෝපණ ද්‍රව්‍ය | පොහොර | කෘෂි රසායන ද්‍රව්‍ය | කෘෂි යන්ත්‍ර සහ උපකරණ | අලෙවිය | ගොවි ජන | රක්ෂණය | වෙනත් | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි උපදේශක | 1 | 1 | 1 | 1 | - | - | - | - | - | 04 | 1.0 |
| කෘ.ප.නි.ස. | 1 | 2 | 18 | 2 | - | - | 01 | - | - | 24 | 5.8 |
| පොල් සං.නි. | - | 1 | 1 | - | - | - | - | - | - | 02 | 0.5 |
| කජු ස.නි. | - | - | 1 | - | - | - | - | - | | 01 | 0.2 |
| පෞද්ගලික වෙළඳ සැල් | - | 13 | 06 | 35 | 1 | - | - | - | - | 55 | 13.2 |
| ගොවි සංවිධාන | - | - | - | - | - | - | 03 | - | - | 03 | 0.76 |
| උපදෙස් ලබා නොගත් | 50 | 39 | 30 | 19 | 48 | 49 | 43 | 47 | 01 | 326 | 78.4 |
| වෙනත් | 1 | - | - | - | - | - | - | - | - | 01 | 0.2 |
| එකතුව | 53 | 56 | 57 | 57 | 49 | 49 | 47 | 47 | 1 | 416 | |

6.2 වගුව අනුව හප්පාවර ගම්මානයේ ගොවීන් වැඩි පිරිසක් එනම් 78% පමණ තම කෘෂිකාර්මික කටයුතු සඳහා උපදෙස් ලබා නොගනී. කරල්ලියද්ද ගොවි ජන සේවා කොට්ඨාසයට අයත් හප්පාවර ගම්මානයේ ගොවීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමට රාජ්‍ය නිලධාරීන් සිටියද ඔවුන් ඒ සඳහා යොමු වී නොමැති බව ඉහත වගුව 6.2 නිරීක්ෂණය කිරීමේදී පෙනී යයි. ගම්මානයකට එක් නිලධාරියෙකු බැගින් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් සිටියද ගොවීන් තම කෘෂිකාර්මික කටයුතුවලට ඔවුන්ගෙන් උපදෙස් ලබාගන්නේ ඉතා අඩුවෙනි. සමීක්ෂණයට අනුව ගම්මානයේ ගොවීන්ගෙන් 6% ක් පමණ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර ගෙන් උපදෙස් ලබා ගනී. එයිනුත් වැඩි පිරිසක් උපදෙස් ලබා ගන්නේ පොහොර භාවිතය සම්බන්ධවයි. ගම්මානයේ පොහොර බෙදීම සිදු කරන්නේ කෘ.ප.නි.ස. හරහාය. මීට අමතරව ගම්මානයේ ගොවීන්ගෙන් 13% ක් පමණ කෘෂි කර්මාන්තය සම්බන්ධව උපදෙස් ලබා ගන්නේ පෞද්ගලික වෙළඳ සැල් මගිනි. මෙම පෞද්ගලික වෙළඳ සැල්වලින් ගොවීන් උපදෙස් ලබාගන්නේ බොහෝ විට කෘෂි රසායන ද්‍රව්‍ය පිළිබඳව සහ බීජ රෝපණ ද්‍රව්‍ය පිළිබඳවයි.

මීට අමතරව ඉතා සුළු වශයෙන් ගොවි සංවිධාන මගින් ගොවි ණය පිළිබඳව උපදෙස් ලබා ගන්නා බව සමීක්ෂණයෙන් පැහැදිලි වේ.

**වගුව 6.3 සේවා සහ උපදෙස් ලබාගන්නා ආකාරය**

| සේවා උපදෙස් ලබාගන්නා ස්ථානය | සේවා ලබාගන්නේ | |
|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 1. ගොවිජන සේවා මධ්‍යස්ථානය | 17 | 15.7 |
| 2. පෞද්ගලික වෙළඳුන් | 66 | 61.1 |
| 3. කෘෂි කර්ම දෙපාර්තමේන්තුව | 03 | 2.8 |
| 4. ගොවි සංවිධාන | 05 | 4.6 |
| 5. ගොවි මහතුන් | 14 | 13.0 |
| 6. වෙනත් | 03 | 2.8 |
| | 108 | 100 |

6.3 වගුව අනුව හප්පාවර ගම්මානයේ උපදෙස් ලබා ගන්නා ගොවීන්ගෙන් වැඩි පිරිසක් එනම් 61% ක් පමණ තම කෘෂිකාර්මික කටයුතු සඳහා උපදෙස් සහ සේවා ලබාගන්නේ පෞද්ගලික වෙළඳසැල් මගිනි. ගොවිජන සේවා මධ්‍යස්ථානය ආශ්‍රිතව තම සේවා සපයාගන්නා පිරිස ගම්නයේ සේවා සපයා ගන්නා පිරිසෙන් 16% ක් පමණ වේ. මීට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන, අනෙකුත් ගොවි මහතුන්ගෙන් හා වෙනත් ස්ථානවලින් උපදෙස් ලබා ගන්නා පිරිස 23% ක් පමණ වේ.

### 6.1.2.2 බීජ භාවිතය

හප්පාවර ගම්මානයේ ප්‍රධාන ලෙසම වී වගාව හා එළවළු වගාව සිදු කෙරේ. මීට අමතරව හේන් වගාවද සිදුවේ. සමීක්ෂණයේ තොරතුරු අනුව වගාව සඳහා අවශ්‍ය බීජ සපයා ගෙන ඇති ආකාරය පහත වගුව 6.4 ආශ්‍රිතව විස්තර කළ හැක.

**වගුව 6.4 වී සහ එළවළු බීජ ලබාගන්නා ආකාරය**

| යෙදවුම ලබාගත් මූලය | බිත්තර වී | | එළවළු බීජ | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| තමාගෙන් | 30 | 71.4 | 15 | 31.9 |
| පෞද්ගලික වෙළන්දන් | 01 | 2.4 | 30 | 63.8 |
| ගොවි ජන සේවා | - | - | 01 | 2.1 |
| අසල්වැසි | 02 | 4.8 | - | - |
| වාර්තා නොවු | 09 | 21.4 | 01 | 2.1 |
| එකතුව | 42 | 100 | 47 | 100 |

හප්පාවර ගම්මානයේ වී වගාව සඳහා බිත්තර වී වැඩි වශයෙන් ලබාගෙන ඇත්තේ ගොවියන් ඔවුන් විසින්ම නිපදවා ගැනීම මගිනි. වී වගාවේ යෙදී ඇති පවුල් 42 න් 71% ක්ම බිත්තර වී සපයාගෙන ඇත්තේ ඔවුන් විසින්ම නිෂ්පාදනය කරගැනීමෙනි. හප්පාවර ගම්මානයේ වී වගා කළ ගොවීන්ගෙන් 21% ක් පමණ 2005 වර්ෂයේදී බිත්තර වී තම අසල්වැසි ගොවීන්ගෙන් ලබාගෙන ඇත. මීට අමතරව පෞද්ගලික වෙළඳුන්ගෙන් සහ ගොවි ජන

සේවා මධ්‍යස්ථානයෙන් ඉතා සුළු වශයෙන් බිත්තර වී මිලදීගෙන ඇත. ගම්මානයේ ගොවීන්ගෙන් 93% ක්ම වගා කර ඇත්තේ නිවුඩු වී වර්ගය.

ගම්මානයේ ගොවීන් එළවළු වගාවට අවශ්‍ය බීජ වැඩි වශයෙන් ලබාගෙන ඇත්තේ පෞද්ගලික වෙළෙන්දන් මගිනි. එම ප්‍රමාණය එළවළු වගා කරන ගොවීන්ගෙන් 64% ක් පමණය. තමාගේම බීජ යොදාගෙන එළවළු නිෂ්පාදනය කරන ගොවීන් ප්‍රමාණය හප්පාවර ගම්මානයේ 32% ක් පමණ වේ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් බීජ සපයා ගන්නා ගොවීන් ප්‍රමාණය හප්පාවර ගම්මානයේ ඉතා අල්පය.

සමීක්ෂණයට අනුව වී වගාව සඳහා අවශ්‍ය බීජ ලබා ගැනීම අපහසු කාර්යයක් නොවන බව වී ගොවීහු සියළු දෙනා පවසති. මෙයින් පෙනී යන්නේ බිත්තර වී සපයා ගැනීමේ ගැටළුවක් දැනට හප්පාවර ග්‍රාමයේ නොමැති බවයි. එමෙන්ම හප්පාවර ගම්මානයේ ගොවීන්ට අවශ්‍ය එළවළු බීජ ලබා ගැනීමේ ගැටළුවක් නොමැති බව ගොවීහු කියති. මේ අනුව බීජ ලබා ගැනීමේ අපහසුතාවයක් නොමැති බව එළවළු ගොවීන් 98% ක් පමණ පවසා ඇත.

#### 6.1.2.3 පොහොර භාවිතය

පොහොර භාවිතය සිදු කෙරෙන ආකාරය පිළිබඳ තොරතුරු වී වගාව සහ එළවළු වගාව සම්බන්ධව වෙන වෙනම රැස් කර ගන්නා ලදී. මෙහිදී එළවළු සහ වී වගාවන්වලට ගොවීන් යොදන යෙදවුම් සටහන් කර ගැනිණි. ඒ අනුව පොහොර භාවිතය හා කෘමි නාශක, වල් නාශක භාවිතය පිළිබඳ අවධානය යොමු කෙරේ.

**වගුව 6.5 ප්‍රධාන භෝග සඳහා රසායනික පොහොර භාවිතය**

| යෙදවුම් වර්ගය | වී ගොවීන් සංඛ්‍යාව | එළවළු ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|
| යූරියා | 41 | 23 |
| මඩ පොහොර/කැට පොහොර | 18 | - |
| බණ්ඩි පොහොර | 38 | 08 |
| MOP/TSP | 25 | 48 |
| එකතුව | 122 | 79 |

හප්පාවර ගම්මානයේ වැඩි පිරිසක් වී වගාව, එළවළු වගාවට හා අනෙකුත් අතිරේක භෝග වගා කිරීම සඳහා රසායනික පොහොර භාවිතා කරයි. ඉහත වගුව 6.5 අනුව බොහෝ ගොවීන් අවශ්‍ය වෙලාවට අවශ්‍ය රසායනික පොහොර යෙදීම සිදු කරයි. මෙහිදී විශේෂයෙන්ම මෙම ගම්මානයේ ගොවීන් පොහොර, සහනාධාරය යටතේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් පොහොර ලබා ගනී. එම නිසා වී වගාව සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය පමණක් රජයේ නිර්දේශිත මිලට (රු. 350/-) ගම්මානයේ කෘ.ප.නි.ස. නිලධාරිවරයා යටතේ ඇති පොහොර ගබඩාවෙන් නිකුත් කෙරේ. මෙහිදී ගොවීන්ගේ ඉඩමේ ප්‍රමාණය අනුව අවශ්‍ය පොහොර ප්‍රමාණය අවශ්‍ය අවස්ථාවලදී යෙදීම සඳහා නිකුත් කෙරේ. මෙමගින් අනවශ්‍ය ලෙස යොදන රසායනික පොහොර ප්‍රමාණය පාලනය කරගත හැකිව ඇත.

වගුව 6.6 වී වගාව සහ එළවළු වගාව සඳහා යෙදවුම් ලබා ගැනීම

| යෙදවුම් ලබාගත් මූලය | රසායනික පොහොර | | කාබනික පොහොර | | කෘමි නාශක | | වල් නාශක | |
|---|---|---|---|---|---|---|---|---|
| | වී | එළවළු | වී | එළවළු | වී | එළවළු | වී | එළවළු |
| තමාගෙන් | - | - | 01 | - | - | - | - | - |
| පෞද්ගලික වෙළෙන්දන්ගෙන් | 02 | 63 | - | 01 | 21 | 13 | 13 | - |
| ගොවි සංවිධානය | 03 | - | - | - | - | - | - | - |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | 117 | 09 | - | - | - | - | - | - |
| අසල්වැසියන් | - | - | - | - | - | - | - | - |
| වාර්තා නොවූ | 02 | 02 | - | - | 01 | | | |

පොහොර භාවිතයේදී වී වගාව සඳහා කාබනික පොහොර භාවිතා කරන එක් ගොවියෙක් පමණක් ඇති බව හඳුනාගන්නා ලදී. ඔහු එම කාබනික පොහොර ඔහු විසින්ම නිපදවා ගන්නා බව සමීක්ෂණයේදී හෙළි විය. හප්පාවර ගම්මානයේ ගොවීන් වී වගාව සඳහා රසායනික පොහොර වැඩි වශයෙන් ලබා ගන්නේ ගොවිජන සේවා මධ්‍යස්ථානයෙනි. නමුත් එළවළු වගාව සඳහා අවශ්‍ය පොහොර ගොවීන් වැඩි පිරිසක් පෞද්ගලික වෙළෙඳුන්ගෙන් ලබා ගනී. මෙසේ පෞද්ගලික වෙළෙන්දන්ගෙන් මිලදී ගන්නා පොහොර මිටියක මිල රු.1000 ට වඩා වැඩිය. නමුත් ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබා දෙන පොහොර සහනාධාර වැඩපිළිවෙල යටතේ රු. 350/- කට පොහොර ලබාගත හැක.

ඉහත 6.6 වගුව අනුව කාබනික පොහොර සකස් කර යොදන එක් ගොවියෙකු සිටියද අනෙකුත් ගොවීන් ද වී වගාවේදී විශේෂයෙන් තවාන් සැකසීමේදී ගොම, පිදුරු සහ කොළ අතු යොදයි. හප්පාවර ගම්මානයේ ගොවීන් සෑහෙන පිරිසක් දැනටත් පිදුරු ගිනි තැබීම සිදු කරයි. මෙය සිදුවන්නේ ගොවීන්ගේ නොදැනුවත්කම නිසාය. මෙම කෘෂිකාර්මික අපද්‍රව්‍ය මගින් කාබනික පොහොර සකසා ගෙන කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගැනීම මගින් පසේ ගුණාත්මකභාවය සහ අස්වැන්න වැඩි කරගත හැක.

### 6.1.2.4 ජල පාලනය

හප්පාවර ගම්මානයේ භෝග වගාව සඳහා ජලය ලබා ගැනීමට මහාවාරි මාර්ග, (ප්‍රධාන වැව්) සුළු වාරි මාර්ග (අමුණු) සහ වැසි ජලය උපයෝගී කර ගනී. වී වගාව සඳහා වැඩි වශයෙන් ජලය ලබා ගන්නේ මහා වාරි මාර්ගයෙනි. හප්පාවර ගම්මානයේ මහා වාරි මාර්ග සැකසී ඇත්තේ ගම්මානයේ ඇති වැව මගිනි. සුළු වාරි මාර්ග ගම්මානයේ පිහිටා ඇති අමුණු දෙක ආශ්‍රිතව සකස් වී ඇත. යල කන්නයේදී වගා කරන කුඹුරු ඉඩම් වලටද ප්‍රධාන වැව ආශ්‍රිතව ජලය සපයා ගනී. ගම්මානයේ මහ කන්නයේදී වගා කරන එළවළු සඳහා ජල අවශ්‍යතාවය සපයා ගන්නේ වැසි ජලයෙනි. ගෙවතු සහ අනෙකුත් ගොඩ ඉඩම් ආශ්‍රිතව සිදු කෙරෙන එළවළු වගාවන්ට වැසි ජලය වැඩි වශයෙන් උපයෝගී කර ගනී. මීට අමතරව ඉතා ස්වල්ප වශයෙන් සුළු වාරි මාර්ග ජල ප්‍රභවයක් වශයෙන් එළවළු වගාව සඳහා යොදා ගනී. ගම්මානයේ සිදු කරන වී වගාව සඳහා මහ කන්නයේදී ජලය හිඟවීමක් දක්නට නොමැත. මහ කන්නයේදී ජලය අක්‍රමවත් ලෙස භාවිතා වන අතර අපතේ යාමක්ද සිදු වේ. බොහෝ ගොවීන් භෝගවල අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ජලය ලබාදීමට වැඩි කැමැත්තක් දක්වයි. යල කන්නයේ

සමහර කාලවලදී ජලය හිඟ වූ විට ගොවි සංවිධානයේ මැදිහත් වීම මත ජලය බෙදා හැරීම සිදු කරන බව සමීක්ෂණයේදී හෙළි විය. මෙමගින් ගොවීන් සියළු දෙනාටම සාධාරණ ලෙස මහා වාරිමාර්ග (ප්‍රධාන වැව) හා සුළු වාරි මාර්ගවල (අමුණු) ජලය ගොවිතැන සඳහා භාවිතා කිරීමට හැකියාව ලැබී ඇත.

ගොඩ ගොවිතැන් සිදු කිරීමේදී විශේෂයෙන් එළවළු වගාවේදී මහා වාරි මාර්ග සහ සුළු වාරි මාර්ග ජලය යොදා වගාවන් සිදු කෙරේ. නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන ජලය අපතේ නොයන බිංදු ජල සම්පාදනය හෝ විසුරුම් ජල සම්පාදනය යොදාගෙන භෝග වගා කරන බවක් දක්නට නොලැබුණි. ගොවීන් ජලය පස මතුපිටට ජලය ඉසීම මගින් පස සේදී යාමද බහුලව සිදු වේ. මෙමගින් ගම්මානයේ ඉඩම්වල ගුණාත්මක භාවය අඩුවේ.

### 6.1.2.5 නිෂ්පාදනය

හප්පාවර ගම්මානයේ යල සහ මහ යන දෙකන්නයේම වී වගාව ප්‍රධාන වශයෙන් සිදු කරයි. සමීක්ෂණයට අනුව ලැබුණු තොරතුරු 6.7 වගුව ආශ්‍රිතව විස්තර කළ හැක.

**වගුව 6.7 – වගා කර ඇති භෝග ආශ්‍රිත තොරතුරු**

| කන්නය | වගාකළ බෝගය | අක්කර | නිෂ්පාදනය (කි.ග්‍රෑ) | පාරිභෝජනය (කි.ග්‍රෑ.) | අදය | විකුණුම් ප්‍රමාණය (කි.ග්‍රෑ) |
|---|---|---|---|---|---|---|
| 2005 යල | වී | 33.0 | 40089 | 1258 | 490 | 160 |
| | වම්බටු | .50 | 1200 | - | - | 1200 |
| | මිරිස් | .50 | 450 | - | - | 450 |
| | මුරුංගා | 3.25 | 5000 | - | - | 5000 |
| 2005 මහ | වී | 37.25 | 46739 | 1421 | 662 | 135 |
| | වම්බටු | 8.25 | 13550 | - | - | 13550 |
| | ඇඹුල් කෙසෙල් | .25 | 600 | - | - | 600 |
| | කෝලිකුට්ටු | 0.50 | 210 | 10 | 800 | 200 |
| | මිරිස් | 1.62 | 465 | - | - | 465 |
| | මුරුංගා | .50 | 2000 | 500 | 250 | 700 |
| | තලන බටු | 1.75 | 2900 | - | - | 2900 |
| | තක්කාලි | 13.13 | 19650 | - | - | 19400 |
| | කරවිල | 6.50 | 8660 | - | - | 8660 |
| | ඉඟුරු | .50 | 333.83 | 333.33 | - | - |
| | වැටකොළු | 3.25 | 3570 | - | - | 3510 |
| | මිශ්‍ර බෝග | 2.25 | 600 | 100 | - | 500 |
| | ළූණු | .25 | 23 | 23 | - | - |
| | කුරක්කන් | 1.50 | 1000 | 20 | - | 980 |
| | පතෝල | .25 | 1000 | - | - | 1000 |

2005 යල කන්නයේදී හප්පාවර ගම්මානයේ වී වගාවට අමතරව අක්කර 4.25 ක් තුළ වම්බටු, මිරිස් සහ මුරුංගා වැනි භෝග වගා කර ඇත. එම කන්නයේදි අක්කර 23 ක වී වගා කර ඇත. 2005 යල කන්නයේදී වී වගාව තුළින් එක් අක්කරයකට ලබාගෙන ඇති නිෂ්පාදනය වී කි.ග්‍රෑ. 1215 ක් පමණ වේ. මේ ප්‍රමාණය බුසල්වලින් ගත් විට බුසල් 57 ක් පමණ වේ. මෙය නුවරඑළිය දිස්ත්‍රික්කයේ සාමාන්‍යයෙන් ලැබෙන වී අස්වැන්නට වඩා වැඩි අස්වැන්නකි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අක්කරයක වී අස්වැන්න බුසල් 40-45 ක් අතර වේ. එම නිසා හප්පාවර ගම්මානයේ ගොවීන්හට නුවරඑළිය දිස්ත්‍රික්කයේ සාමාන්‍ය නිෂ්පාදනය හා සැසඳීමේදී වී වගාවෙන් හොඳ අස්වැන්නක් ලැබේ. නමුත් ශ්‍රී ලංකාවේ අක්කරයකින් ලැබෙන වී අස්වැන්න වී බුසල් 80 ක් පමණ වේ. ලංකාවේ සාමාන්‍ය අස්වැන්න හා සැසඳීමේදී හප්පාවර ගොවීන් ලබා ගන්නේ සාපේක්ෂව අඩු අස්වැන්නකි.

හප්පාවර ගම්මානයේ වම්බටු අක්කරයක නිෂ්පාදනය 2005 යල කන්නයේදී කි.ග්‍රෑ. 2400 ක් පමණ වේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වම්බටු අස්වැන්න 2005 යල කන්නයේ දී කි.ග්‍රෑ. 2334 ක් වේ. එමෙන්ම ලංකාවේ සාමාන්‍ය වම්බටු අස්වැන්න 2005 යල කන්නයේදී කි.ග්‍රෑ. 2883 ක් වේ. හප්පාවර ගම්මානයේ අස්වැන්න යල කන්නයේදී සාමාන්‍ය නුවරළිය දිස්ත්‍රික්කයේ අස්වැන්නට වඩා මදක් වැඩි වන අතර ලංකාවේ අස්වැන්නට වඩා මදක් අඩුය. නමුත් මෙම අස්වැන්න හප්පාවර ගම්මානයේ මහ කන්නයේදි අඩු වී ඇත.

හප්පාවර ගම්මානයේ පසුගිය වසරේදි යල මහ දෙකන්නයේදීම අමු මිරිස් වගා කර ඇති බව සමීක්ෂණයෙන් අනාවරණය වී ඇත. ඒ අනුව 2005 යල කන්නයේදී හප්පාවර ගම්මානයේ අක්කරයකින් ලබාගෙන ඇති මිරිස් අස්වැන්න කි.ග්‍රෑ. 900 කි. මහ කන්නයේදී ලබා ඇති අස්වැන්න යල කන්නයට වඩා අඩුය. එම ප්‍රමාණය අක්කරයකට කි ග්‍රෑ. 281 ක් පමණ වේ. යල කන්නයේදී හප්පාවර ගම්මානයේ මිරිස් අස්වැන්න නුවරඑළිය දිස්ත්‍රික්කයේ අස්වැන්නට වඩා මදක් අඩුය. නුවරඑළිය දිස්ත්‍රික්කයේ දී යල කන්නයේදී මිරිස් නිෂ්පාදනය අක්කරයකට කි.ග්‍රෑ. 982 ක් වන අතර, ලංකාවේ සාමාන්‍ය අස්වැන්න වන කි.ග්‍රෑ. 1106 කි 2006 මහ කන්නයේදී හප්පාවර ගම්මානයේ මිරිස් අස්වැන්න සැහෙන ප්‍රමාණයකින් පහත බැස ඇත. එය ලංකාවේ සාමාන්‍ය මිරිස් අස්වැන්න වන අක්කරයට කි.ග්‍රෑ. 1287 න් 1/5 ක් පමණ කොටසකි.

මෙයට අමතරව හප්පාවර ගම්මානයේ යල කන්නයේදි ප්‍රධාන වශයෙන් තක්කාලි, කරවිල, පතෝල සහ අනෙකුත් මිශ්‍ර බෝග වගා කෙරේ. ගම්මානය 2006 මහ කන්නයේදී තක්කාලි අස්වැන්න අක්කරයකට කි.ග්‍රෑ. 1477 ක් පමණ වේ. එම අස්වැන්න ලංකාවේ සාමාන්‍ය අස්වැන්නට වඩා විශාල වශයෙන් අඩු වී ඇත. ලංකාවේ සාමාන්‍ය 2006 මහ කන්නයේ තක්කාලි අස්වැන්න අක්කරයකට කි.ග්‍රෑ. 4653 ක් පමණ වේ. සමීක්ෂණයේ නිෂ්පාදන පිළිබඳ තොරතුරු 100% ක්ම නිවැරදි ලෙස ප්‍රකාශ කිරීමට ගොවීන් මැලිකමක් දක්වන නිසා ඉහත අගයන් වෙනස් විය හැක. ගම්මානයේ 2006 මහ කන්නයේදි අක්කරයකට ලබාගත් කරවිල අස්වැන්න කි.ග්‍රෑ. 1332 ක් වන අතර වැටකොළු අස්වැන්න කි.ග්‍රෑ. 1080 ක් පමණ වේ. මෙම ප්‍රමාණය ලංකාවේ 2006 මහ කන්නයේ අස්වැන්නට වඩා අඩුය.

6.1.2.6 නිෂ්පාදන වියදම හා ලාභය

හප්පාවර ගම්මානයේ වී නිෂ්පාදනය සඳහා වියදම සමීක්ෂණයේදී අවධානයට යොමු කරන ලදී. අනෙකුත් බෝග සඳහා යොදන යෙදවුම් පිළිබඳවද කරුණු රැස්කර ගන්නා ලදී.

**වගුව 6.8 අක්කර 14 ක වී වගාව සඳහා නිෂ්පාදන පිරිවැය**

| බෝගය | අක්කර | යෙදවුම් | වියදම | නිෂ්පාදනය (කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|
| වී | 14 | බිජ | 8400.00 | 17875 |
| | | පොහොර | 14702.00 | |
| | | කෘෂි රසායන | 13760.00 | |
| | | බිම් සකස් කිරීම | 40800.00 | |
| | | අස්වනු නෙලීම | 8300.00 | |
| | | ජල සැපයුම | 21200.00 | |
| | | පවුලේ ශ්‍රමය | 361207.00 | |
| | | කුළී ශ්‍රමය | 50541.73 | |
| නිෂ්පාදන පිරිවැය පවුලේ ශ්‍රමය සමඟ | | | 5,18911.08 | |
| නිෂ්පාදන පිරිවැය පවුලේ ශ්‍රමය හැර | | | 157703.73 | |

ඉහත 6.8 වගුව අනුව හප්පාවර ගම්මානයේ වී වගාව සම්බන්ධව අක්කර 14 ක් සඳහා ගිය නිෂ්පාදන පිරිවැය ගණන් බලා ඇත. ඒ අනුව අක්කර 14 ක වී වගාවෙන් කි.ග්‍රෑ. 17875 ක අස්වැන්නක් ලබා ඇත. මෙහිදී අක්කරයකට ලබා ඇති අස්වැන්න ප්‍රමාණය කි.ග්‍රෑ. 1277 ක් පමණ වේ. වගා කර ඇති අක්කර 14 සඳහා නිෂ්පාදන පිරිවැය පවුලේ ශ්‍රමයට අගය එකතු කළ පසු රු. 518911.08 කි. එම නිසා අක්කරයක් සඳහා යන වියදම පවුලේ ශ්‍රමය සමඟ රු. 37065.00 කි. වී වගා කිරීම සඳහා පවුලේ ශ්‍රමය හැර අක්කර 14 ක් හප්පාවර ගම්මානයේ වගා කිරීමට රු. 157703.73 ක් වැය වේ. එම නිසා අක්කරයක වී වගා කිරීමට පවුලේ ශ්‍රමය හැර වියදම් වන මුදල රු.11264.50 කි. හප්පාවර ගම්මානයේ වී කි.ග්‍රෑ. එකක් සඳහා සාමාන්‍යයෙන් ගෙවන මුදල රු. 16.50 ක් පමණ වේ. එම නිසා අක්කරයක වී වගා කිරීමෙන් ලැබෙන මුළු ආදායම වන්නේ රු.21070.50 කි.

**හප්පාවර ගම්මානයේ වී වගාවේ නිෂ්පාදන පිරිවැය**

වගා කර ඇති මුළු භූමි ප්‍රමාණය = අක්කර 14 යි

ලබා ඇති මුළු නිෂ්පාදනය = 17875.00

එම නිසා අක්කරයක නිෂ්පාදනය = $\frac{17875.00}{14}$

= <u>1277 kg</u>

| | |
|---|---|
| ඉඩම් අක්කර 14 ක් වගා කිරීමට යන මුළු වියදම (පවුලේ ශ්‍රමය හැර) | රු. 157703.73 |
| ඉඩම් අක්කර 14 ක් වගා කිරීමට පවුලේ ශ්‍රමය සමග යන වියදම | රු. 518911.00 |
| පවුලේ ශ්‍රමයට අගය එකතු නොකර වී අක්කරයක වගා කිරීමට යන වියදම | රු. 157703.00 / 14 = රු. 11264.50 |
| පවුලේ ශ්‍රමයට අගය එකතු කර අක්කරයක වී වගා කිරීමට යන වියදම | රු. 518911.00 / 14 = රු. 37065.00 |
| හප්පාවර ගම්මානයේ සමීක්ෂණය සිදු කරන දිනවල වී කි.ග්‍රෑ. 1ක මිල | රු. 16.50 |
| අක්කරයක වී වගාවෙන් ලැබෙන මුළු ආදායම | රු. 16.50 x 1277.00 = රු. 21070.50 |
| එම නිසා වී අක්කරයක වගා කිරීමෙන් ලැබෙන ලාභය (පවුලේ ශ්‍රමයට අගය එකතු නොකර) | රු. 21070.50 - 11264.50 = රු. 9806.00 |
| පවුලේ ශ්‍රමයට අගය එකතු කර ලැබෙන ලාභය | රු. 21070.50-37065.00 = රු. -15994.50 |

පවුලේ ශ්‍රමයට අගයක් එකතු කර පිරිවැය ගණනය කිරීමේදී අක්කරයකට රු.15994.50 ක පාඩුවක් විඳීමට සිදු වේ. මෙයින් පැහැදිලි වන්නේ පවුලේ ශ්‍රමය සඳහා යන වියදම මුළු නිෂ්පාදන පිරිවැයට එකතු කර බැලීමේදී වී වගාව හප්පාවර ගම්මානයේ ගොවීන්ට වාසිදායකව සිදුවන්නේ නැති බවයි. පවුලේ ශ්‍රමයට අගයක් එකතු නොකර සිදු කර ගණනය කිරීමේදී හප්පාවර ගම්මානයේ ගොවීන්ට අක්කරයකින් රු. 9806.00 ක ලාභයක් ලැබේ. මෙම වී ගොවිතැන ලාභ ලබාදෙන ආකාරයේ වගාවක් නොවන බව ඉහත දත්ත අනුව පැහැදිලි වේ. ගම්මානයේ ගොවීන් යල මහ දෙකන්නයේ වී වගා කර ලබාගන්නා අස්වැන්න අලෙවි කිරීමක් සිදු නොකරයි. ඔවුන් ඒවා අවුරුද්ද මුළුල්ලේ පරිභෝජනය සඳහා යොදා ගනී.

හප්පාවර ගම්මානයේ වී කි.ග්‍රෑ. 01 ක් නිෂ්පාදනය කිරීම සඳහා යන වියදම රු.8.82 කි (පවුලේ ශ්‍රමය හැර). නුවරඑළිය මහනුවර දිස්ත්‍රික්කවල සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය වී කි.ග්‍රෑ. 01 ක් සඳහා පවුලේ ශ්‍රමයට අගය එකතු නොකර රු. 11 ක් පමණ වේ. මෙම අගය පවුලේ ශ්‍රමයට අගය එකතු කර රු. 24ක් වේ. හප්පාවර ගම්මානයේ පවුලේ ශ්‍රමයට අගය එකතු කර වී කි.ග්‍රෑ. 01 ක් නිෂ්පාදනය කිරීම සඳහා රු. 29 ක් වැය වේ. මෙය සාපේක්ෂව ඉහළ අගයකි.

නිෂ්පාදන වියදම අඩුකර ගැනීමේ හා ලාභය උපරිම කර ගැනීමේ විභවතාවයන් හප්පාවර ගම්මානයේ ගොවීන් සතුව ඇත. නිෂ්පාදන වියදම වැඩි වශයෙන්ම වැය වී ඇත්තේ බිම් සකස් කිරීම, අස්වනු නෙලීමෙන් පසු අස්වනු සකස් කිරීම ආදිය සඳහායි. මේවා සඳහා වෙනත් පිළියම් යෙදීම ගම්මානයේ කුඹුරුවල පිහිටීම අනුව තරමක් අසීරුය. එයට හේතුව එම ඉඩම් හෙල්මළු සහිත වීමයි. නමුත් අස්වනු නෙලීම, සකස් කිරීම සඳහා නවීන තාක්ෂණික උපකරණ (ට්‍රැක්ටර්) යොදාගන්නේ නම් යම් තරමකට වියදම අඩු කර ගත හැක. මෙම කාර්යයන් (අස්වනු නෙලීම, සකස් කිරීම) බොහෝ දුරට සිදු වන්නේ අත්තම් ක්‍රමයටයි. එසේ හෙයින් මේ සඳහා විකල්ප ක්‍රම සොයා බැලීමේදී ඒවාට යන වියදම සසඳා බැලිය යුතු වේ. රසායනික පොහොර සඳහා යන වියදම සෑහෙන දුරට අඩුකර ගත හැක්කේ ගොවීන් කාබනික පොහොර භාවිතයට යොමු කිරීම මගින්ය. හප්පාවර ගම්මානයේ කාබනික පොහොර නිෂ්පාදනයට වැඩි විභවතාවයක් ඇත. එම නිසා ඒ සඳහා පහසුවෙන් ගොවීන් යොමු කළ හැක.

### 6.1.2.7 අලෙවිය

හප්පාවර ගම්මානයේ ප්‍රධාන ජීවන වෘත්තිය වශයෙන් සිදු වන්නේ කෘෂිකර්මාන්තයයි. ගම්මානයේ කෘෂි නිෂ්පාදන අලෙවිය සිදු කරන ආකාරය හා ඒවාට බලපාන සාධක මෙම සමාජ ආර්ථික විශ්ලේෂණයේදී විශේෂ අවධානයට යොමු කරන ලදී. ඒ අනුව හප්පාවර ගම්මානයේ අලෙවි රටාව පහත 6.9 වගුව පරිදි විස්තර කළ හැක.

**වගුව 6.9 කෘෂි නිෂ්පාදනයන්ගේ අලෙවි රටාව**

| අලෙවි මූලය | පුද්ගලයන් සංඛ්‍යාව | ප්‍රතිශතය | අලෙවි කළ ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | | | කි.ග්‍රෑ. | ප්‍රතිශතය |
| පාරිභෝගිකයන්ට | 03 | 3.1 | 1710.00 | 2.6 |
| සිල්ලර වෙළෙන්දන් | 20 | 20.8 | 10915.00 | 16.9 |
| අතරමැදියන් | - | - | - | - |
| තොග වෙළෙන්දන් | 71 | 44.0 | 51070.00 | 78.9 |
| වෙනත් | - | - | - | - |
| වාර්තා නොවූ | 02 | 2 | 300 | 0.5 |
| එකතුව | 96 | 100 | 64695.00 | 100 |

සමීක්ෂණයට අනුව හප්පාවර ගම්මානයේ ගොවීන් තම කෘෂි නිෂ්පාදන ප්‍රධාන වශයෙන් අලෙවි කරන්නේ තොග වෙළෙන්දන්ටය. ගොවීන්ගෙන් 74% ක් පමණ තොග වෙළෙන්දන්ට ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කරනු ලැබේ. මෙම ගම්මානයට පැමිණෙන තොග වෙළෙන්දන් කෘෂි නිෂ්පාදන මිලදී ගනී. මීට අමතරව ගොවීන්ගෙන් 21% ක් පමණ ගම්මානයේ කෘෂි නිෂ්පාදනවලින් 17% ක් පමණ සිල්ලර වෙළෙන්දන්ට අලෙවි කෙරේ. ගම්මානය මැදින් දිවෙන බදුල්ල මහනුවර ප්‍රධාන මාර්ගය නිසා මෙම කෘෂි නිෂ්පාදන පහසුවෙන් සිල්ලර වෙළෙඳ සැල් ආශ්‍රිතව අලෙවි කළ හැක. හප්පාවර ගම්මානයේ කෘෂි නිෂ්පාදනවලින් ඉතා සුළු ප්‍රමාණයක් එනම් 2.6% ක පමණ ප්‍රමාණයක් කෙලින්ම පාරිභෝගිකයන්ට විකුණනු ලැබේ.

වගුව 6.10 නිෂ්පාදන අලෙවි කළ ස්ථානය හා ප්‍රමාණය

| අලෙවි කල ස්ථානය | සංඛ්‍යාව | අලෙවි කළ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| නගරය | 02 | 20 | 0.0 |
| ගමේ කඩය | 11 | 11095 | 18.4 |
| ප්‍රධාන පාර | 80 | 49080 | 81.5 |
| එකතුව | 93 | 60195 | 100 |

හප්පාවර ගම්මානයේ ගොවීන් තම කෘෂි නිෂ්පාදන වැඩි වශයෙන් අලෙවි කරන්නේ ප්‍රධාන මහා මාර්ගය ආශ්‍රිතවයි. බදුල්ල - මහනුවර ප්‍රධාන මාර්ගයට ලොරි රථවලින් පැමිණෙන පෞද්ගලික වෙළෙන්දන් ගොවීන්ගේ නිෂ්පාදනවලින් 81.5% ක් පමණ මිලදී ගන්නා බව සමීක්ෂණයේදී අනාවරණය වී ඇත. එමෙන්ම ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව පිහිටා ඇති ගමේ සිල්ලර කඩවලට කෘෂි නිෂ්පාදනවලින් 18% ක් පමණ අලෙවි කෙරේ.

හප්පාවර ගම්මානයේ ගොවීන්ගේ කෘෂි නිෂ්පාදනවලින් ඔවුන් අලෙවි කරන්නේ එළවළු සහ ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනයන්ය. ගම්මානයේ ගොවීන් වී අලෙවි කරන්නේ ඉතා සුළුවෙනි. එම ප්‍රමාණය 2005 යල සහ 2005 මහ කන්නයේ කි.ග්‍රෑ. 295 ක් පමණ වේ. ගම්මානයේ ගොවීන් වී වගාකරන්නේ විශේෂයෙන්ම පරිභෝජනය සඳහායි. නමුත් ගොවීන් වගා කරන එළවළු සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන පරිභෝජනයට අමතරව අලෙවි කිරීම සිදු කරනු ලබයි.

### 6.1.2.8 ප්‍රශ්න ගැටළු සහ විසඳුම්

ගම්මානයේ දැනට සිදුවන කෘෂි නිෂ්පාදන රටාව සහ ඒ ආශ්‍රිතව ඇති ගැටළු, සමීක්ෂණයේදී අවධානයට යොමු කරන ලදී. මෙහිදී ගොවීන් කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙන් කෘෂි උපදෙස් ලබා ගැනීමට වැඩි නැඹුරුවක් නොදැක්වීම සහ ඒ සඳහා අවශ්‍ය උපදෙස්, විශේෂයෙන් බීජ, කෘමි නාශක ආදිය පිළිබඳ ගොවීන් කරුණු දැන ගන්නේ පෞද්ගලික වෙළෙඳක් මාර්ගයෙන් බවත් අනාවරණය විය. මෙයින් සිදු වන්නේ බොහෝ විට අනවශ්‍ය ලෙස නිෂ්පාදන පිරිවැය ඉහළ යාමයි. එමෙන්ම ගොවීන් ඔවුන්ට අවශ්‍ය බිත්තර වී ගොවීන් විසින්ම නිෂ්පාදනය කර ගැනීම මගින් අක්කරයකට ලැබෙන නිෂ්පාදනය අඩු විය හැක. අක්කරයකට නිෂ්පාදන ප්‍රමාණය වැඩි කර ගැනීමට නම් වැඩි දියුණු කළ බීජ වී වගාව සඳහා යොදාගත යුතුව ඇත.

හප්පාවර ගම්මානයේ ගොවීන් කාබනික පොහොර භාවිතය සඳහා යොමු වී ඇති ප්‍රමාණය ඉතාම අඩුය. ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී රසායනික පොහොර භාවිතය අඩු කළ හැකි අතර එමගින් නිෂ්පාදන පිරිවැය අඩු කර නිෂ්පාදනය සඳහා හොඳ මිලක් ද ලබා ගත හැකි වේ.

ගම්මානයේ බොහෝ දෙනෙකුට අක්කර 1/4 කට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් ගෙවත්ත ආශ්‍රිතව ඇත. දැනට ගම්මානයේ ගෙවතු වගාව සඳහා යොමු වූ සුළු පිරිසක් සිටියද ඒ සඳහා විශේෂ ප්‍රවනතාවයක් දක්නට නොලැබේ.

ගෙවතු වගාව සඳහා ගොවීන් හුරු කිරීම මගින් හොඳ ආදායමක් මෙන්ම හොඳ තත්ත්වයේ එළවළු සහ පලතුරු පවුලේ පරිභෝජනය සඳහාද ලබාගත හැක.

## 6.2 සත්ත්ව පාලනය

### 6.2.1 හැඳින්වීම

නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනය ඉතා හොඳින් සිදු කරගෙන යා හැකි ගම්මානයකි. ගම්මානය ආශ්‍රිතව ඉතා විශාල මුඩු ඉඩම් ප්‍රමාණයක් ඇති නිසා සත්ත්ව පාලනය කිරීමට අවශ්‍ය ඉඩකඩ සහ අනෙකුත් අවශ්‍ය යෙදවුම් පරිසරය ආශ්‍රිතව සපයා ගත හැකිය.

**වගුව 6.11 – සත්ත්ව පාලනය සම්බන්ධ තොරතුරු**

| | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සත්ත්ව පාලනය සිදු කරන පවුල් | 28 | 44.4 |
| සත්ත්ව පාලනය නොකරන පවුල් | 35 | 55.6 |
| එකතුව | 63 | 100 |

හප්පාවර ගම්මානයේ සමීක්ෂණයට ලක් කළ පවුල් අතරින් පවුල් 28 ක් පමණක් එනම් 44% ක් පමණ සත්ත්ව පාලන කටයුතුවල යෙදී සිටී. මෙයින් පෙනී යන්නේ හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනය සිදු කිරීමට අවශ්‍ය අනෙකුත් පහසුකම් එනම් ස්වභාවික සත්ත්ව ආහාර ආදිය තිබුනද ගමෙහි වැඩි පිරිසක් ඒ සඳහා අවධානය යොමු කර නොමැති බවයි.

### 6.2.2 හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනයට සම්බන්ධ විවිධ සතුන්

**වගුව 6.12 සත්ත්ව පාලනයට සම්බන්ධ විවිධ සතුන්**

| සතුන් වර්ගය | දේශීය සතුන් | ප්‍රතිශතය |
|---|---|---|
| **එළ ගවයින්** | | |
| කිරි දෙනුන් | 11 | 32 |
| වැස්සියන් (Heifers) | 05 | 15 |
| **මී ගවයන්** | | |
| මී දෙනුන් | 02 | 6 |
| වැස්සියන් (Heifers) | 13 | 38 |
| **පිරිමි සතුන්** | 3 | 9 |
| එකතුව | 34 | 100 |

සමීක්ෂණයට ලක් කල පවුල් 63 අතුරින් පවුල් 28 ක් පමණක් හප්පාවර ගම්මානයේ සතුන් ඇති කරනු ලබයි. ඉහත 6.12 වගුව අනුව පෙනී යන්නේ සතුන් ඇති කරනු ලබන ගොවීන් සියළු දෙනාම එළ ගවයින් හෝ මී

ගවයින් පාලනය කිරීම සිදු කරන බවයි. අනෙකුත් එකදු සත්ත්වයෙකු හෝ සත්ත්ව පාලනය සඳහා හප්පාවර ගම්මානයේ ඇති කරනු නොලැබේ. හප්පාවර ගම්මානය ආශ්‍රිතව විශාල ලඳු කැළෑ සහිත ප්‍රදේශ දක්නට ලැබෙන නිසා එළු පාලනය සිදු කිරීමට විශාල විභවතාවයක් ඇත. නමුත් ගම්මානයේ එකදු ගොවියෙක්වත් ඒ සඳහා යොමු වී නොමැත.

හප්පාවර ගම්මානයේ සමීක්ෂණයට ලක් කළ පවුල් අතරින් පවුල් 28 ක් සත්ත්ව පාලනයේ යෙදී සිටියත් ඔවුන් සතුව ඇති එළ ගවයන් සහ මී ගවයන් සංඛ්‍යාව සතුන් 34 ක් පමණ වේ. මෙම ප්‍රමාණය එළ ගවයන් 16 ක් සහ මී ගවයන් 18 ක් වශයෙන් වේ. එළ ගවයන් 16 දෙනා අතුරින් වැඩි පිරිස කිරි දෙනුන්ය. ඉතිරි ප්‍රමාණය වැස්සියන්ය (Heifers). එම ප්‍රමාණය 05 ක් පමණ වේ. මී ගවයන්ගෙන් මී දෙනුන් සිටින්නේ දෙදෙනෙකු පමණි. ඉතිරි ප්‍රමාණය වැස්සියන්ය. හප්පාවර ගම්මානයේ කිරි සඳහා එළ ගවයන් සහ මී ගවයන් ඇති කරන්නේ ඉතා ස්වල්ප වශයෙනි. මෙහිදී ප්‍රධාන ලෙසම මී ගවයන් ඇති කරන්නේ කෘෂි කාර්මික කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමය සපයා ගැනීමටයි. හප්පාවර ගම්මානයේ සී සෑම, ගොයම් පෑගීම ආදී කෘෂිකාර්මික කටයුතු බොහෝමයක් සිදු වන්නේ සත්ත්ව ශ්‍රමය උපයෝගී කරගෙනයි. ඉහත 6.12 වගුව අනුව හප්පාවර ගම්මානයේ ඇති කරුනු ලබන සියළුම සතුන් දේශීය සතුන්ය. එකම වැඩි දියුණු කළ සතෙකුවත් ගම්මානයේ සත්ත්ව පාලනයට දායක කරගෙන නොමැත.

මෙසේ ඇති කරනු ලබන සතුන් එම ගොවීන්ගේමද එසේත් නැතිනම් අඳ පදනම යටතේ ඇති කරනවාද යන්න පිළිබඳවද සමීක්ෂණයේදී අවධානය යොමු කරන ලදි.

**වගුව 6.13 – සතුන්ගේ අයිතිය**

| සතුන්ගේ අයිතිය | ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| තමාගේම සතුන් | 18 | 764.3 |
| අඳයට ගත් සතුන් | 05 | 17.9 |
| ගමාගේ සහ අඳයට ගත් සතුන් | 05 | 17.9 |
| එකතුව | 28 | 100 |

හප්පාවර ග්‍රාමයේ සතුන් ඇති කරන ගොවීන්ගෙන් 64% ක්ම ඇති කරන්නේ ඔවුන්ගේම සතුන්ය. අඳයට ගත් සතුන් ඇති කරන ගොවීන් පස් දෙනෙකු පමණ හප්පාවර ගම්මානයේ වාසය කරයි. මෙම ප්‍රමාණය සතුන් ඇති කරන ගොවීන්ගෙන් 18% ක් පමණය. එසේම අඳයට සහ තමන්ගේ සතුන් යන දෙකොටසට ම අයත් සතුන් ඇති කරන ගොවීන් ප්‍රමාණය 05 දෙනෙකු පමණ වේ. මෙයින් පෙනී යන්නේ හප්පාවර ගම්මානයේ සතුන් ඇති කරන ගොවීන්ගෙන් 36% කට පමණ ඔවුන්ටම අයත් සතුන් නොමැති බවයි.

හප්පාවර ගම්මානයේ සමීක්ෂණයට ලක් කළ ගොවීන්ගෙන් 44% ක් පමණක් ඉතා ප්‍රාථමික මට්ටමින් සත්ත්ව පාලනය සිදු කරයි. තොරතුරු එකතු කිරීමේදී ගොවීන් සත්ත්ව පාලනයට යොමු නොවීමට හේතු ගැනද අවධානය යොමු කරන ලදී, එය පහත 6.14 වගුව ඇසුරින් විස්තර කළ හැක.

වගුව 6.14 – ගොවීන් සත්ත්ව පාලනයේ නොයෙදීමට හේතු

| සතුන් ඇති නොකිරීමට හේතුව | ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සතුන් ඇති කිරීමට ඇති අකමැත්ත | 19 | 54.3 |
| ඇති කිරීමට සතුන් නොමැති වීම | 01 | 2.9 |
| සතුන් ඇති කිරීමට ඉඩම් නොමැති වීම | 07 | 20 |
| ජල හිගය | 01 | 2.9 |
| ශ්‍රමය හිගකම | 20 | 57.1 |
| රැකබලා ගැනීම පිළිබඳ ගැටළු | 01 | 2.9 |
| එකතුව | 35 | 100 |

හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනය සිදු නොකරන පවුල් 35 අතුරින් 54% ක්ම සතුන් ඇති නොකරන්නේ සතුන් ඇති කිරීමට ඇති අකමැත්ත නිසාය. ශ්‍රමය හිගකම නිසා සතුන් ඇති නොකරන ගොවීන් ප්‍රමාණය 57% කි. එසේම සතුන් ඇති කිරීමට අවශ්‍ය ඉඩම් නොමැති වීම නිසා සතුන් ඇති නොකරන බව එම ගොවීන්ගෙන් 20% ක් පමණ පවසා තිබේ. ඊට අමතරව ජලය හිගවීම, ඇති කිරීමට අවශ්‍ය සතුන් නොමැති වීම සහ රැකබලා ගැනිම පිළිබඳ ගැටළු නිසාද හප්පාවර ගම්මානයේ සතුන් ඇති නොකරයි.

හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනය සිදු කිරීම සඳහා 100% ක්ම පවුලේ ශ්‍රමය භාවිතා කරනු ලැබේ. මේ සඳහා දායක වන පවුලේ සාමාජිකයන් ගණන පහත 6.15 වගුව මගින් දැක්වේ.

වගුව 6.15 – සත්ත්ව පාලනයට ශ්‍රම දායකත්වය

| සත්ත්ව පාලනයට ශ්‍රම දායකත්වය සපයන සාමාජිකයන් ගණන | පවුල් ගණන |
|---|---|
| 01 | 23 |
| 02 | 04 |
| වාර්තා නොවූ | 01 |
| එකතුව | 28 |

මේ අනුව පෙනී යන්නේ සත්ත්ව පාලනයට අවශ්‍ය ශ්‍රම දායකත්වය සඳහා හප්පාවර ගම්මානයේ පවුල්වල සාමාජිකයන් එක් අයෙකු පමණක් වැඩිපුර (එනම් 82% ක් පමණ) දායක වේ. සාමාජිකයන් දෙදෙනෙකු ශ්‍රම දායකත්වය සපයන පවුල 04 ක් හප්පාවර ගම්මානයේ දක්නට ලැබේ.

සත්ත්ව පාලනය සිදු කරන පවුල්වලට ඒ තුළින් ලැබෙන වාර්ෂික ආදායම ඉතා අඩු බව පහත 6.16 සංඛ්‍යා සටහන මගින් පැහැදිලි වේ.

වගුව 6.16 සත්ත්ව පාලනයෙන් ලැබෙන ආදායම

| සත්ත්ව පාලනයෙන් ලැබෙන ආදායම් කාණ්ඩය | පවුල් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| ආදායමක් නොමැති | 14 | 50 |
| රු. 1000 ට අඩු | 11 | 39.3 |
| 1000-1500 අතර | 03 | 10.7 |
| එකතුව | 28 | 100 |

සත්ත්ව පාලනය සිදු කරන පවුල්වලින් 50% ක් හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනය සිදු කිරීම තුළින් කිසිදු ආදායමක් උපයා නොගනී. එමෙන්ම සත්ත්ව පාලනය තුළින් රු.1000 ට අඩු වාර්ෂික ආදායම් ලබන ප්‍රමාණය 39% ක් පමණ වේ. රු. 1000-1500 ත් අතර වාර්ෂික ආදායමක් ලබන පවුල් සංඛ්‍යාව සත්ත්ව පාලනය සිදු කරන මුළු පවුල් සංඛ්‍යාවෙන් 10.7% කි. මෙයින් පෙනී යන්නේ ගොවීන් සත්ත්ව පාලනයේ යෙදීම මඟින් හොඳ ආදායමක් ලබා නොගන්නා බවයි. ඒ සඳහා යොදන ශ්‍රමය සඳහාවත් ගොවීන් හට ආදායමක් ලැබෙන්නේ නැත. මෙයින් පැහැදිලි වන්නේ ගොවීන් ඒ සඳහා කිසිම අවධානයක් යොමු කර නොමැති බව හා එමඟින් ආදායමක් ලබාගැනීමට ගොවීන් උනන්දුවක් නොදක්වන බවයි.

### 6.2.3 තාක්ෂණික භාවිතය

හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනය ඉතා ප්‍රාථමික මට්ටමේ පවතී. ඇති කරනු ලබන සතුන් සියළු දෙනාම දේශීය විශේෂ වේ. උසස් වර්ගයේ වැඩි දියුණු කළ එකදු සතෙකුවත් හප්පාවර ගම්මානයේ ගොවීන් සතුව නැත. සත්ත්ව පාලනයේ නියැලෙන්නන් ප්‍රධාන ලෙසම කෘෂිකර්මාන්තයට අවශ්‍ය ශ්‍රමය සැපයීම සඳහා මී ගව පාලනය සිදු කරන අතර මෙම සතුන් පාලනය සිදු කිරීම සඳහා කිසිදු තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමක් සිදු නොකෙරේ. ගොවීන් විසින් එළ ගවයන් ඇති කළද එම සතුන් වානිජ මට්ටමින් ඇති කිරීම සඳහා ගොවීන් යොමු වී නොමැත. එළගව පාලනය සඳහාද තාක්ෂණික දැනුම උපයෝගී කර නොගන්නා බව සමීක්ෂණයේදී පැහැදිලි විය. සමහර සතුන් දහවල් කාලයේදී දිගේලි කරන අතර ආහාර කපා ගෙනවිත් දීමද සිදු කරයි. ගොවීන් සත්ත්ව පාලනය සඳහා විශේෂ අවධානයක් යොමු නොකරන බව සමීක්ෂණයේදී පැහැදිලි විය.

### 6.2.4 නිෂ්පාදනය

සමීක්ෂණයට අනුව හප්පාවර ග්‍රාම නිලධාරී වසම තුළ සත්ත්ව පාලනය මඟින් අලෙවිය මඟින් කිසිදු නිෂ්පාදනයක් සිදු නොකරයි. එළ ගවයන් ඇති කළද ඔවුන්ගෙන් ලබා ගන්නේ ඉතා සුළු කිරි ප්‍රමාණයකි. එම කිරි ප්‍රමාණය නිවැසියන් පරිභෝජනය කරන බව සමීක්ෂණයේදී හෙළි විය. සත්ත්ව පාලනය සිදු කිරීමෙන් ලබාගන්නා ඉතා කුඩා ආදායම ඔවුන්ට ලැබෙන්නේ කෘෂිකාර්මික කටයුතු සඳහා සතුන් කුලියට දීම මඟිනි. ගම්මානයේ විශේෂයෙන්ම සී සෑම, ගොයම් මැඩවීම යනාදී කාර්යයන් සඳහා ගම්මානයේ සියළුම ගොවීන් සත්ත්ව ශ්‍රමය උපයෝගී කරගනී. නමුත් වෙනත් නිෂ්පාදනයක් සත්ත්ව පාලනය තුලින් වෙළඳ පොළට නිකුත් කිරීමට ගොවීන් උනන්දු වී නොමැත.

6.2.5 ප්‍රශ්න සහ විසඳුම්

6.17 – හප්පාවර ගම්මානයේ සත්ත්ව පාලනයේ යෙදී සිටින්නවුන්ගේ ගැටළු

| ගැටළුව | පවුල් සංඛ්‍යාව |
|---|---|
| ඉඩම් හිගය | 24 |
| තෘණ භූමි හිග වීම | 24 |
| සාන්ද්‍ර ආහාර නොමැතිකම | 01 |
| ශ්‍රමය හිගකම | 05 |

සත්ත්ව පාලනයේ යෙදී සිටින ගොවීන් ගණන 28 ක් වුවද ඔවුන්ගෙන් 24 දෙනෙක්ම ඉඩම් සහ තෘණ භූමි හිගකම නිසා සත්ත්ව පාලනය සාර්ථකව කරගෙන යා නොහැකි බව පැවසීය. සාන්ද්‍ර ආහාර පිළිබඳ පවතින ගැටළු සහ ශ්‍රමය හිග වීම නිසාද සත්ත්ව පාලනය සාර්ථකව කරගෙන යා නොහැකි බව හප්පාවර ගම්මානයේ සතුන් ඇති කරන ගොවීන් පවසන ලදී.

නමුත් ගම්මානයේ මූලික සමීක්ෂණ වලින් අපට පැහැදිලි වුයේ හප්පාවර ගම්මානයේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමය සඳහා සතුන් ඇති කරනවාත් සමගම කිරි නිෂ්පාදනය සඳහා ද සතුන් ඇති කළ හැකි බවයි. දැනට ගම්මානයේ සිටින දේශීය සතුන් හොඳ පාලනයක් යටතේ ඇති කළහොත් ගම්මානයේ ගොවීන්ට හොඳ අමතර ආදායමක් ලබා ගැනීමේ හැකියාව ඇත. එමෙන්ම සතුන්ගේ අපද්‍රව්‍ය මගින් එළවළු වගාවට අවශ්‍ය කාබනික පොහොර සපයා ගැනීමද සිදු කළ හැක.

ගම්මානයේ පවතින ස්වාභාවික සම්පත් සහ කෘෂි කර්මාන්තයෙන් බැහැර කරන බෝග කොටස් (Crop residues) සහ අනෙකුත් සම්පත් උපයෝගී කරගෙන හප්පාවර ගම්මානයේ ගව පාලනය සාර්ථකව සිදුකල හැකිය. එමෙන්ම ගම්මානය ආශ්‍රිතව විශාල මුඩු ඉඩම් ප්‍රමාණයක් පැවතීම නිසා එළු පාලනයද පහසුවෙන් කරගෙන යා හැකි වන අතර, එමගින් ගොවීන්ට ඉහළ ආදායමක් ඉතා කෙටි කලකින් උපයාගත හැක. මේ සඳහා ගම නැගුම වැඩසටහන යටතේ අවශ්‍ය පුහුණු උපදෙස් මෙන්ම මූල්‍යමය සහයෝගය දැක්වීම මගින් උනන්දුවක් දක්වන ගොවීන්ගේ ආදායම ඉහළ නැංවිය හැක.

6.3 අනෙකුත් නිෂ්පාදන

හප්පාවර ගම්මානයේ කෘෂිකර්මාන්තයට අමතරව වෙනත් විශේෂ නිෂ්පාදනයක් සිදු නොවන බව මූලික සමාජ ආර්ථික සමීක්ෂණයේදී හෙළි විය.

හත්වන පරිච්ඡේදය

# ප්‍රජා සංවිධාන හා ජනතා සහභාගීත්වය

මෙම පරිච්ඡේදයේදී හප්පාවර ගම්මානයේ පිහිටුවාගෙන ඇති ප්‍රජා සංවිධාන හා ඒවා තුළ ජනතාව කොතෙක් දුරට සක්‍රියව දායක වී ඇද්ද, එ මගින් ජනතාවට අත්වන සහන පිළිබඳව මූලික අවධානය යොමු කරයි.

## 7.1 ගමෙහි ඇති ප්‍රජා සංවිධාන

හප්පාවර ගම්මානය පිළිබඳව පොදුවේ ගත් තොරතුරු අනුව ගමේ විවිධ සමිති සමාගම් රාශියක් දක්නට ලැබේ. එම සමිති සමාගම් සහ ඒවායේ සාමාජිකයින් සංඛ්‍යාව පහත 7.1 වගුව ආශ්‍රිතව සාකච්ඡා කෙරේ.

**වගුව 7.1 – සමිති සමාගම් හා සාමාජිකයින් ගණන**

| සංවිධානය | සාමාජිකයන් සංඛ්‍යාව |
|---|---|
| මරණාධාර සමිතිය 1 | 44 |
| මරණාධාර සමිතිය 2 | 102 |
| සමෘද්ධි සමිතිය | 92 |
| ගොවි සංවිධානය | 70 |
| වැලි සංගමය | 70 |
| ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන සංවිධානය (UNDP) | 124 |

ගම්මානයේ වැඩිම සාමාජික පිරිසක් සිටින සමිතිය වන්නේ ග්‍රාමීය ඒකාබද්ධ සංවර්ධන සංවිධාන සමිතියයි. (UNDP) නමුත් මෙම සමිතිය මේ වනවිට සක්‍රීයත්වයෙන් කටයුතු නොකරන බව ගැමියන් පැවසීය. මීට අමතරව ගම්මානයේ මරණාධාර සමිති දෙකක් ද ගොවි සංවිධානය, සමෘද්ධි සමිතිය සහ වැලි සංගමය යනුවෙන් සමිති සමාගම් පිහිටුවාගෙන ඇත.

මූලික සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව ගම්මානයේ සමීක්ෂණයට ලක්කළ පවුල් 63 සාමාජිකයින් විවිධ සමිතිවලට සහභාගි වී ඒවායේ සාමාජිකත්වය ගෙන කටයුතු කරන ආකාරය වගුව 7.2 දැක්වේ.

**වගුව 7.2 – ගම්වාසීන් විවිධ සමිති සමාගම්වල සාමාජිකත්වය ලබා ඇති ආකාරය**

| සාමාජිකත්වය ලබා ඇති සමිති ගණන | සාමාජිකත්වය ලබා ඇති පවුල් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| 0 | 03 | 4.8 |
| 01 | 07 | 11.1 |
| 02 | 11 | 17.5 |
| 03 | 21 | 33.3 |
| 04 | 18 | 28.6 |
| 05 | 03 | 4.8 |
| එකතුව | 63 | 100 |

සමීක්ෂණයට අනුව ගම්මානයේ පවුල්වලින් 95% කට වඩා පවුල් සංඛ්‍යාවක් එක් සමිතියක හෝ සාමාජිකත්වය දරා ඇත. ඉතිරි පවුල්වලින් 5% ක් කිසිදු සමිතියකට බැඳී කටයුතු නොකරයි. ගම්මානයේ පවුල්වලින් 33% ක් පමණ සමිති සමාගම් 03කට බැඳී ඔවුන්ගේ සමාජ කටයුතු සිදු කරයි.

## 7.2 සංවිධානවල ක්‍රියාකාරීත්වය

ගම්මානයේ විවිධ සමිති සමාගම් තිබුනද ඒවායින් වඩාත්ම ක්‍රියාකාරී සමිතිය කුමක්ද යන්න සමීක්ෂණයේදී විමසිල්ලට භාජනය විය. ඒ අනුව ගම්මානයේ සමිතිවලට සහභාගී වී ඇති පවුල් 60 අතුරින් ඔවුන් වඩා ක්‍රියාකාරී සමිතිය ලෙස පහත 7.3 වගුව් පරිදි තොරතුරු රැස් කර ගන්නා ලදී.

**වගුව 7.3 වඩාත්ම ක්‍රියාකාරී සමිතිය**

| සමිතිය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| මරණාධාර සමිතිය (I,II) | 21 | 35 |
| සමෘද්ධි සමිතිය | 17 | 28.3 |
| වැලි සංගමය | 22 | 36.7 |
| එකතුව | 60 | 100 |

ඒ අනුව ගම්මානයේ බොහෝ දෙනෙක් ඉතාම ක්‍රියාශීලී සමිතිය ලෙස වැලි සමිතිය සඳහන් කර ඇත. එය මුළු පවුල් සංඛ්‍යාවෙන් 37% පමණ වේ. මෙයට හේතුව විශේෂයෙන්ම වැලි සමිතියේ සාමාජිකත්වය දරා ඇති පවුල්වලට වැලි ගොඩ දැමීම මඟින් විශාල අමතර ආදායමක් උපයාගත හැකිවීමයි. මීට අමතරව මරණාධාර සමිතිද සමෘද්ධි සමිතියද හප්පාවර ගම්මානයේ ක්‍රියාකාරී සමිති වී ඇත. මරණාධාර සමිතියෙන් විශේෂයෙන්ම සාමාජිකයකුගේ අවමඟුල් අවස්ථාවකදී අවශ්‍ය සියළුම උදව් උපකාර කරනු ලැබේ. සමෘද්ධි සමිතිය වඩාත් ක්‍රියාකාරී සමිතිය ලෙස දක්වා ඇති පිරිස 27% ක් වේ. එයට හේතුව නම් සමෘද්ධි සමිතිවලට සහභාගී වීම තුලින් අඩු ආදායම් ලාභී පවුල්වලට විවිධ ප්‍රතිලාභ හිමි වී තිබීමය. ඔවුන් කණ්ඩායම්ගත වීම, ඉතිරි කිරීමට පෙළඹීම හා සමෘද්ධි බැංකුවෙන් ණය ලබා ගැනීමට හැකි වීම විශේෂ වරප්‍රසාදයන්ය. එමෙන්ම මෙම සමිතිය මඟින් අවශ්‍ය වූ විටෙක ගැමියන්ට අවශ්‍ය උපදෙස් සහ සහයෝගය ද ලබා ගත හැකිවී ඇත.

## 7.3 සමිති සමාගම් මඟින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු

සමෘද්ධි සමිතිය මඟින් හප්පාවර ගම්මානයේ පානීය ජල යෝජනා ක්‍රම දෙකක්ද, ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ද සිදු කර ඇත. මීට අමතරව ස්වයං රැකියා සඳහා ණය ලබාදීමද සිදු කරයි. දැනට ගම නැගුම වැඩසටහන යටතේ ඉදිකෙරෙමින් පවතින අලෙවිසැල ඉදිකිරීමද සිදු කරන්නේ සමෘද්ධි අධිකාරියේ ආධාර මත හප්පාවර සමෘද්ධි සමිතිය මඟිනි. වැලි සංගමය මඟින් සාමාජිකයන්ගේ අසාධ්‍ය අසනීප තත්ත්වවලට අවශ්‍ය මූල්‍යමය සහයෝගය ලබාදෙන බව ගම්මුන් පවසනු ලැබේ. ඊට අමතරව ප්‍රජා ශාලාවේ දැල් ගැසීමද වැලි සංගමය

විසින් සිදු කල බව ගම්මුන් පවසන ලද ග්‍රාමීය ඒකාබද්ධ සහයෝගීත්ව සංවිධානය මගින් ගම්මානයේ පානීය ජල යෝජනා ක්‍රමයක් සකස් කරදී ඇත. දැනට එම ජල යෝජනා ක්‍රමය අක්‍රිය තත්ත්වයේ පවතී.

### 7.4 අරමුදල් ගොඩනැගීම හා ණයදීම

මරණාධාර සමිතිය සතුව මේ වන විට රු. ලක්ෂ තුනක පමණ අරමුදලක් ඇත. එම මුදල් දැනට බැංකු ගතකොට ඇත. ඔවුන් මෙම අරමුදල යොදාගෙන විශේෂ ණය වැඩසටහන් ක්‍රියාත්මක නොකරයි. සාමාජිකයන්ගේ පවුල්වල මරණයක් සිදු වු විට එම සමිති මුලධනය වශයෙන් උදව් කරන අතර සමිතියේ අනෙක් සාමාජිකයන් සියළු කටයුතුවලට අවශ්‍ය සහයෝගය ලබාදේ. හප්පාවර ගම්මානයේ වැලි සමිතිය සතුව මේ වන විට රුපියල් 2 65,000 ක පමණ අරමුදලක් එකතු වී ඇත.

ගම්මානයේ සමෘද්ධි සමිතිය ගමට විශාල සේවාවන් ප්‍රමාණයක් සිදු කරයි. මෙහිදී අඩු ආදායම්ලාභී පිරිස් කණ්ඩායම් ගත කර ඉතිරි කිරීම් සඳහා යොමු කර ඇත. සමෘද්ධි බැංකුව යටතේ වගා ණය, ස්වයං රැකියා ණය සහ අනෙකුත් ණය පුද්ගල අවශ්‍යතාව මත නිකුත් කරයි. මෙම ණය සඳහා 24% ක වාර්ෂික පොලියක් අය කෙරේ.

### 7.5 වෙනත් සේවාවන් සැපයීම

හප්පාවර ගම්මානයේ ඇති සමිති සමාගම් සතුව විශේෂ බඩු බාහිරාදිය හෝ වෙනත් කෘෂි උපකරණ නැත. ඒවා ජනතාවට කුළියට දීමත් හප්පාවර ගම්මානයේ සිදු නොවේ.

### 7.6 ගමෙහි සංවර්ධන කටයුතු සඳහා ප්‍රජා සංවිධාන මගින් ජනතා සහභාගිත්ව ලබා ගැනීම

ගමෙහි පවතින මරණාධාර සමිතියේ කාරක සභාව මසකට වරක් රැස්වේ. වාර්ෂිකව පවත්වන මහා සභා රැස්වීමේදී අවශ්‍ය අළුත් නිලධාරීන් සහ අයවැය ලේඛන නිවැරදි ලෙස ඉදිරිපත් කරන බව ගම්මුන්ගේ මතයයි. ගම්මානයේ ඇති වැලි සමිතිය වාර්ෂිකව රැස්වේ. වැලි ගොඩ දැමීමට අවසරපත් ලැබී එම කාර්යය සිදු කරන කාලවලදී ඔවුන් මාස දෙකකට වරක් හමු වී අවශ්‍ය වැදගත් දේ සාකච්ඡා කරයි. මෙහිදී ද වාර්ෂිකව පවත්වන රැස්වීමේදී ගිණුම් වාර්තා ඉදිරිපත් කරයි. ගම්මානයේ සමෘද්ධි සමිතිය මාසිකව රැස් වේ. මෙහිදී ඉතිරි කිරීම්වල ප්‍රගතිය ණය ගනුදෙනු සම්බන්ධව හා ගම්මානයේ අනෙකුත් සංවර්ධන වැඩ කටයුතු ගැන සාකච්ඡා කෙරේ. මීට අමතරව ගම්මානයේ බොහෝ විට ශ්‍රමදාන මගින් සිදු කළ හැකි වැඩ සමෘද්ධි සමිතියේ දායකත්වයෙන් සිදු කෙරේ. එමෙන්ම සමහර සමෘද්ධි ව්‍යාපෘතිවලදී අනිවාර්යයෙන් ශ්‍රම දායකත්වය ලබාදිය යුතු අවස්ථා ඇත. එම අවස්ථාවලදී සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ශ්‍රමය ලබාගනී.

## 7.7 වෙනත් ආකාරයකින් ගමෙහි සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය ලබාගැනීම

හප්පාවර ගම්මානය අයත් වන්නේ හගුරන්කෙත ප්‍රදේශීය සභාවටයි. මෙතෙක් ගම්මානය සඳහා විශේෂ වැඩසටහන් ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක නොවුවද ගම නැගුම වැඩසටහන යටතේ පානීය ජල යෝජනා ක්‍රම දෙකකට මුදල් ලබාදීමට කැමැත්ත පළ කොට ඇත. මීට අමතරව ගම්මානයේ පහළ බදුලු පාර සංවර්ධනයට මුදල් වැය කිරීමට සූදානම් වී ඇත.

## අටවෙනි පරිච්ඡේදය

# හඳුනාගෙන ඇති විශේෂ ගැටළු සහ පිළියම්

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරල්ලියැද්ද ගොවි ජන සේවා බල ප්‍රදේශය තුළ හප්පාවර ග්‍රාමය පිහිටා ඇත. මෙම ගම්මානය උතුරු දිශාවෙන් ඇඳිරිබැද්ද ග්‍රාම නිලධාරී වසමින්ද, බස්නාහිරින් පල්ලේවෙල ග්‍රාම නිලධාරී වසමින්ද, දකුණු දිශාවෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, නැගෙනහිර දිශාවෙන් මහනුවර රන්දෙනිගල හරහා දිවෙන බදුල්ල ප්‍රධාන මාර්ගයෙන් හා රන්දෙනිගල ජලාශයෙන් මායිම් වී ඇත. මෙම ග්‍රාම නිලධාරී වසම අක්කර 985 ක පමණ භූමි ප්‍රදේශයක පැතිරී ඇති අතර, මෙහි මුළු ඉඩම් ප්‍රමාණයෙන් දැනට වගාකර ඇති මඩ ඉඩම් ප්‍රමාණය අක්කර 123 ක් වන අතර ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 147 ක් පමණ වේ. ඉතිරි ඉඩම් ප්‍රමාණය වගා නොකර පවතින ලඳු කැළෑ සහිත භූමි ප්‍රදේශයකි. ගමේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී ගොවිතැන වන අතර මෙම හප්පාවර ග්‍රාමයට අයත් හප්පාවර වෙල්යාය හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විශාලතම වෙල්යායකි. වී ගොවිතැන යල සහ මහ කන්නය යන කන්න දෙකෙහිම සිදු කරයි. මාස් කන්නයේදී වී ගොවිතැනට අමතරව හේන් වගාව සිදු කරයි. මෙහිදී විශේෂයෙන්ම පතෝල, බණ්ඩක්කා, වැටකොළු, වට්ටක්කා වැනි ක්ෂේත්‍ර භෝග වගා කරනු ලැබේ.

හප්පාවර ග්‍රාමයට සාමාන්‍යයෙන් වාර්ෂිකව ලැබෙන වර්ෂාපතනය මි.ලි. 1400 කට වඩා වැඩිවන අතර සාමන්‍ය පාරිසරික උෂ්ණත්වය 22.5-25$C^0$ අතර වේ. මෙම ග්‍රාමයේ පස රතු කහ පැඩසොලික් වැලි පසක් වන අතර කඳු බෑවුම් සහිත භූමි ප්‍රදේශයකි. ප්‍රදේශයේ සාමාන්‍ය වශයෙන් වියළි කාලගුණයක් දක්නට ලැබේ.

ගමෙහි මුළු ජනගහනය 482 ක් වන අතර එය ස්ත්‍රී 252 ක් හා පුරුෂ 230 කින් සමන්විත වේ. ගම තුළ පවුල් 124 වාසය කරන අතර ගමෙහි වෙසෙන සියළුම පවුල්වල සියළුම සාමාජිකයන් සිංහල බෞද්ධයන් වේ. මෙම ගම හරහා මහනුවර බදුල්ල ප්‍රධාන මාර්ගය පිහිටා තිබීම ගමට අමතර වාසි ගෙනදීමට හේතු වී ඇත. මෙම ගම සාම්ප්‍රදායිකව පැවත එන ගමකි.

"ගම නැගුම" පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් කරන ලද සමීක්ෂණයේදී ද හප්පාවර ග්‍රාමය සම්බන්ධව හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිලධාරීන් හඳුනා ගන්නා ලද ගැටළු ගැනද අවධානය යොමු කරන ලදී, විවිධ ආයතන මගින් මෙම ගැටළු හඳුනාගත්තද මේ දක්වා ඒවා විසඳීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කර නොමැත. "ගම නැගුම" වැඩසටහන සඳහා දායකත්වය සපයන රේඛීය අමාත්‍යාංශ වලින් ලැබෙන සහයෝගය මීට වඩා කඩිනම් විය යුතුය. එම අමාත්‍යාංශ වලින් සිදු කෙරෙන සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණය යටතේ සිදුවනවා නම්, වැඩසටහන සාර්ථක කර ගැනීමට එය මහත් පිටුවහලක් බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීහු අප සමග පැවසූහ.

ගම නැගුම වැඩසටහන යටතේ ගැටළු හඳුනා ගත්තද මේ දක්වා එම ගැටළුවලට අවශ්‍ය පිළියම් කඩිනමින් යොදා නොමැති නිසා ගම්මුන් තුළ වැඩසටහන ගැන දැඩි විශ්වාසයක් නොමැති බව ගම්මුන් පවසයි.

8.1 ග්‍රාමයේ හඳුනාගෙන ඇති ගැටළු හා ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

8.1.1 විදුලි බලය නොමැති වීම

හප්පාවර ග්‍රාමයට අයත් එකදු නිවසකටවත් මේ වන විට විදුලි බල පහසුකම් ලබා දී නොමැත. මේ නිසා එහි ජනතාව විශාල වශයෙන් පීඩා විඳියි. එහි ජනතාව යෝජනා කරන ආකාරයට විදුලි බලය ලබා දීම මගින් පවුල් 124 කට එම ප්‍රතිලාභ සැළසේ.

පහත යෝජනා කර ඇති පරිදි ගම තුළ විදුලි රැහැන් ඇදීම මගින් විදුලි බලය ලබාදිය යුතු බව ගම්මු ප්‍රකාශ කරති. මෙමගින් සියළුම ගැමියන්ට විදුලි බලය පහසුකම් ලබාගැනීමට හැකි වේ.

1. හප්පාවර වැව සිට ලැමසූරිය හන්දිය දක්වා පවුල් 78 යි
2. ලැමසූරිය හන්දිය සිට ගලස්යාය දක්වා පවුල් 12 යි
3. කොබ්බෑකැටිය පවුල් 10 යි
4. මැදලන්දයාය සිට ගලස්යාය දක්වා පවුල් 15 යි
5. මැදලන්දයාය සිට කඳුහේන දක්වා පවුල් 08 යි

දැනට හප්පාවර ග්‍රාමයේ ඉහළ කොටසට විදුලි රැහැන් ඇද ඇත. නමුත් විදුලි බලය ලබාදී නොමැත. ගම නැගුම වැඩසටහන යටතේ මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මැදිහත්වීම මත විදුලි බල මණ්ඩලයේ රිකිල්ලගස්කඩ සේවා මධ්‍යස්ථානයෙන් ගමට අවශ්‍ය විදුලි බලය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර ඉතා ඉක්මනින් විදුලිබලය ලබාදෙන බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීහු පැවසූහ.

8.1.2 වාරිමාර්ග සංවර්ධනය

- පහළ වෙළ අමුණ ප්‍රතිසංස්කරණය
- ලැමසූරිය මධ්‍යම ඇළ ජල කළමනාකරණය වැඩි දියුණු කිරීම

මෙහිදී පහළ වෙල අමුණ සහ ඇල ප්‍රතිසංස්කරණය කිරීම මගින් හප්පාවර වෙල් යායේ කුඹුරු අක්කර 18කට සෙත සැළසෙන බව ගොවීහු සඳහන් කරති. එමෙන්ම ලැමසූරිය මධ්‍යම ඇල ජල කළමනාකරණය වැඩි දියුණු කිරීම මගින් දැනට ලැබෙන ජල ප්‍රමාණය වඩාත් කාර්යක්ෂමව භාවිතා කිරීමට හැකියාව ලැබේ. එමගින් කුඹුරු අක්කර 123 ක වගා කටයුතු ක්‍රමවත්ව හා කාර්යක්ෂමව සිදුකර ඵලදායීතාවය වැඩි කර ගත හැකි බව ගොවීන්ගේ අදහසයි.

මෙම ඇල මාර්ග හා වැව් අමුණු ප්‍රතිසංස්කරණ කටයුතු දැනට හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගම නැගුම වැඩසටහන යටතේ සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. එය 2006 වර්ෂයේ හඟුරන්කෙත ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාසයේ සංවර්ධන වැඩසටහනට ද ඇතුලත් කර ඇත. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇති බව ලේකම් කාර්යාලයේ තොරතුරු වලින් දක්වා ඇත.

### 8.1.3 මාර්ග අළුත්වැඩියාව

ගමට පැමිණීමට ඇති ප්‍රධාන මාර්ගය වන මහනුවර බදුල්ල මහා මාර්ගය ඉතා හොඳ තත්ත්වයේ ඇත. එම නිසා ගමට පිවිසීමට අපහසු නැත. නමුත් ගම තුළ ගමනාගමනය සිදු කිරීම ඉතා දුෂ්කරය. එම නිසා ගම තුළ ඇති මාර්ග අළුත්වැඩියා කළයුතු බව ප්‍රදේශ වාසීන්ගේ මතයයි.

1. දුම්බඩ වැලිපාර (කෘෂි මාර්ගය)
2. වැව ලඟ සිට සංචාරක බංගලාව දක්වා අඩි පාර
3. පහළ බදුලු පාර අළුත් වැඩියා කළ යුතුව ඇත.

මෙම මාර්ග සකස් කිරීම තුළින් ගමෙහි සියළුම දෙනාට ප්‍රතිලාභ අත්වේ. ඒ යටතේ මේ සඳහා හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවෙන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන මාර්ග ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත.

### 8.1.4 කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටළුව

දැනට හප්පාවර ග්‍රාමයේ ජනතාවගේ එළවළු හා වෙනත් බෝග ලොරි වලින් පැමිණෙන අලෙවි නියෝජිතයන්ට විකුණනු ලබයි. ඊට අමතරව මහනුවර බදුල්ල ප්‍රධාන මාර්ගය අවට තාවකාලිකව ඉදිකර ඇති වෙළඳ කුටිවල එළවළු අලෙවි කරයි. එම නිසා ඒ සඳහා අලෙවි මධ්‍යස්ථානයක අවශ්‍යතාව ඇති බව ජනතාව ප්‍රකාශ කරයි.

මෙම කෘෂි නිෂ්පාදන අලෙවි ගැටළුවට විසඳුමක් ලෙස හප්පාවර ග්‍රාමයේ බදුල්ල - මහනුවර මහා මාර්ගය අසළ වෙළඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීමට ගම නැගුම වැඩසටහන යටතේ කටයුතු යොදා ඇත. මෙම අලෙවි මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ මැදිහත්වීම මත දැනට හප්පාවර ග්‍රාමයේ ආරම්භ කර ඇත. ඉදකිරීමේ කටයුතුවලදී ගමෙහි සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ශ්‍රම දායකත්වය ලබාගෙන ඒ සඳහා ගෙවීම් සිදු කරයි. මේ වන විට එම ගොඩනැගිල්ල අර්ධ වශයෙන් ඉදිකර ඇත.

### 8.1.5 වල් අලි තර්ජනය

හප්පාවර ග්‍රාමය රන්දෙනිගල ජලාශය හා ඒ ආශ්‍රිත රක්ෂිතයට මායිම්ව පිහිටා තිබීම නිසා වල් අලි තර්ජනය විශාල ගැටළුවක් බව ප්‍රදේශවාසීහු පවසති. මෙම වල් අලි තර්ජනය නිසා ජීවිත හානි පමණක් නොව විශාල වශයෙන් වගා කටයුතු වලටද හානි සිදු වේ. එම නිසා මේ සඳහා පිළියමක් ලෙස විදුලි වැටක අවශ්‍යතාවය ඉතා වැදගත් බව ගැමියෝ සඳහන් කරති. මේ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කිරීමට හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මැදිහත් වී ක්‍රියා කරයි.

### 8.1.6 වැලි ගොඩ දැමීම සඳහා අවසර පත්‍ර ලබා ගැනීම

ගමේ ජනතාව මහවැලි ගඟ ආශ්‍රිතව වැලි ගොඩ දැමීම ජීවන වෘත්තියක් වශයෙන් දැනට පවත්වාගෙන යයි. එමෙන් ම ඔවුන් වැලි සංගමයක් ද පිහිටුවාගෙන ඇත. මෙම වැලි ගොඩ දැමීම මගින් ඉතා විශාල අමතර ආදායමක් ලබාගත හැකි බව ගැමියන් බොහෝ දෙනෙක් ප්‍රකාශ කරයි. වැලි ගොඩ දැමීම සඳහා අවශ්‍ය අවසර පත් නොමැති බව ප්‍රධාන ගැටළුවක් බව ගම්වැසියන් සඳහන් කරයි. අවසරපත් නොමැතිව වැලි ගොඩදැමීම තහනම් බැවින් ප්‍රදේශවාසීන්ට මෙම අමතර ආදායම ලබා ගත නොහැකි බව ඔවුන් පවසයි. මෙම ගැටළුව ගම නැගුම වැඩසටහන යටතේ පරිසරයට හානි නොවන සේ විධිමත්ව සිදු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් අවශ්‍ය පිළියම් යෙදීමට ඉදිරිපත් වී ඇත. ඒ අනුව අවසර පත් නිකුත් කිරීම සඳහා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මැදිහත්වීම මත පරිසර අධිකාරිය මගින් එම අවසරපත් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීහු පවසති.

### 8.1.7 ධීවර ආම්පන්න ලබා ගැනීම

හප්පාවර ග්‍රාමය රන්දෙනිගල ජලාශය ආසන්නයේ පිහිටා තිබීම නිසා ඒ ආශ්‍රිතව මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදීමට ප්‍රදේශයේ ජනතාවට හැකි වී ඇත. දැනට එම ජලාශය ආශ්‍රිතව ගම්මානයේ එක් ඔරුවක් පමණක් ඇත. ධීවර කර්මාන්තයේ යෙදීමට කැමති පිරිසක් ගම්මානයේ ජීවත් වේ. ධීවර කර්මාන්තය සිදු කිරීමට අවශ්‍ය ධීවර ආම්පන්න හා අනෙකුත් අවශ්‍ය පුහුණුවීම් ලබා දීම මගින් ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් මාර්ග වැඩි කළ හැකි වන අතර, එමගින් අලුතින් රැකියා අවස්ථා ද බිහි වේ.

ගම නැගුම වැඩසටහන යටතේ ධීවර අමාත්‍යාංශයේ මැදිහත්වීම මගින් ධීවර ආම්පන්න ලබාදීමට අවශ්‍ය පුද්ගලයින් මේ වන විට හඳුනාගෙන ඇති අතර, අදාල ආම්පන්න කඩිනමින් ලබා දීමට පොරොන්දු වූ බව ගම්මුන් පවසයි.

### 8.1.8 පානීය ජලය ලබා ගැනීම

පානීය ජලය ලබා ගැනීම සඳහා ජල යෝජනා ක්‍රමයක් අවශ්‍ය බව ප්‍රදේශවාසීන් පවසයි. මේ යටතේ පවුල් 70 කට සහන සැළසෙන බවද ඔවුහු වැඩිදුරටත් සඳහන් කළහ. දැනට සමෘද්ධි අධිකාරිය මගින් පානීය ජල යෝජනා ක්‍රමයක් සකස්කර ඇති අතර ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. අනෙක් ජල යෝජනා සඳහා ගම නැගුම වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් වී ඇත. ගම නැගුම වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් ද සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

## 8.2 පරිසර සංරක්ෂණ වැඩසටහන්

මේ යටතේ පහත දැක්වෙන කඳුරු සහ ඇල සංරක්ෂණය කෙරේ.

1. කැටන් කඳුර සංරක්ෂණය
2. පුවක් කැටිය කඳුර සංරක්ෂණය
3. ලැමයුරිය ඇල සංරක්ෂණය
4. හප්පාවර වැව සංරක්ෂණය


## 8.2 ආදායම් උත්පාදන වැඩසටහන්

ගම්මානයේ බොහෝ පවුල්වලට අක්කර 1/4 කට වඩා වැඩි ගෙවත්තක් ඇති බව ග්‍රාම නිලධාරීවරයා පවසයි. එම නිසා ගම නැගුම වැඩසටහන යටතේ දැනට පවතින ගෙවතු සංවර්ධනය කිරීමට අවශ්‍ය වැඩසටහන් සකසා ඇත.


## 8.3 පශු සම්පත් වැඩි දියුණු කිරීම

හප්පාවර ග්‍රාමයේ ගොවීන් විශාල පිරිසක් ගව පාලනය සිදු කරයි. ගමේ ප්‍රධාන වශයෙන් ඇති කරන්නේ මී හරකුන්ය. ඔවුන්ගෙන් කිරි ලබා ගන්නවාට වඩා වැඩිපුර සිදුවන්නේ කෘෂිකාර්මික වැඩ සඳහා යොදා ගැනීමයි. ගම තුළ වගා කටයුතුවලට යොදා නොගන්නා විශාල ඉඩම් ප්‍රමාණයක් ඇති නිසා දේශගුණයට උචිත සතුන් හඳුන්වා දීම හා දැනට සිටින සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට අවශ්‍ය වැඩසටහන් "ගම නැගුම" වැඩසටහන යටතේ සකසා ඇත.

# Nuwara Eliya District
# By DS Divisions




Map produced by Department of Census and Statistics




LIBRARY
HARTI
21362

